# ඊමාන්හි අර්ථ විවරණය

කතෘ

ෂෙයික් මුහම්මද් බින් සාලිහ් අල් උසෙයිමීන්

පරිවර්තනය

ජසීම් ඔමලාත්

# شرح أصول الإيمان

لفضيلة الشيخ

محمد بن صالح العثيمين

المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بغرب الديرة

ص.ب: ١٥٤٤٨٨ الرياض: ١١٧٣٦ هاتف: ٤٣٩١٩٤٢ـ٠١ فاكس: ٤٣٩١٨٥١ـ٠١

# ඊමාන්හි
# අර්ථ විවරණය

කතෘ :

*ෂෙයික් මුහම්මද් බින් සාලිහ් අල් උතෛයිමීන්*

පරිවර්තනය :

*ජාසිම්කිච්ලාන්*

---

# شرح أصول الإيمان

**تأليف :**

فضيلة الشيخ محمد بن صالح العثيمين

- رحمه الله تعالى -

**ترجمة :**

جاسم كشيلان

باللغة السنهالية

ح مكتب توعية الجاليات غرب الديرة، ١٤٢٣هـ

**فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر**

**العثيمين، محمد بن صالح**

شرح أصول الإيمان / ترجمة جاسم كشيلان . - الرياض .

٩٦ ص ١٢ × ١٧ سم

ردمك : ٧-٠-٩٣٩٧-٩٩٦٠

( النص باللغة السنهالية )

١ - الإيمان ( الإسلام )

أ -كشيلان ، جاسم ( مترجم ) ب - العنوان

ديوي ٢٠ ٤١٨١ / ٢٣

رقم الإيداع : ٤١٨١ / ٢٣

ردمك : ٧-٠-٩٣٩٧-٩٩٦٠

*Title of the book:*

***Explianing Fundamentals of Islamic faith***

***Author :***

***Sheikh Muhammed Bin Salih Al Uthaimeen***

***Sinhala Translation :***

***T. Jassim Kitchilan***

***E.mail Address : Kitchilan***
**2000@yahoo.com**

*All rights reserved*

# محتويات الكتاب

# පටුන


| විෂය | පිටුව |
|---|---|
| 1-පෙරවදන | 5 |
| 2-පරිවර්තකගෙන් .... | 7 |
| 3-ඉස්ලාම් ධර්මය | 9 |
| 4-ඉස්ලාම්හි මූලික කරුණු | 13 |
| 5-ඉස්ලාමීය ප්‍රතිපත්තියෙහි පදනම | 18 |
| 6-අල්ලාහ් කෙරෙහි විශ්වාස කිරීම | 19 |
| 7-මලක්වරුන් විශ්වාස කිරීම | 39 |
| 8-දේව ග්‍රන්ථයන් විශ්වාස කිරීම | 45 |
| 9-රසූල්වරුන් විශ්වාස කිරීම | 47 |
| 10-අවසාන දිනය විශ්වාස කිරීම | 55 |
| 11-දෛවය ගැන විශ්වාස කිරීම | 77 |
| 12-ඉස්ලාමීය ප්‍රතිපත්තියෙහි අරමුණු | 91 |

# පෙරවදන

*අති කාරුණික හා දයාබර අල්ලාහ්ගේ නාමයෙන්...*

සියළු ප්‍රශංසා අල්ලාහ්ටම හිමිවේවා. අපි ඔහුට ප්‍රශංසා කොට ඔහුගේ සහාය හා සමාව පතමු. අපි ඔහුගෙන් සර ණද අපෙන් සිදුවන අයහපත් සහ අකාරුණික ක්‍රියාවන් ගෙන් ආරක්ෂාවද පතමු. අල්ලාහ් යහමග පෙන්වන්නේ කවරෙකුටද ඔහු නොමඟ යවන්නට කිසිවෙකුට නොහැක. අල්ලාහ් නොමඟ යන්නට ඉඩ දෙන්නේ කවරෙකුටද ඔහුට යහමඟ පෙන්වන්නටද කිසිවෙකුට නොහැක. නැමදුම් කිරී මට සුදුසු දෙවියා අල්ලාහ් හැර අන් කිසිවෙකු නැති බවද, ඔහුට සහකරුවෙකු හෝ සමානකරුවෙකු හෝ නොමැති බවද සාක්ෂි දරමි. තවද මුහම්මද් (සල්) තුමා අල්ලාහ්ගේ සැබෑ සේවකයෙක් සහ රසූල් වරයෙක් බව සාක්ෂි දරමි. අල්ලාහ්ගේ සාමය හා ආශිර්වාදය මුහම්මද් (සල්) තුමාටද, එතුමාගේ පවුලේ අයටද එතුමාගේ උදාර සහාබාවරුන්ටද එතුමා අනුගමනය කරන සැම දෙනාටද හිමිවේවා.

තව්හීද් හෙවත් ඒක දේවත්වය පිළිබඳ දැනුම අනෙක් දැනුම් වලට වඩා ගෞරවනීය උතුම් දැනුමකි. එම දැනුම ලබා ගැනීම සැම දෙනාටම අනිවාර්යවේ. කුමක්නිසාදයත්, එය අල්ලාහ්, ඔහුගේ නාමයන්, ගුණාංගයන් හා ඔහුගේ දාසයන් ඔහුට කළයුතු වගකීමයන් පිළිබඳ දැනුමකි. එප මණක් නොව, මෙය අල්ලාහ් වෙත ලඟාවීමේ මාර්ගයේ යතු රක්වන අතර, ඔහුගේ ෂරීආ නම් නීති පද්ධතියෙහි පදන මක්දවේ. එනිසා, අල්ලාහ්ගේ සැම රසූල් හෙවත් දූතයන්ම

මෙම ඒක දේවත්වය කරා මිනිසුන් කැඳවන්නට වූහ. අල් ලාහ් අල්කුර්ආනයේ මෙසේ පවසන්නේය.

*(නබිතුමනි) 'නියතවශයෙන්ම, (නැමදුම් කිරීමට අයත්) දෙවියා මා හැර අන් කිසිවෙකු නොමැත, එබැවින්, මාහට (පමණක්) 'නැමදුම ඉටුකරන්න' යන වහී නියෝගය පහළ නොකර කිසියම් රසූල් (දූත) වරයෙකුද අපි ඔබහට පෙර එව්වේ නැත. (අල්කුර්ආන්-21:25)*

තවද, වහ්දානියියා නම් ඒකීයභාවය ගැන අල්ලාහ් තමා ටම ස්වයං සාක්ෂි දරයි. අල්ලාහ්ගේ මලක් (සුරදූත)වරුන්ද, දැනුම් ඥානවන්තයින්ද එසේම සාක්ෂි දරති. අල්ලාහ් මේ පිළිබඳව මෙසේ පවසන්නේය.

*අල්ලාහ් නීතිය (යුක්තිය) පිහිටුවන තැනැත්තා ලෙසට සිටියදී (කීකරුවී) 'නැමදුම් කිරීමට සුදුස්සා ඔහු හැර කිසි වෙකු හෝ නොමැති බව ඔහුම සාක්ෂි දරයි. එසේම, මලක් වරුන්ද ඥානවන්තයින්ද මෙසේම සාක්ෂි දරති. ඔහු හැර නැමදුම් කිරීමට සුදුස්සා කිසිවෙකුද නොමැත. ඔහු සියුම් බුද්ධිමතා හා ඥානවන්තයාය. (අල්කුර්ආන්-3:18)*

මෙවැනි උතුම් ස්ථානයක් දරණ මෙම ඒක දේවත්වය ඉතා සැළකිලිමත්ව ඉගෙන ගැනීම, ඉගැන්වීම, පර්යේෂන කිරීම හා විශ්වාස කිරීම සැම මුස්ලිම්වරුන්ටම අනිවාර්ය වේ. එකළ ඔහුට තමාගේ ධර්මය ස්ථිර පදනම මත ගොඩ නැගීමටද, සැනසීමෙන් හා ප්‍රිය මනාපයෙන් එය අනුගම නය කිරීමටද හා එහි යහපත් ඵලදාව හා ප්‍රතිඵලය ලබා ගැනීමටද හැකිවනු ඇත.

***- ෂෙයික් මුහම්මද් බින් සාලිහ් අල් උසෛමීන්***

# පරිවර්තකගෙන් වචනයක්

ආගමින් ඉටුවිය යුතු අවශ්‍යතාවයන් දෙකක් ඇත. ඒවා මෙසේය.

1-මැවුම්කරු වන දෙවියා කවුද? ඔහු හා මැවීම් අතර පව තින සම්බන්ධකම කුමක්ද? යන්න ආගමක් පැහැදිලිව පෙන්විය යුතුය. මෙවන් දැනුම එක්තරා පිරිසකට හෝ කුලයකට පමණක් සීමා නොවී ලොවෙහි සැම කෙනෙකු ටම ලැබිය යුතුය.

2-මෙම දැනුම සහිතව ලොවෙහි යහපත් ලෙස ජීවත්වන් නේ කෙසේ දැයි පැහැදිලි කිරීමේ වගකීමද ආගමෙන් ඉටු විය යුතුය.

මෙම අවශ්‍යතාවයන් දෙකම ඉටුවන විට සැම කෙනෙ කුම ආගම පෙන්වන සීමාවෙහි තුල ජීවත්වීමෙන් සමාජයේ සාමය හා සංවරය පවතින අතර, සමහර සමාජයන්හි ආග මේ නාමයෙන් සිදුවන ගසාකෑම් හා මුලාකිරීම් අවසන් වන් නටද ඉඩ ඇත.

මුස්ලිම් දෙමාපියන්හට උපන් ලැබූ එකම හේතුව මත අපිද මුස්ලිම් වරුන් බවට පත්ව සිටිමු. අල්හම්දු ලිල්ලාහ්. එසේ මුස්ලිම්වරුන් ලෙස උපත ලැබූ අපි ඉස්ලාමයේ සැබෑ තේරුම ඉගෙන ගැනීමටද වෑයම් කළ යුතු නොවේද ?

මෙහි මුල් පියවරක් වශයෙන් ඉස්ලාම්හි දේව විශ්වාසය යනු කුමක්දැයි අපි පැහැදිලිව අවබෝදධ කර ගත යුතුය. ඊමාන (විශ්වාස)ය තරකර ගත් කෙනෙකුට දෙවන පියවර

වන ඉස්ලාමය පෙන්වන යහපත් ජීවිතයේ යෙදීමට ඉන්ෂා අල්ලාහ් පහසුවේ.

ඉස්ලාමය ගැන සැබෑ අවබෝධයක් නොමැති කෙනෙක් ඉස්ලාමය පෙන්වන යහපත් ජීවිතයෙහි නිරත වෙන්නේ කෙසේද ? ඉස්ලාමය වැළඳගෙන ලොවේ නවක මුස්ලිම්වරු ලක්ෂ සංඛ්‍යාවක් ජීවත් වන අතර, උපතින් මුස්ලිම්වීමේ භාග්‍යලද ජනතාවද ඉස්ලාම් පිළිබඳ සැබෑ දැනුම් ඥානය නොමැති හේතුවෙන් ඔවුන් ඉතාමත් අසරණ තත්ත්වයට පත්ව ඇති බව කණගාටුවෙන් වුවද කිව යුතුය. මෙයින් ඉස්ලාම් ධර්මය තහනම් කළ ක්‍රියාවල පවා ඔවුන් නොදැනුවත්ව ආගමේ නාමයෙන් යෙදීමට ඉඩ ඇත.

ඊමානයේ මූලික කරුණු පහදා දෙන ***ෂෙයික් මුහම්මද් බින් සාලිහ් අල්උසෛමීන්*** මහතාගේ ***ෂරහ් උසූලුල් ඊමාන්*** නම්වූ මෙම පොත සිංහල භාෂාවෙන් අධ්‍යයනය ලබන මුස්ලිම් වරුන් ගේ පහසුව සඳහා සිංහලට පරිවර්තනය කෙළෙමි. සිංහල භාෂාව කතාකරන ලාංකික මුස්ලිම්වරුන් සුළු පිරිසක් හෝ මෙම පොතෙන් යම් ප්‍රයෝජනයක් ලබන්නේ නම්, සියළුම ප්‍රශංසාව හා තුතිය අල්ලාහ්ටම හිමිවේ.

***- ජාසිම් කිච්ලාන්***

*2001 මාර්තු මස 31 දින*

# ඉස්ලාම් ධර්මය

නබිනායක මුහම්මද් (සල්) තුමා මාර්ගයෙන් අල්ලාහ් පහළ කළ ආගම ඉස්ලාමය. අල්ලාහ් මෙමගින් අනෙකුත් ආගම්වලට අවසානයක් කළ අතර, තම දාසයන්ට එය සම් පූර්ණ කළේය. එමගින් ඔහු තමාගේ දායාදයන් ඔවුන්ට පරිපූර්ණ කළේය. ඔවුන්ට එය ආගමක් (ජීවන මගක්) වශ යෙන් අල්ලාහ් පිළි ගත්තේය. එනිසා, අල්ලාහ් එම ආගම හැර වෙනත් කිසියම් ආගමක් හෝ කවරෙකුගෙන්ද පිළි නොගන්නේය. මේ ගැන අල්ලාහ් මෙසේ පවසන්නේය.

*මිනිසුනී, මුහම්මද් ඔබලාගේ පිරිමින් කවරෙකුගේ හෝ පියෙකු නොවන්නේය. එනමුත්, ඔහු අල්ලාහ්ගේ දූතයා ලෙසද, අවසාන වක්තාවරයා ලෙසද සිටී. අල්ලාහ් සියළුම දේ ගැන සදා දන්නේය. (අල්කුර්ආනය-33:40)*

*අද ඔබලාගේ ආගම ඔබලා වෙනුවෙන් පරිපූර්ණ කළෙමි. මාගේ දායාදයන්ද ඔබලාහට සම්පූර්ණ කළෙමි. එසේම, ඔබලා වෙනුවෙන් ඉස්ලාම් ඔබලාගේ ආගම (ජීවන මග)ක් ලෙසද පිළිගන්නෙමි. (අල්කුර්ආනය-5:3)*

*සත්‍ය වශයෙන්ම, අල්ලාහ්ගේ ඉදිරියෙහි (පිළිගත්) මාර් ගය ඉස්ලාමයවේ. (අල්කුර්ආනය-3:19)*

*කවරෙකු හෝ ඉස්ලාම් නොවන මාර්ගයක් අනුගමනය කිරීමට අදහස් කාළේද, එය ඔහුගෙන් කිසිසේත් පිළිගනු නොලැබේ. තවද, ඔහු පරලොව දිනයෙහි අලාභ කරුවන් ගෙන් කෙනෙකු ලෙස සිටී. (අල්කුර්ආන්-3:85)*

මෙම ආගම අනුගමනය කර, අල්ලාහ්ට කීකරු වන ලෙස අල්ලාහ් සැම මුස්ලිම් වරුන්ටම අනිවාර්යකර ඇත. නබිනායක මුහම්මද් (සල්) තුමා අමතා අල්ලාහ් මෙලෙස පවසන්නේය.

*(නබිතුමනි,) ඔබ පවසන්න. අහෝ මනුෂ්‍යයෙනි, නියත වශයෙන්ම, අහසෙහි හා පොළොවෙහි අධිපතියාවූ අල්ලාහ් ගේ දූතයා ලෙස ඔබ සැම වෙත මා එවන ලදී. ඔහු හැර අන්කිසි දෙවියෙකු හෝ නොමැත. ජීවිතය හා මරණය ලබා දෙන්නේ ඔහුමය. එබැවින්, අල්ලාහ් කෙරෙහිද, ඔහු විසින් එවනලද උම්මි (කියවීමට හෝ ලිවීමට නොදන්නා) වක්තෘ වරයා කෙරෙහිද විශ්වාසය කරන්න. ඔහු අල්ලාහ් කෙරෙ හිද, ඔහුගේ වචනයන් කෙරෙහිද විශ්වාසය කළාය. තවද, ඔබලාහට යහමගක් ලැබීම පිණිස ඔහුව පිළිපදින්න (අල් කුර්ආන්-7:158)*

නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූ හුරෙරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

*මුහම්මද්ගේ ප්‍රාණය කවරෙකු අත පවතින්නේද, එවන් තැනැත්තා (අල්ලාහ්) මත දිවුරා කියමි. මෙම සමාජයෙහි පුද්ගලයෙකු ඔහු යුදෙව් හෝ ක්‍රිස්තියානි හෝ වේවා මාව පිළිබඳව ආරංචිවී මා මගින් එවන ලද නිවේදනය විශ්වාස නොකර මරණයට පත්වන්නේ නම්, ඔහු අපාය වැසියෙකු ලෙසට පත්වේ. (මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

නබිනායක මුහම්මද් (සල්) තුමා ගැන විශ්වාසය කිරීම යනු, එතුමා ගෙන ආ පණිවුඩය සත්‍ය බව සම්පූර්ණයෙන් පිළිගෙන එයට කීකරුවීම තුලින් සාක්ෂි දැරීමකි. මෙනිසා

නබිනායක මුහම්මදු (සල්) තුමාගේ ඥාතියෙක්වූ අබූතාලිබ් එතුමා ගෙන ආ ආගම සත්‍යකර, හොඳම එය උතුම්වූ ආගමක් ලෙසට සාක්ෂි දැරූ නමුත්, නබිනායක තුමා කෙරෙහි ඔහු විශ්වාස කළ අයෙකු ලෙසට පත් නොවීය.

සෑම පැරණි ආගම්වල සඳහන් වන මානව ශුභ සිද්ධීන් සියල්ල ඉස්ලාම් ආගමෙහි අන්තර්ගතව පවතී. එය සියළුම කලකට, දේශයට හා සමාජයන්ට ගැලපෙන ආගමක් ලෙස පවතීමෙන් පැරණි ආගම්වලට වඩා විශේෂත්වයෙන් පවතී.

අල්ලාහ් නබිනායක මුහම්මදු (සල්) තුමා අමතා මෙසේ පවත්නේය.

තවද, (නබිතුමනී) සත්‍යය උසුලා සිටින මෙම දේව ග්‍රන්ථය ඔබ වෙත පහළ කෙළෙමු. මෙය (අල්කුර්ආනය) දේව ග්‍රන්ථයන් අතර පෙර පහළවූ ග්‍රන්ථයන් සත්‍ය කරමින්ද, ඒවා ආරක්ෂා කරමින්ද පවතී. (අල්කුර්ආනය-5:48)

ඉස්ලාම් සෑම කලකට, දේශයට හා සමාජයන්ට ගැලපෙන ආගමක් යනුවෙන් හඳුන්වන්නේ, ඉස්ලාම් රැකවලදී අනුගමනය කිරීමෙන් ඕනෑම ස්ථානයක හා ඕනෑම කාලයක වසන සමාජයන්ගේ සුභ සිද්ධිවලට පටහැනිවීමෙන් තොරව මවුන්ගේ සුභ සිද්ධීන්වලට ඔබින ලෙස පවතීමකි. එසේ නොමැතිව, සමහර මිනිසුන්ගේ මත පරිදි මෙය සෑම කලකට, සෑම තැනකට හා සෑම සමාජයන්ට අවශ්‍ය පරිදි පවතින ආගමක් නොවන්නේය.

ඉස්ලාම් ධර්මය සත්‍යයම ආගමකි. එය සත්‍ය භාවයෙන් රැකවල දී අනුගමනය කරන්නාට උපකාර කිරීමටත්, ඔහුව අන් අයටවඩා ශ්‍රේෂ්ඨමත් කිරීමටත් අල්ලාහ් වගකීම් දරන්නෙකු ලෙස සිටී. අල්ලාහ් මේ ගැන මෙලෙස පවසන්නේය.

*මුෂ්රික්වරුන් (ආදේශ කරුවන්) එය දැඩි ලෙස අප්‍රිය කළ නමුත්, එය (ඉස්ලාමය) අන් සියළුම ආගම්වලට වඩා ශ්‍රේෂ්ඨමත් බව පැතිර පවතිනු වස් යහමගෙන් හා සත්‍ය ආගමෙන් ඔහුගේ රසූල් (දූත) වරයාව (මුහම්මද් තුමාව) එව්වේ හෙතම ඔහු (අල්ලාහ්)මය. (අල්කුර්ආනය-61:9)*

*ඔබලාගෙන් කවරෙකු අල්ලාහ් කෙරෙහි විශ්වාස කර, කුසල් ක්‍රියාවන්හි යෙදෙන්නේද, ඔවුන්ට අල්ලාහ් 'ඔවුන්ට පෙරවූ අය පොළොවෙහි පාලකයින් කළාක් මෙන් ඔවුන්ද පාලකයින් ලෙස පත්කරන බවද, ඔහු කුමන ආගම ඔවුන් කෙරෙහි ප්‍රිය කළේද, එම ආගම නිරසාර පදනම මත පිහිටුවන බවද, ඔවුන්ගේ (අදට පවතින) නොසන්සුන් තාවය දුරු කොට) සැනසුමට පත් කරන බවද පොරොන්දු වීය. එහෙයින්, ඔවුහු මාහටම නැමදුම් කරනු. මා සමග කව රෙකු හෝ ආදේශ නොකරනු. මින් ඉදිරියට (ඔබලාගෙන්) කවරෙකු හෝ ප්‍රතික්ෂේප කරන්නේනම්, (අල්ලාහ්ගේ අණට කීකරු නොවූ) දුදනන් හෙතම ඔවුන්මයවේ. (අල් කුර්ආන්-24:55)*

ඉස්ලාම් ආගම, ප්‍රතිපත්ති හා නීති පද්ධතියෙන් සමන් විතකි. එය මෙම දෙකහීම අංග සම්පූර්ණයෙන් පවතී.

1-අල්ලාහ් ඒකත්වය කිරීම අණකර, ඔහුට ආදේශ කිරීම තහනම් කරයි.

2-සත්‍යතාවය අණකර, අසත්‍යතාවය තහනම් කරයි.

3-ධර්මිෂ්ඨකම අණකර, දුෂ්ටකම තහනම් කරයි.

4-විශ්වාසවන්ත භාවය අණකර, ද්‍රෝහිකම තහනම් කරයි.

5-පොරොන්දු ඉටුකිරීම අණකර, වංචාව තහනම් කරයි.

6-දෙමාපයන්හට උපකාර කිරීම අණකර, මවුන්ට නින්දා කිරීම තහනම් කරයි.
7-තම ඥාතීන් සමග යහපත් ශීලයෙන් හැසිරීම අණකර, ඥාතිත්වය බිඳ දැමීම තහනම් කරයි.
8-අසල් වැසියන් සමග සුහදව හැසිරීම අණකර, මවුන් හා සමග අශීලාචාරයෙන් හැසිරීම තහනම් කරයි.

පොදුවෙන් ඉස්ලාම් ධර්මය සියළුම සත් ගුණ ධර්මයන් අනුගමානය කරන මෙන් අණ කරන අතර, පිළිකුල් සහගත හැසිරීම් සියල්ල තහනම් කරයි. එසේම, කුසල් ක්‍රියාවන්හි යෙදෙන මෙන් අණකරන අතර, අකුසල් ක්‍රියාවන්හි යෙදීම තහනම් කරයි. අල්ලාහ් අල්කුර්ආනයෙහි මෙලෙස පවසන්නේය.

නියත වශයෙන්ම, අල්ලාහ් යුක්ති සහගතව හැසිරෙන ලෙසද, උපකාර කරන ලෙසද, ඥාතින්ට උදව් උපකාරයන් කරන ලෙසද (ඔබලාට) අණ කරයි. එසේම, නින්දිත, පිළිකුල් හා අයුක්ති සහගත ක්‍රියාවන් (ඔබලාහට) වළක්වයි. ඔබලා (මේවා) සිහිගැන්වීම පිණිස ඔබලාට උපදෙස් කරයි. (අල්කුර්ආනය-16:90)

# ඉස්ලාමීහි මූලික කරුණු

ඉස්ලාම් ධර්මය ගොඩනගා ඇති මූලික කරුණු පහකි. මේ පිළිබඳව නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ වදනක් ඉබ්නු උමර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

ඉස්ලාම් ධර්මය කුළුනු පහක් මත ගොඩ නගා ඇත. ඒවා මෙසේය.

1-අල්ලාහ්ව ඒකත්වය කිරීම. (වෙනත් වාර්තාවක 'නැමදුම් කිරීමට සුදුසු දෙවියා අල්ලාහ් හැර අන් කිසිවෙකු හෝ නැති බවත්, මුහම්මදු (සල්) තුමා අල්ලාහ්ගේ දාසයා හා දූතයා බවත් සාක්ෂි දැරීම' යනුවෙන් සඳහන්වෙ)

2-දෛනික සලාතයන් ඉටු කිරීම.

3-සකාත් හෙවත් දුගී බද්ද ගෙවීම.

4-රමලාන් මාසයේ උපවාස ශීලයෙහි යෙදීම.

5-හජ් කර්තව්‍යය ඉටු කිරීම.

මෙකී පිළිවල හජ් කර්තව්‍යය පසුව රමලාන් උපවාසද යනුවෙන් කෙනෙකු ප්‍රශ්න කලවිට 'එසේ නොවෙයි. එකී පිළිවෙල රමලාන් උපවාසය පසු හජ් කර්තව්‍යය' යනුවෙන් තමා නබිනායක තුමාගෙන් සවන් දුන් බවට ඉබ්නු උමර් (රලි) තුමා පැවැසීය. (බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)

## 1-ෂහාදා සාක්ෂි දැරීම

එනම්, වන්දනාමාන බල මහිමයට සුදුසු දෙවියා අල්ලාහ් හැර වෙනත් කිසිවෙකු හෝ නොමැති බවත්, නබි නායක මුහම්මදු (සල්) තුමා අල්ලාහ්ගේ දාසයා හා දූතයා බවත් සාක්ෂි දැරීම. එනම්, මෙම සාක්ෂිය මුවින් ප්‍රකාශ කිරීම මගින් ප්‍රසිද්ධ කළ යුතු ස්ථිරසාර විශ්වාස භාවයකි. මහුට මේ පිළිබඳව ඇති ස්ථිර භාවයේ හේතුවෙන් මහු එය සම් මුඛව දිටින්නෙකු සේ සිටී.

ෂහාදාවෙහි සාක්ෂි දැරිය යුතු කරුණු දෙකක් පවතින අතර, ඒවා එකම කරුණක් බවට එක් රැස්කර ඇත. එයට හේතුව මෙසේය.

අ-සැබැවින්ම, අල්ලාහ්ගෙන් නිවෙදනය ගෙන පැමිණියේ නබිනායක මුහම්මද් (සල්) තුමාය. එහෙයින්, එතුමා අල්ලාහ්ගේ සේවකයා හා දූතයා බව සාක්ෂි දැරීම ලාඉලාහ ඉල්ලල්ලාහ් යන වචනයෙහි පරිපූර්ණව අන්තර්ගතව පවතින්නේය.

ආ-මෙම සාක්ෂි දෙකම මිනිසාගේ ක්‍රියාවන් වලංගුවීමටත් ඒවා පිළිගනු ලැබීමටත් පදනමක් ලෙසට පවතී. මක් නිසාදයත්, ක්‍රියාවන් වලංගුවීමට හා පිළිගනු ලැබීමට ඒවා අල්ලාහ් වෙනුවෙන් යන පවිත්‍ර චේතනාවෙන්ද, නබිනායක මුහම්මදු (සල්) තුමා ආදර්ශයට ගෙන එතුමා අනුගමනය කිරීමෙන්ද පැවැත්විය යුතුයි. පවිත්‍ර චේතනාව 'වන්දනාමාන බල මහිමයට සුදුසුම දෙවියා අල්ලාහ් පමණක් බවට සාක්ෂි දැරීම' ස්ථිර කරන අතර, නබිතුමා ආදර්ශයට ගෙන අනුගමනය කිරීම 'නබිනායක මුහම්මදු (සල්) තුමා අල්ලාහ්ගේ සේවකයා හා දාසයා බව සාක්ෂි දැරීම' ස්ථිර කරයි.

මැවීම්වලට වහල්වීමෙන් හා අල්ලාහ්ගේ දූතවරුන් හැර වෙනත් අය ආදර්ශයට ගනිමින් අනුගමනය කිරීමෙන් සිත් සතන හා ආත්මය නිදහස් වීම මෙම වැදගත් ෂහාදා දෙක ප්‍රකාශ කිරීමෙහි ප්‍රතිඵලයකි.

## 2-දෛනික සලාතය ඉටු කිරීම

සලාතය යනු, එකී නියමිත වේලාවට හා නියමිත ආකාරයට අඛණ්ඩව පරිපූරණයෙන් ඉටු කිරීම මගින් අල්ලාහ්ට කීකරුවීමකි. සලාතය ඉටු කිරීම මගින් කෙනෙකුගේ සිත් සතනට සැනසුම් ලැබීම, නෙත් පිනවීම් හා පාප සහ පිළිකුල් ක්‍රියාවන් වැළකීම යනාදි යහඵල සිදුවන්නේය.

## 3-සකාතය ගෙවීම

එනම්, සකාතය ගෙවීමට අදාල ද්‍රව්‍යවලින් අනිවාර්යකර ඇති ප්‍රමාණයක් ගෙවීම මගින් අල්ලාහ්ට කීකරුවීම. සකාතය ගෙවීම මගින් (ලෝභකම වැනි) අධම ගුණාංගයෙන් හදවත පවිත්‍ර කිරීම හා ඉස්ලාමෙහිද, මුස්ලිම් වරුන්ගේද අවශ්‍යතාවයන් සපුරාලීම යනාදී යහඵල සිදුවේ.

## 4-උපවාස ශීලයේ යෙදීම

රමලාන් මාසයේ දහවල් කාලයෙහි උපවාසය නිශ්ඵල කරන කරුණුවලින් වැළකී සිටීම මගින් අල්ලාහ්ට කීකරු වීම. මෙසේ කීකරුවීම මගින් අල්ලාහ්ගේ තෘප්තිය ලබා ගැනීමේ චේතනාවෙන් තමා ප්‍රියවන සෑම දේයින් වැළකී සිටීමට හදවත පුහුණු කිරීම වැනි යහඵල සිදුවේ.

## 5-හජ කර්තව්‍යය ඉටු කිරීම

හජ් කර්තව්‍යය ඉටුකිරීමේ චේතනාවෙන් කඃබා (මස්ජිදුල් හරාම් දේවස්ථානය) කරා යාම මගින් අල්ලාහ්ට කීකරු වීම. මෙම කර්තව්‍යය ඉටු කිරීම මගින් ධනය හා ශරීරය අල්ලාහ්ගේ මාවතේ වියදම් කිරීම කෙරෙහි හදවත පුහුණු කිරීම වැනි යහඵල ලැබෙන්නේය. මෙකී හේතුවෙන් හජ් කර්තව්‍යය අල්ලාහ්ගේ මාවතේ කරන එක්තරා ජිහාදයක් ලෙස සැළකේ.

ඉහත සඳහන් කර ඇත්තේ ඉස්ලාම්හි මූලික කරුණුවලට අයත් සමහර ඵල ප්‍රයෝජන පමණකි. ඒවා හැර මෙහි සඳහන් නොකළ ඵල ප්‍රයෝජනයන් කීපයක්ද ඇත්තේය.

මේවා මෙම සමාජය අල්ලාහ්ට සත්‍යභාවයෙන් කීකරුවන, මිනිසුන් අතර යුක්ති සහගතව හා සත්‍ය භාවයෙන් හැසි රෙන පවිත්‍ර පිරිසිදු ඉස්ලාමීය සමාජයක් බවට පරිවර්තනය කරන්නේය.

ඉස්ලාම්හි අනෙකුත් අනිවාර්ය කරුණු හා ෂරීආ නීති රීතීන් සියල්ල ශීලාචාරයෙන් පැවැතීමටනම්, මෙම මූලික කරුණු නිවැරදි ශීලාචාරයෙන් පැවැත්විය යුතුයි. එසේම, මෙම සමාජය ශීලාචාරයෙන් පැවැත්වීමටනම්, එකී ආගමික ක්‍රියාකරකම් ශීලාචාරයෙන් පවතිය යුතුයි. ආගමික ක්‍රියා කාරකම් කෙලෙස පරිහානියට ලක්වන්නේද, එකී තරමට සමාජයෙහි පැවැත්මද පරිහානියට ලක් වේ. මේ පිළිබඳව පැහැදිලි වීමක් අපේක්ෂා කරන්නන්ට පහත සඳහන් අල් කුර්ආන් වැකිය ප්‍රමාණවත්වේ.

*එම ගම්වල විසූ අය (අල්ලාහ් කෙරෙහි) විශ්වාස කොට බිය බැති සිතින් සිටියේනම්, අහසෙහි හා පොළොවෙහි ආශිර්වාද(යේ දොරටු)වන් අපි ඔවුන් වෙනුවෙන් විවෘතකර ඇත්තෙමු. නමුත්, ඔවුහු (අල්ලාහ්ගේ රසූල්වරයන් ප්‍රතික් ෂේප කළහ. එහෙයින්, ඔවුන් ඉපැයූ පාප ක්‍රියාවන් හේතු කොට ඔවුන්ට අපි (දඬුවම්දී) හසු කළෙමු. මෙම ගම්වාසීන් රාත්‍රියෙහි නිදන කල්හි අපගේ දඬුවම් ඔවුන් කරා (බලා පොරොත්තුව රහිතව) පහළවීම කෙරෙහි ඔවුන් බියෙන් තොරව සිටින්නෙහිද ? එසේ නොවන්නේ නම්, ඔවුන් දහ වල් කාලයේ කෙළියෙහි යෙදී සිටින කල්හි අපගේ දඬුවම් ඔවුන් කරා පහළ නොවේ යැයි සැනසීමෙන් සිටින්නෙහිද? අල්ලාහ්ගේ කුමන්ත්‍රණය කෙරෙහි ඔවුන් බියෙන් තොරව*

*සිටින්නෙහිද ? අලාභකරුවන් හැර (අන් කවරෙකු හෝ) අල්ලාහ්ගේ කුමන්ත්‍රණය කෙරෙහි බියෙන් තොරව නොසිටිති. (අල්කුර්ආන්-7:96-99)*

මෙයට පෙර විසූ ජාතීන්ගේ ඉතිහාසයන් ගැන ඔවුන් සොයා බැලිය යුතුයි. මන්දයත්, ඉතිහාසයේ බුද්ධිමතුන්ට වැදගත් කදිම නිදසුනක් ඇත්තේය. කවරෙකුගේ සිත්සත නෙහි අන්ධකාර තිරය නොවන්නේද, ඔහුට ඉතිහාසයෙහි පැහැදිලි සාධකයන් ලැබෙන්නේය.

# ඉස්ලාමීය ප්‍රතිපත්තියෙහි පදනම

පෙර සඳහන්කළ පරිදි, ඉස්ලාම් ධර්මය ප්‍රතිපත්තිය හා ෂරීආ නීති පද්ධතිය යන කරුණු දෙකකින් සමන්විතකි. එකී නීති පද්ධතියේ සමහර කරුණු හා ඒවාට අදාල මූලික යන් ගැන සඳහන් කර ඇත්තෙමු.

*__ඉස්ලාමීය ප්‍රතිපත්තියේ මූලිකයන් හයකි. ඒවා මෙසේය.__*

1-අල්ලාහ් ගැන විශ්වාස කිරීම.

2-ඔහුගේ මලක්වරුන් ගැන විශ්වාස කිරීම.

3-ඔහුගේ ධර්ම ග්‍රන්ථයන් ගැන විශ්වාස කිරීම.

4-ඔහුගේ දූත (රසූල්)වරුන් ගැන විශ්වාස කිරීම.

5-අවසාන දිනය ගැන විශ්වාස කිරීම.

6-ඔහුගේ පූර්ව සැලැස්ම (දෛවය) ගැන විශ්වාස කිරීම.

මෙම කරුණුයලට අදාල සාධක අල්ලාහ්ගේ කුර්ආනය හා නබිනායක මුහම්මදු (සල්) තුමාගේ සුන්නාහ් සංකල් පය වටහා දෙන්නේය. අල්ලාහ් මෙසේ පවසන්නේය.

*ඔබලාගේ මුහුණු නැගෙනහිර හෝ බස්නාහිර දෙසට හැරවීමෙන් (පමණක්) කුසල් කළ බව නොසැලකේ. නමුදු, කුසල් යනු (අල්බිර්) අල්ලාහ් ගැනද, අවසාන දිනය ගැනද, දේව දූතයන් ගැනද, දේව ග්‍රන්ථයන් ගැනැද, වක්තෘවරුන් ගැනද විශ්වාසය කිරීමවේ. (අල්කුර්ආනය-2:177)*

අල්කද්ර් පිළිබඳව අල්ලාහ් මෙලෙස පවසන්නේය.

*නියත වශයෙන්ම, අපි සෑම දේ එක් නියමිත නියමයක් අනුව නිර්මාණය කෙළෙමු. අපගේ අණ එකම අණකි. එය ඇසි පිය හෙලීමේ මොහොතකින් සිදුවේ. (අල්කුර්ආන්-54:49-50)*

අග්‍ර සුරදූතයා වන ජිබ්රීල් (අලෙ) තුමා ඊමානය ගැන විමසූ ප්‍රශ්නයකට නබිනායක මුහම්මදු (සල්) තුමා මෙසේ පිළිතුරු ලබා දුන්නේය.

ඊමාන් හෙවත් විශ්වාස කිරීම යනු, අල්ලාහ් කෙරෙහිද, ඔහුගේ මලක්වරුන් කෙරෙහිද, ඔහුගේ ග්‍රන්ථයන් කෙරෙ හිද, ඔහුගේ රසූල්වරුන් කෙරෙහිද, අවසාන දිනය කෙරෙ හිද හා අල් කද්ර් හෙවත් පූර්ව සැලැස්ම කෙරෙහිද ඔබ විශ්වාස කිරීමවේ. (මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)

# අල්ලාහ් කෙරෙහි විශ්වාස කිරීම

## අ-අල්ලාහ්ගේ පැවැත්ම කෙරෙහි විශ්වාස කිරීම

ස්වභාවය, බුද්ධිය, ආගම හා හැඟීම් යනාදිය අල්ලාහ් ගේ පැවැත්මට සාධක ලෙස පවතී.

## 1-අල්ලාහ්ගේ පැවැත්ම පිළිබඳ ස්වභාවමය සාධක :

සෑම නිර්මානයක්ම තමා මැවූ දෙවියා කෙරෙහි විශ්වාස කිරීමෙ හැඟීමෙන් මවා ඇත්තේය. මෙය සිහි ගැන්වීමකින් හෝ ඉගැන්වීමකින් තොරව මිනිසුන් අතර ස්වභාවයෙන්ම පවතී. කවරෙකුගේ සිත්සතනෙහි මෙයට පටහැනි වෙත නාවන් ඇතුළු වන්නේද, ඔහු හැර වෙනත් කිසිවෙකු මෙම ස්වභාවික හැඟීමෙන් නොවැළක්වේ. මේ ගැන නබිනායක මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

උපත් ලබන සෑම දරුවෙකුම දෙවියා කෙරෙහි විශ්වාස කිරීමේ ස්වභාවයෙන්ම උපත් ලබයි. නමුත්, ඔහුගේ දෙමා පියන් ඔහුව යුදෙව්වරයෙකු බව හෝ ක්‍රිස්තු බැති මතෙකු බව හෝ ගිනි වැඳුම් කරුවෙකු බවට පත්කර ගන්නෝය. (බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)

## 2-අල්ලාහ්ගේ පැවැත්ම කෙරෙහි බුද්ධිමය සාධක :

පෙර හා පසුව මවනලද සෑම මැවීමකටම ඔවුන් මැවූ මැවුම් කරුවෙකු සිටිය යුතුයි. මන්දයත්, කිසියම් මැවීමක් තමතමන් විසින්ම මවා ගැනීම බව හෝ (බලාපොරොත්තු රහිතව) අහම්බෙන් මවන ලද්දක් වීම බව හෝ පිළිගත නොහැක.

කිසියම් නිර්මානයක් හෝ තමා විසින්ම මවා ගැනීමට නොහැක. මක්නිසාදයත්, එය පෙර වෙනත් කිසිදු දෙයක් ලෙස හෝ නොතිබීය. එනම්, එය මවන්නෙකු ලෙස කෙසේ පත්විය හැකිද ?

මැවිල්ලයන් අහම්බෙන් මවනලද්දක් වීමටද නොහැක. කුමක්නිසාදයත්, මවනල ලද සියළුම දෙයටම මවන්නෙකු අනිවාර්යයෙන් සිටිය යුතුයි. එපමණක් නොව, මෙම නිර් මානයන් පුදුම ආකාරයෙන් පිහිටා තිබීමද, ඒවා පිළිවෙල කින් හා සංවිධානාත්මකව පවතීමද, කාරනා කාර්යයන් අතර පවතින ස්ථිරතාවයද, සියළුම නිර්මානයන් අතර පව තින සම්බන්ධතාවද හා මෙවන් සියල්ල මැවිල්ලයන් අහම් බෙන් මවන ලද්දක් වීම තරයේ ප්‍රතික්ෂේප කරන්නේය. මන්දයත්, අහම්බෙන් මතුවන දෙයක මුල් නිර්මානය නිය මිත පිළිවෙළකින් නොපවතී. එසේනම්, කල් පැවැත්මෙන් හා වර්ධනභාවයෙන් එය කෙසේ පිළිවෙළකින් පවතීද ?

මැවිල්ලයන් තමතමන් විසින්ම නිර්මාණය නොවූ හා අහම්බෙන් නිර්මාණය නොවූ බවක් නම්, ඒවා නිර්මානය කළ නිර්මාතෘ වරයෙක් අනිවාර්යයෙන් සිටිය යුතු බව පෙනේ. එනම්, ඔහු මෙම විශ්වය මවා පාලනය කරන්නා අල්ලාහ්මය වේ. මෙම බුද්ධිමය හා ස්ථිරසාර සාධකයන් කෙරෙහි අල්ලාහ් සූරා අත්තූර් පරිච්ඡේදයෙහි මෙසේ පව සන්නේය.

ඔවුහු නිර්මාතෘවරයෙකු නොමැතිව තමන් විසින්ම නිර් මානය කරනු ලැබුවේද ? නොඑසේනම්, ඔවුහූම නිර්මාතෘ වරයෝ ලෙස සිටින්නෝද ? (අල්කුර්ආන් - 52:35)

එනම්, ඔවුහූ නිර්මාතෘ වරයෙකින් තොරව නිර්මානය නොවූ බවද, ඔවුන් තම තමන් විසින්ම නිර්මානය නොවූ බවද පෙනේ. එබැවින්, මේ අනුව ඔවුන් සැම නිර්මානය කළ නිර්මාතෘවරයා අල්ලාහ් බව පැහැදිලිවේ.

දිනක් නබිනායක මුහම්මදු (සල්) තුමා අල්කුර්ආනයේ අත්තූර් පරිච්ඡේදයේ 'ඔවුහු නිර්මාතෘ වරයෙකු නොමැතිව තමන් විසින් නිර්මාණය කරනු ලැබූ වෙද ?. නැතහොත්, ඔවුහුම නිර්මාතෘවරයන් ලෙස සිටින්නෝද ?. නැතහොත්, අහස් හා පොළොව ඔවුහුද නිර්මානය කළේ ?. එනමුත්, (සත්‍යය නම්) ඔවුහු ස්ථිර ලෙස විශ්වාස නොකළහ. නැත හොත්, ඔබ දෙවියාගේ නිධානයන් ඔවුන්ගේ අතෙහිද පව තින්නේ ?. නැතහොත්, ඔවුන්ගේ බලයද ඒවා කෙරෙහි පවතින්නේ ?' (අල්කුර්ආනය-52:35-37) යන වැකිය පාරා යනා කළේය.

එයට සවන්දුන් එවකට (ඉස්ලාමය නොවෙළා) මුෂ්රික් වරයෙකු ලෙස සිටි ජුබයිර් බින් මුත්ඉම් (රලි) තුමා 'මගේ හදවත අත්තටු ගසන්නට පටන් ගත්තේය. මෙය මාගේ හදවතෙහි ර්මාන් (අල්ලාහ් ගැන විශ්වාසය) හටගත් ප්‍රථම අවස්ථාවකි' යනුවෙන් පැවැසීය. (බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)

මෙය පැහැදිලි කරන තවත් නිදසුනක් මෙසේය.

මනරම් දිය ගංගාවන් ගලා බසින උයන් වලින් පිරිවරා ඇති විවිධ මෝස්තරින් හා විලාසිතාවෙන් අලංකාර කරන ලද, යහනයෙන් හා ඇතිරිලි වලින් පිරි ශක්තිමත් මාලිගා වක් ගැන ඔබට වටහා දෙන පුද්ගලයා 'මෙම මාලිගාව හා එහි ඇති සියළුම දේ තමතමන් විසින්ම මවන ලද්දකි හෝ නිර්මාතෘවරයෙකින් තොරව ඒවා අහම්බෙන් ලැබීමකි' යනු වෙන් ඔබට පවසන්නේය. එයට සවන්දෙන ඔබ වහාම එය ප්‍රතික්ෂේප කිරීමට හා අසත්‍ය කිරීමට සැරසෙන අතර, ඔහුගේ කීම පිස්සු දොඩවන කතාවක් ලෙස හඳින්වෙ.

කරුණු මෙසේ හෙයින්, අහස්, පොළොව, ග්‍රහයන්, එකී ස්ථාවරයන් හා පුදුමයට සහ විශ්මයට අදාල එකී පිළිවෙල් යනාදීන් සහිත මහා පරිමාණයේ විශ්වය තමා විසින් මවන ලද්දක් හෝ නිර්මාතෘ වරයකින් තොරව අහම්බෙන් මතුවූ දෙයක් විය හැකිද ?.

## 2-අල්ලාහ්ගේ පැවැත්ම කෙරෙහි ෂරීආ ආගමික සාධක :

අල්ලාහ් විසින් පහළවූ ධර්ම ග්‍රන්ථයන් සියල්ල අල්ලාහ් ගේ පැවත්ම පිළිබඳව ප්‍රකාශ කරන්නේය. මෙම ග්‍රන්ථයන් මැවිල්ලයන්ගේ සුභසිද්ධීන් උදෙසා අන්තර්ගතව පවතින නීතිරීතීන් වටහා දීම, ඒවා මහුගේ මැවීම්වල සුභ සිද්ධීන් පිළිබඳ දැඩි දැනුමක් ඇති ඥානවන්තයා හා සූක්ෂ්ම වන් තයාවූ මෙම විශ්වයේ අධිපතියාගෙන් පහළවූ එකක් වීමට සාධකයකි.

මෙම ග්‍රන්ථයන් විශ්වය ගැන ප්‍රකාශ කර ඇති කරුණු සැබෑ බවට යථාර්තය සාක්ෂි දැරීම එම ග්‍රන්ථයන් දෙවියා විසින් පහළවූ බවටත්, තමා ප්‍රකාශ කළ කරුණු නිර්මා නය කිරීමට මහු ශක්ති වන්තයා බවටත් සාධකවේ.

## 4-අල්ලාහ්ගේ පැවැත්ම කෙරෙහි හැඟීම්මය සාධක :

මෙය කරුණු දෙකකින් සමන්විතවේ.

1-ප්‍රාර්ථනා කරන්නන්ගේ ප්‍රාර්ථනාවන් පිළිගැනීම හා පීඩාවට ලක්වූන් රැකවරණය ලැබීම අපි ඇසෙන හා දැසින් දකින කරුණකි. අල්ලාහ්ගේ පැවැත්ම පිළිබඳ ස්ථිර සාධ කයන් ලෙස අල්ලාහ් මෙසේ පවසන්නේය.

*නූහ් (අලෙ තුමා) කලින් අපගෙන් කළ ප්‍රාර්ථනාව ගැන ඔබ සිහිකර බලන්න. අපි ඔහුගේ ප්‍රාර්ථනාවට පිළි තුරු ලබා දුන්නෙමු. (අල්කුර්ආන්-21:76)*

*(සිහිකරන්න) ඔබලාගේ දෙවියාගෙන් ඔබලා උපකාර පැතූ කළ, එයට ඔහු පිළිතුරු ලබා දුන්නේය. (අල්කුර්ආන් -8:9)*

අනස් බින් මාලික් (රලි) තුමා නබි තුමාගේ වදනක් මෙසේ වාර්තා කරන්නේය.

එක් ජුම්ආ (සිකුරාදා) දිනක් නබිනායක මුහම්මදු (සල්) තුමා කුත්බා දේශනාව පවත්වමින් සිටින අවස්ථාවේ එක් ගැමියකු එහි පැමිණ 'අල්ලාහ්ගේ දූතයාණෙනි, (වැස්ස නොලැබීමෙන්) සම්පත් සියල්ල විනාශ විය. අපගේ පවුල් ඥාතීන් සාගතයට පත්වූහ. එහෙයින්, අප වෙනුවෙන් අල් ලාහ් වෙත ප්‍රාර්ථනා කරන්න' යනුවෙන් පැමිණිලි කළේය. ඒ අනුව නබිනායකතුමා තම දෑත් ඔසවා ප්‍රාර්ථනා කළේය. වහාම වළාකුළු කඳු සේ රැස්විය. නබිනායක තුමා දේශනා කුටියෙන් බැසීමට පෙර වැහි ජලය එතුමන්ගේ යටි රැවු ලෙන් පාවීම මා දුටුවෙමි.

දෙවැනි ජුම්ආ දිනයේ එම ගැමියා (හෝ වෙනත් පුද්ග ලයෙකු) නැගිටට 'අල්ලාහ්ගේ දූතයාණෙනි, (උග්‍ර වැස්ස නිසා) ගොඩනැගිලි බිඳ වැටී විනාශ විය. දේපල සියල්ල ජලයෙහි ගිලා බැසීය. එබැවින්, අප වෙනුවෙන් අල්ලාහ් වෙත ප්‍රාර්ථනා කරන්න' යනුවෙන් නැවත පැමිණිලි කළාය. වහාම නබිනායක තුමා තම දෑත් ඔසවා 'යාඅල්ලාහ්, මෙම වර්ෂාව අප අවට ප්‍රදේශවල වස්සවනු මැනවි. මෙය අපහට

විපාකයක් ලෙසට පත් නොකරනු මැනවි' යනුවෙන් ප්‍රාර්ථනා කළේය. පසුව නබිනායක තුමා සංඥා කළ දිසාවෙන් සිට වලාකුළු වහාම විසිරී යන්නට විය. (බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)

ප්‍රාර්ථනාවන් පිළිගනු ලැබීමට අදාල කොන්දේසි සපුරා අල්ලාහ් වෙත අවංක භාවයෙන් කරන ප්‍රාර්ථනාවන් පිළිගනු ලැබීම අද කාලය තෙක් අපි ප්‍රත්‍යක්ෂයෙන්ම දකින දෙයකි.

2-මිනිසුන් සම්මුඛව දකිනා හෝ ආරංචි වන වක්තෘ (නබි)වරුන්ට ලබාදී ඇති මු:ජිසාත් හෙවත් හාස්කම් ඔවුන් එවූ දෙවියෙක්වූ අල්ලාහ් කෙනෙක් සිටින බවට ශක්තිමත් සාධකයකි. මක්නිසාදයත්, සැබැවින්ම, ඒවා මිනිස් හැකියාවෙන් කළ නොහැකි කරුණක්වන අතර, අල්ලාහ් තම දූතයන්ට උපකාරය හා උනන්දුව ලබා දීම සඳහා මෙවන් හාස්කම් පවත්වා පෙන්නුම් කරන්නේය.

පළමුවන නිදසුන නබි මූසා (අලෛ) තුමාහට අල්ලාහ් ලබා දුන් සාධකකි. තම හැරමිටියෙන් මුහුදට පහර දෙන ලෙස අල්ලාහ් කළ අණ පරිදි එතුමා එසේම කළේය. එවිට මුහුද වියලි මාර්ගයන් දොළොහකට පැළීය. ඒවා අතර ජලය කඳු මෙන් ලෙසට පත්විය. මේ ගැන අල්ලාහ් මෙසේ පවසන්නේය.

*ඔබගේ හැරමිටියෙන් මුහුදු මත පහර දෙන මෙන් අපි මූසාට වහි (දේව හෙළිදරව්ව) පහළ කළෙමු. එවිගසම එය (මුහුද) පැළීය. එකී සියළු කොටසම විශාල කඳුන් ලෙසට පත්වන්නට විය. (අල්කුර්ආන්-26:63)*

දෙවැනි නිදසුන නබි ඊසා (අලෛ) තුමාහට ලබා දුන් සාධකයකි. එතුමා අල්ලාහ්ගේ අවසරය මත මළවුන්ට පණ පොවන්නා ලෙසද, මවුන් මිනීවළෙන් සිට නැගිටට වන්නා ලෙසද සිටියේය. මේ ගැන අල්ලාහ් මෙසේ පවසන්නේය.

*(තවද, ඊසා පැවැසීය) 'මා අල්ලාහ්ගේ අවසරයෙන් මළ වුන්ට පණ පොවන්නෙමි. (අල්කුර්ආන්-3:49)*

*ඔබ මගේ අනුමැතියෙන් මළවුන් (මිනීවළෙන් සිට පණ පොවා) පිටත් කරන්නෙකු ලෙස සිටීය. (අල්කුර්ආන්-5:110)*

තෙවැනි නිදසුන නබිනායක මුහමම්දු (සල්) තුමාට අල් ලාහ් ලබාදුන් සාධකයකි. කුරෛෂ්වරුන් හාස්කමක් පෙන් වන්නා ලෙස පැවසූ කළ නබිනායක තුමා සඳ කරා සංඥා කළේය. එය දෙකට පැළීය. එය මිනිසුන් දිටිමින්ද සිටියහ. අල්ලාහ් පවසන්නේය.

*පරලොවේ (දිනය අදාල) වේලාව ළඟා වීය. හඳ දෙකට පැළීය. ඔවුහු කුමණ සාධකයක් හෝ දුටුවද, එය ප්‍රතික් ෂේප කළෝය. තවද, 'මෙය අඛණ්ඩව පවතින භූතියමකි' යනුවෙන්ද පැවැසූහ. (අල්කුර්ආන්-54:1-2)*

අල්ලාහ් තම රසූල්වරුන්ට උපකාරය හා උනන්දුව දක් වනු පිණිස පවත්වන මෙවන් හාස්කම් සියල්ල අල්ලාහ්ගේ පැවත්ම කෙරෙහි ස්ථිරසාර සාධයන් ලෙසට පවතී.

## ආ-අල්ලාහ්ගේ පාලන බලය විශ්වාස කිරීම

(එනම්, විශ්වයේ එකම පාලකයා ඔහු බවත්, ඔහුට සමා නකරුවෙකුද සහකරුවෙකද නැති බවත් විශ්වාස කිරීම)

රබ්බු යනුතේ, මැවීමේ හැකියාව, පාලන බලය හා අණ කිරීමේ බලය යනාදිය හිමි කෙනෙකි. එහෙයින්, අල්ලාහ් හැර කිසියම් මවන්නෙකු හෝ කිසියම් පාලකයෙකු හෝ අණ කිරීමට බලය ලත් බලවතෙකු හෝ නොමැත. අල්ලාහ් මෙසේ පවසන්නේය.

*දැනගන්න. නිර්මාණය කිරීමේ හැකියාවද, අණ කිරීමේ බලයද ඔහු (අල්ලාහ්) සතුය. (අල්කුර්ආන්-7:54)*

*ඔබලාගේ දෙවියා එම අල්ලාහ්ය. පාලන බලය ඔහු සතු වය. ඔහු හැර ඔබලා කවරෙකුව කැඳවන්නේද, ඔවුන් ඉඳි ඇට සිවියකටවත් උරුම කරුවන් නොවන්නන්ය. (අල්කුර් ආන්-35:13)*

තමගේ ප්‍රකාශය පවා විශ්වාස නොකරන අහංකාරකරු වෙකු හැර අන් කවරෙකු හෝ අල්ලාහ්ගේ පාලන බලය ප්‍රතික්ෂේප කළ බවට නොපෙනේ. ෆිර්අවුන්ගේ ප්‍රකාශය මෙයට නිදසුනකි. ඔහු සිය සමාජයන් අමතමින් මෙලෙස පැවැසීය.

*ඔබලාගේ අති උසස්ම ස්වාමියා හෙතම මමය. (අල්කුර් ආන්-79:24)*

*අහෝ ප්‍රධානීනි, ඔබලාට මා හැර වෙනත් ස්වාමියෙකු සිටින බව මා නොදනිමි (අල්කුර්ආන්-28:38)*

*නමුත්, ඔහු එසේ පවසන්නේ ස්ථිරසාර විශ්වාසයකින් නොව. 'ඔවුන්ගේ සිත්සතන් ඒවා (එම සාධකයන් සත්‍ය බව) පිළිගත් නමුත්, අපරාධයක් ලෙස හා අහංකාරකමින් ඔවුහු ඒවා ප්‍රතික්ෂේප කළහ (අල්කුර්ආන්-27:14)*

නබි මූසා (අලෛ) තුමා ෆිර්අවුන් අමතා මෙසේ පැවැසූ බව අල්ලාහ් පවසන්නේය.

*'එයට මූසා ආත්ම ප්‍රත්‍යක්ෂය ලබා දෙන සාධකයන් අහස් හා පොළොවෙහි අධිපතියා(වන අල්ලාහ්) හැර අන් කවරෙකු හෝ පහළ නොකළ බවට ඔබ සැබැවින්ම දනී. අහෝ ෆිර්අවුන්, ඔබ විනාශයට පත්වන්නා බව මා සිතමි' යනුවෙන් පැවැසීය. (අල්කුර්ආන්-17:102)*

මෙනිසා, මුෂ්රික් වරුන් අල්ලාහ්ගේ උලූහියියා හෙවත් වන්දනාමාන බලමහිමයෙහි ආදේශ කළ නමුත්, අල්ලාහ් ගේ රුබූබියියා හෙවත් පාලන බලය පිළිගනිමින් සිටියහ. මේ බව අල්ලාහ් මෙලෙස පවසන්නේය.

*ඔබලා දැන සිටින්නේනම්, පොළොව හා එහි ඇති දේට හිමිකරුවා කවරෙකු බව පවසන මෙන් (නබිතුමනී,) ඔබ (ඔවුන්ගෙන්) අසන්න. එයට ඔවුහු 'අල්ලාහ් බව පවසති. එසේනම්, ඔබලා (නැමදුම් කිරීමට සුදුසුම දෙවියා අල්ලාහ් බව) සිතා බලන්නේ දැයි ? (ඔවුන්ගෙන්) අසන්න. එසේම, අහස් හතක හා ශ්‍රේෂ්ඨමත් අර්ෂයෙහි හිමිකරු කවරෙකු දැයි ? ඔවුන්ගෙන් අසන්න. එවිට ඔවුහු 'අල්ලාහ්' බව පව සති. එසේනම්, ඔබලා (අල්ලාහ්ගේ දඬුවම ගැන) බියබැති නොවන්නේ දැයි (ඔවුන්ගෙන්) අසන්න. තවද, සෑම දේහි ආධිපත්‍යය කවරෙකුගේ අතේ පවතින්නේද ? තවද, සැමට අභය ලබා දෙන්නා හා කවරෙකුගෙන් හෝ අභය ලැබීමට උවමනා නොවන්නා කවරෙකු දැයි ඔබලා දැන සිටින්නේ නම්, පවසන්න යනුවෙන් (නබිතුමනී ඔවුන්ගෙන් ඔබ) විමසන්න. ඔවුහු 'මේවා අල්ලාහ්ටම හිමිවේ' යනුවෙන් පව*

*සති. එසේනම්, ඔබලා (සත්‍යයෙන් ඉවත්ව යාමට) රවටනු ලබන්නේ කෙසේද ? යනුවෙන් මවුන්ගෙන් විමසන්න. (අල් කුර්ආන්-23:85-89)*

*අහස් හා පොළොව නිර්මාණය කළේ කවරෙක්ද ? යනුවෙන් ඔබ මවුන්ගෙන් විමසන්නේනම්, ඒවා නිර්මාණය කළේ සර්ව බල සම්පන්න හා සියළු දැනුම් ඥානය ඇත්තැනැත්තා (වන අල්ලාහ්)ය යනුවෙන් මවුහු පවසති. (අල් කුර්ආන්-43:9)*

*තවද 'මවුන්ව නිර්මාණය කළේ කවරෙකුද ? යනුවෙන් ඔබ මවුන්ගෙන් අසන්නේනම් 'අල්ලාහ්ය' යනුවෙන් මවුහු පවසති. එසේනම් (මහුගෙන් සිට) මවුහු ඈත්කරනු ලබන්නේ කෙසේද ? (අල්කුර්ආන්-43:87)*

අල්ලාහ්ගේ ආඥාව ලෞකික හා ආගමික ආඥාවන්ද අන්තර්ගතව පවතී. අල්ලාහ් මෙම විශ්වය පාලනය කරන අතර, එහි තම සූක්ෂ්ම බුද්ධිය අනුව ප්‍රිය මනාපය පරිදි සියළු කටයුතු කරන්නේය. එසේම, මහු තමාගේ සූක්ෂ්ම බුද්ධිය අනුව ලොවෙහි ඉබාදත් හෙවත් නැමදුම අනිවාර්ය කරන්නෙකු ලෙසද මුආමලාත් නම්වූ ව්‍යවහාර කරුණුවල නීතිරීතීන් පිහිටුවන්නෙකු ලෙසද සිටින්නේය.

එනිසා, කවරෙකු අල්ලාහ්ට අමතරව වැඳුම් පිදුම්හි නීතිරීතීන් පනවන හෝ මුආමලාත් කරුණුවල විධිවිධානයන් සම්පාදනය කරන වෙනත් කෙනෙකු ඇති කරන්නේද, මහු අල්ලාහ්ට ආදේශ කරන්නා අතර, මහුගේ විශ්වාසය අස්ථිරභාවයෙන් පවතී.

## ඉ-අල්ලාහ්ගේ වන්දනාමාන බලය විශ්වාස කිරීම

(එනම්, නිසැකයෙන්ම අල්ලාහ් කිසියම් ආදේශ කරුවෙකු නොමැති වන්දනාමාන බල මහිමයට සුදුසුම එකම දෙවියාය.) ඉලාහ් යනු, පවිත්‍ර ප්‍රේමයෙන් හා ගෞරවනීය චේතනාවෙන් ඇඳහීම් කරනු ලබන දෙවියාය. අල්ලාහ් මේ පිළිබඳව මෙලෙස පවසන්නේය.

*තවද, ඔබලාගේ ස්වාමියා (ඉලාහ්) එකම දෙවියාය. ඔහු හැර අන් කිසියම් දෙවියෙකු නොමැත. ඔහු මහා කරුණාවන්තයා හා ඉතා ආදර වන්තයාය. (අල්කුර්ආන්-2:163)*

*අල්ලාහ් නීතිය (යුක්තිය) පිහිටුවන තැනැත්තා බව සිටියදී (කීකරුවී) නැමදුම් කිරීමට සුදුස්සා ඔහු හැර අන්කිසිවෙකු හෝ නොමැති බව ඔහුම සාක්ෂි දරයි. එසේම, මලක්වරුන්ද ඥාන වන්තයින්ද මෙසේම සාක්ෂි දරති. ඔහු හැර නැමදුම් කිරීමට සුදුස්සා කවරෙකුද නොමැත. ඔහු සියුම් බුද්ධිමතා හා ඥාන වන්තයාය. (අල්කුර්ආන්-3:18)*

අල්ලාහ්ට අමතරව ඉලාහ් (ස්වාමියෙක්) ලෙස සළකන, ඔහු හැර ඇඳහීම් කරනු ලබන සියල්ල ව්‍යාජ ඇඳහීම්ය. අල්ලාහ් මේ බව මෙසේ පවසන්නේය.

*එය මක්නිසාද යත්, සැබැවින්ම, අල්ලාහ් සත්‍යවන්තයා වන බැවින්, ඔහු හැර ඔවුන් කැඳවා සිටින සැම දේ මිථ්‍යා භාවයකි. නියත වශයෙන්ම, අල්ලාහ් අති උත්තම වන්තයා හා විශාල වන්තයාවේ. (අල්කුර්ආන්-22:62)*

ඒවාට දෙවියා ලෙස නම් කිරීමෙන් පමණක් සත්‍ය දෙවියකු වීමට නොහැක.

ලාත්, උස්සා හා මනාත් වැනි පිළිරුයන් ගැන අල්ලාහ් මෙසේ පවසන්නේය.

*නිසැකව, මේවා සියල්ල ඔබලාද, ඔබලාගේ පියවරුන්ද තැබූ සමහර නම් හැර අන් කිසිවක් නොවන්නේය. අල් ලාහ් මේවා පිළිබඳව කිසිදු සාධක හෝ පහළ නොකළේය. (අල්කුර්ආන්-53:23)*

නබි යූසුෆ් (අලෛ) තුමා තමා හා සමග සිර භාරයෙහි සිටි දෙදෙනා අමතා කළ උපදේශය අල්ලාහ් කුර්ආනයෙහි මෙලෙස පවසන්නේය.

*සිරභාරයේ සිටින මාගේ සගයිනි, (කිසියම් ශක්තියක් හෝ නොමැති) විවිධ දෙවිවරුන් ශ්‍රේෂ්ඨද ? නොඑසේනම්, (සෑම දේ මර්දනය කරන සර්ව බල සම්පන්නාවන එකම අල්ලාහ් ශ්‍රේෂ්ඨද ? (බව සිතා බලන්න) ඔහු හැර ඔබලා කවරෙකු කෙරෙහි ඇදහීම් කරන්නේද, ඒවා සියල්ල ඔබ ලාද ඔබලාගේ පියවරුන්ද නම් ආරූඪ කරගත් ව්‍යාජ නාම යන් මිස අන් කිසිවක් නොවේ. (අල්කුර්ආන්-12:39-40)*

එබැවින්, සෑම දූතවරුන්ම තම සමාජයන් අමතා මෙසේ කැඳවන්නට වූහ.

*අල්ලාහ්ට (පමණක්) නැමදුම ඉටුකරන්න. ඔබලාට ඔහු හැර වෙනත් ස්වාමියෙකු නැත. (අල්කුර්ආන්-7:59)*

නමුත්, (අල්ලාහ්ට ආදේශ කරන) මුෂ්රික්වරුන් මේවා ප්‍රතික්ෂේප කරමින්, අල්ලාහ් හැර වෙනත් දෙවිවරුන් ඇති කළහ. ඔවුහු අල්ලාහ්ට අමතරව ඔවුන්ටද ඇදහීම් කළහ. ඔවුන්ගෙන් උදව් උපකාර හා රැකවරණය පැතූහ.

අල්ලාහ් බුද්ධිමය සාධක දෙකක් මගින් මුෂ්රික් වරුන් ගේ මෙවන් ක්‍රියාවන් අවලංගු කළේය.

1-ඔවුන් ඇති කළ මෙම දෙවිවරුන්ට වන්දනාමාන බල යට අදාල කිසිදු දේව බලයක් හෝ නොමැත. ඒවා මවන ලද ඒවා මිස මවන්නට ශක්තිය ලද ඒවා නොවේ. තමන් අදහන මිනිසුන්ට කිසියම් යහපතක් ලබා දීමටද කිසියම් හානියක් ඔවුන්ගෙන් ඉවත් කිරීමටද ඔවුන්ට නොහැක. ඔවුන්ට ජීවියක් ලබාදීමට හෝ මරණයක් සිදු කිරීමට හෝ ඒවාට හැකියාවන් නොමැත. එසේම, අහස්හි කිසිදු දෙයක් හෝ ඒවාහි ආධිපත්‍යයෙහි නොමැති අතර, එකී සහකරු වන් ලෙසද ඒවා නොමැත. අල්ලාහ් මෙසේ පවසන්නේය.

*ඔවුහු ඔහු (අල්ලාහ්) හැර වෙනත් දෙවිවරුන් පිළි (අර) ගෙන සිටියහ. ඔවුහු (ඒ දෙවිවරුන්) කිසියම් දෙයක් හෝ නිර්මානය නොකළ අතර, ඔවුහුද නිර්මානය කළ ලද්දෝය. එසේම, තමන්ට හානියක් හෝ සැතක් හෝ කර ගැනීමේ හැකියාවක්ද ඔවුන්ට නොමැත. තවද, පණ නැසීමටද, පණ පොවීමටද (මළවුවන්) නැගිට්ට වීමටද ඔවුන්ට නොහැක. (අල්කුර්ආන්-25:3)*

*(නබිතුමනි, සමාන කරුවන්ට ඔබ) පවසන්න. අල්ලාහ් හැර ඔබලා කවරෙකු දෙවිවරුන් ලෙස සළකන්නේද, ඒවා කැඳවා බලන්න. ඒවා අහසේ හා පොළොවේ ඇති පරමා ණුව ප්‍රමාණ දෙයට හෝ හිමිකරුවන් නොවන්නෝය. තවද, ඒ දෙකෙහි ඇති දේහි අයිතියෙහිද කොටස්කාරකම් හෝ ඔවුන්ට නොමැත.*

*මවුන්ගෙන් කවරෙකු හෝ අල්ලාහ්ට උදව් කරන්නෙකු ලෙසද නොසිටිති. කවරෙකුට අල්ලාහ් නිර්දේශය (ෂ'ෆාඅත්කම) කිරීම සඳහා අවසරය ලබා දී ඇත්තේද, මවුන් හැර ඔහු වෙත ඉදිරිපත් කරන කිසිදු නිර්දේශයක් කවරෙකුට හෝ කිසියම් පලක් නොවන්නේය. (අල්කුර්ආන්-34:22-23)*

*මවුන් කිසියම් දෙයක් හෝ නිර්මානය කිරීමට නොහැකි පිළිරුවන්ද ඔහු (අල්ලාහ්) හා සමග ආදේශ කරන්නේ ? ඒවාද (අල්ලාහ් විසින්) මවන ලද්දකි. මවුන් (කාෆිර්වරු)ට කිසිදු උදව්වක් හෝ කිරීමට ඒවාට හැකියාවන් නොමැත. එපමණක් නොව, ඒවා තමන්ට පවාද උපකාරකර ගැනීමේ ස්ථාවරයෙන් නොමැත. (අල්කුර්ආන්-7:191-192)*

මෙම ව්‍යාජ දෙවි වරුන්ගේ ස්ථාවරයම මෙසේනම්, ඒවා දෙවිවරුන් ලෙස සැළකීම ඉතා අඥාන කමක් හා අසත්‍ය කමකි.

2-මෙම ආදේශ කරුවන් 'සැබැවින්ම අල්ලාහ් මවා පාලනය කරන දෙවියාය. සියළුම දේහි බලය ඔහුගේ අතෙහි පවතී. ඔහු සැමට අභය ලබා දෙන්නා අතර, ඔහුට අභය ලබා දෙන්නෙකු නැත' යනුවෙන් පිළිගනිමින් සිටිති. මෙය අල්ලාහ්ගේ මවා පාලනය කිරීමේ බලය මවුන් පිළිගන්නා සේ ඔහුගේ වන්දනාමාන බලයද මවුන් පිළිගත යුතු බව තහවුරු කරයි. අල්ලාහ් මේ බව මෙසේ පවසන්නේය.

*අහෝ මිනිසුනි, ඔබලා සැබෑ බැතිමතුන් ආකාංක්ෂාවනු වස් ඔබලාද ඔබලාට පෙර විසූ අයද මැවූ ඔබලාගේ දෙවියා හට අදහීමයන් ඉටු කරන්න. ඔබලා වෙනුවෙන් පොළොව*

ඇතිරිල්ලක් මෙන්ද අහස මුදුනක් මෙන්ද ඔහු නිර්මාණය කළේය. අහසින් (වැසි) ජලය පහළ කොට එමගින් ඔබ ලාට ආහාර වශයෙන් බෝග (පලතුරු හා පැලෑටි) වර්ග යන් පිටත් කළේය. මේ ගැන ඔබලා දැනුවත්ව සිටින කළ, අල්ලාහ්ට ආදේශ ඇති නොකරන්න. (අල්කුර්ආන්-2:21-22)

තවද ඔවුන්ව නිර්මාණය කෙළේ කවරෙකුද ? යනුවෙන් ඔබ ඔවුන්ගෙන් අසන්නේනම් 'අල්ලාහ්ය' යනුවෙන් ඔවුන් පවසති. එසේනම් (ඔහුගෙන් සිට) ඔවුහු ඈත්කරනු ලබන් නේ කෙසේද ? (අල්කුර්ආන්-43:87)

(නබිතුමනි, ඔබ ඔවුන්ගෙන්) 'අහස් හා පොළොවෙන් සිට ඔබලාට ආහාර සපයන්නේ කවරෙක්ද ? තවද, (ඔබලා ගේ) ශ්‍රවණය කිරීමේ හා දර්ශණය කිරීමේ හැකියාව කව රෙකුගේ බලයෙහි පවතින්නේද ? තවද, අජීවියෙන් සිට ජීවියන්ද, ජීවියෙන් සිට අජීවියන්ද මතු කරන්නේ කවරෙ ක්ද ? විශ්වයෙහි පැවැත්ම පාලනය කරන්නේ කවරෙක්ද ?' යනුවෙන් අසන්න. එයට ඔවුහු 'අල්ලාහ්' යනුවෙන් පවසති. එනම්, ඇයි ඔබලා (අල්ලාහ් කෙරෙහි) බියෙන් නොසිටින් නේ ? යනුවෙන් අසන්න. එබැවින්, ඔබලාගේ සත්‍ය දෙවියා අල්ලාහ්මයි. මෙම සත්‍යය අතහැරීමෙන් පසු නොමග හැර අන් කිසිවක් නොමැත. ඔබලා (සත්‍යයෙන්) හරවනු ලබන් නේ කෙසේද ? (අල්කුර්ආන්-10:31-32)

## ඊ-අල්ලාහ්ගේ නාමයන් හා ගුණාංගයන් විශ්වාස කිරීම

අල්ලාහ් තම ධර්ම ග්‍රන්ථයෙහි තමාට කුමණ නාමයන් හා ගුණාංගයන් ඇති බව සඳහන් කර ඇත්තේද, එසේම නබිනායක මුහම්මද් (සල්) තුමා තම සුන්නා සංකල්පයේ

ඔහුට කුමණ නාමයන් හා ගුණාංගයන් පැහැදිලිකර ඇත්තේද, ඒවා එලෙසම සනාථ කළ යුතුයි. නමුත්, ඒවා කිසියම් විකෘති කිරීම්, ප්‍රතික්ෂේප කිරීම්, ප්‍රමාණ කිරීම් හා සමාන කිරීම්වලින් තොරව පවතිය යුතුයි. මේ බව අල්ලාහ් මෙසේ පවසන්නේය.

*අල්ලාහ්ට අලංකාරමත් නාමයන් ඇත. එනිසා, එමගින්ම ඔහු කැඳවා ප්‍රාර්ථනා කරන්න. ඔහුගේ නාමයන් පිළිබඳව දෝෂා රෝපණය කරන්නන් නොසලකා හරින්න. ඔවුහු යෙදී සිටින ක්‍රියාවන්ට අදාල කුලිය (හෝ දඬුවම) ඔවුන් ලබති. (අල්කුර්ආන්-7:180)*

*තවද, අහස් හා පොළොවෙහි ඔහුගේ ස්වභාවය (ගුණ වර්ණනාව) උසස්තම ලෙස පවතී. ඔහු බල සම්පන්නා හා ඥාන වන්තයා ලෙස සිටී. (අල්කුර්ආන්-30:27)*

*ඔහු හා සමාන කිසි දෙයක් හෝ නොමැත. ඔහු (සැම දේ) කන්දී නෙත් යොමා සිටින්නාය. (අල්කුර්ආන්-42:11)*

## ***මෙම කරුණ හේතුවෙන් පිරිස් දෙකක් නොමග ගියහ.***

### පළමුවන පිරිස

ඔවුන් අල්ලාහ්ගේ අලංකාරමත් නාමයන් හා ගුණාංගයන් සියල්ල හෝ ඒවායින් සමහරයන් ප්‍රතික්ෂේප කරති. එම නාමයන් හා ගුණාංගයන් අල්ලාහ්ට සනාථ කළේනම්, ඔහුව ඔහුගේ නිර්මානයන් සමග සමානත්වයක් දක්වන්නට අවශ්‍යවන බවට ඔවුහු පවසති. මෙම මතය පහත සඳහන් කරුණු අනුව වැරදි සහගතවේ.

1-මෙමගින් අල්ලාහ්ගේ ග්‍රන්ථයෙහි පරස්පර විරෝධතා පවතින බව අනවශ්‍ය ප්‍රශ්න මතුවන්නේය. මක්නිසාදයත්, අල්ලාහ් තමාට නාමයන් හා ගුණාංගයන් ඇති බවත්, කිසි යම් දෙයක් හෝ ඔහු හා සමානව නොමැති බවත් පවසන්නේය. අල්ලාහ්ට නාමයන් හා ගුණාංගයන් ඇති බව සනාථ කිරීම ඔහුව නිර්මානයන් සමග සමාන කිරීමක් වන්නේ නම්, අල්ලාහ්ගේ ග්‍රන්ථයෙහි පරස්පර විරොධතාවන් ඇති බවටද, සමහර වැකි වෙනත් වැකි අසත්‍ය කිරීමක් බවටද පත්වේ.

2-ද්‍රව්‍යයන් දෙකක් නාමයෙන් හෝ ගුණාංගයෙන් හෝ උපමාවීමෙන් ඒවා දෙකම එක හා සමාන බවට පවතීමට නොහැක. අපි දකින මිනිසුන් දෙදෙනෙක් බලන, ශ්‍රවණය කරන හා කථා කරන මිනිසුන් හැටියට සමාන වන්නයින් ලෙස සිටිති. නමුත්, ඔවුන් මිනිස් ස්වභාවයෙහි, බැල්මෙහි, ශ්‍රවණය කිරීමෙහි හා කථා කිරීමෙහි එක හා සමාන වන්නයින් වීමට නොහැක.

අපි දකින ප්‍රාණීන්ගේ අත්, පාදයන් හා ඇස් යනාදීන් සමානව තිබීමෙන් එම ප්‍රාණීන් සියල්ලම එක හා සමානව සිටීමට නොහැක. නාමයෙන් හෝ ගුණාංගයෙන් සමානවීමෙහි මැවීම් අතරේ මෙවැනි වෙනස්කම් පැහැදිළි වන්නේ නම්, මවන්නා හා මැවීම් අතර එම වෙනස්කම් කෙතරම් පැහැදිළිව පවතීද ?

## දෙවන පිරිස

ඔවුහු අල්ලාහ්ගේ නාමයන් හා ගුණාංගයන් පිළිගන්නා අතර, ඔහුව ඔහුගේ මැවීම් හා සමග සමාන කරති. නියත

වශයෙන්ම, මූල වැකියන්හි අරමුණ හෙතම මේ බව ඔවුහු අදහස් කරති. මන්දයත්, තියත වශයෙන්ම, අල්ලාහ් තම දාසයන් සමඟ ඔවුන් පැහැදිලිවන ආකාරයට කථා කරයි.

මෙම තර්කය පහත සඳහන් කරුණු අනුව වැරදි සහ ගතවේ.

1-අල්ලාහ් තමාගේ මැවීම් හා සමඟ සමානව සිටින බව පැවැසීම වැරදි සහගත ආකල්පයෙකි. මෙය බුද්ධිය සහ ආගම වැරදි සහගත බව පෙන්වා දෙයි. අල්ලාහ්ගේ වැකි හා නබිතුමාගේ සුන්නාව වටහා දෙන සාධක වැරදි සහ ගත වීමට නොහැක.

2-මිනිසා වටහා ගත හැකි ආකාරයට අල්ලාහ් ඔවුන් අමතන්නේ එකී මූලික අර්ථය මත අනුවය. එනමුත්, එම අර්ථය කුමණ යථාර්ථ ස්ථාවරයේ පවතින්නේද, එම යථාර්ථ ස්ථාවරය පිළිබඳ දැනුම අල්ලාහ් තම පැවැත්ම හා ගුණාංග අනුව තමාටම හිමිකර ගත්තේය.

අල්ලාහ් තමා සියල්ල අසන්නා බව තමා ගැන පැවැසීමෙන්, සවන්දීම (ශබ්දයන්ට සවන්දීම) යනු එකී මූලික අර්ථය අනුව සැම දෙනා දැන සිටින කරුණකි. එනමුත්, අල්ලාහ්ගේ සවන්දීමේ හැකියාව පිළිබඳ යථාර්ථය දැනගත නොහැකි කරුණකි. කුමක්නිසාදයත්, සවන් දීමේ යථාර්ථ භාවයෙහි නිර්මානයන් අතරද වෙනස්වීම් පවතී. එසේනම්, නිර්මාතෘවරයා හා නිර්මානයන් අතර එම සවන්දීමේ ස්ථාවරයෙහි වෙනස්වීම් පවතීම ඉතාමත් පැහැදිලි හා ප්‍රසිද්ධ කරුණකි.

අල්ලාහ් තමා පිළිබඳව 'ඔහු අර්ෂයෙහි මහානුපාන සම්පන්න ලෙස වාඩිවිය' යනුවෙන් පැවැසීමෙන්, මෙහි වාඩිවීම යනු එකී මූලික අර්ථය අනුව දැනගත හැකි කරුණකි. නමුත්, වාඩිවීම යනුවෙහි යථාර්ථභාවය අප දැනීමේ හැකියාවෙන් වටහා ගත නොහැකි කරුණෙකි. මන්ද, වාඩිවීමේ මූලික අර්ථයෙහි නිර්මානයන් අතරද වෙනස්කම් පවතින්නේය. ශක්තිමත් පුටුවක වාඩිවීම, පරුෂකමෙන් හා දැඟලීමෙන් ගමන් කරන්නා ඔටුවෙකු මත වාඩිවීම හා සමානව නොපවතී. මැවීම් අතර වාඩිවීම කෙරෙහි මෙවැනි වෙනස්කම් පවතින්නේනම්, මවන්නා හා මැවීම් අතර එම වාඩිවීම් කෙරෙහි පවතින වෙනස්කම් පැහැදිලි හා ප්‍රසිද්ධියකි.

ඉහත සඳහන් පරිදි අල්ලාහ් කෙරෙහි විශ්වාසය කිරීම තුලින් විශ්වාස වන්තයින්ට ඉතා විශාල ප්‍රයෝජනයන් කීපයක් ලැබෙන්නේය. ඒවා අතර සමහරයන් මෙසේය.

1-අල්ලාහ්ගේ ඒකීයභාව ප්‍රතිපත්තිය පිළිගැනීම. එනම් ඔහු හැර අන් කවරෙකුගෙන් හෝ කිසිදු අපේක්ෂාවක් හෝ බියක් නොපවතින පරිදි හා ඔහු හැර වෙනත් කවරෙකුට හෝ කිසිදු නැමදුම් වර්ගයන් යොමු නොකරන ආකාරයට ස්ථිර පැවැත්මෙන් සිටීම.

2-අල්ලාහ්ගේ අලංකාරමත් නාමයන් හා ශ්‍රේෂ්ඨමත් ගුණාංගයන්ට සරිලන පරිදි ඔහුට පරිපූරණ ආදරය කිරීම හා ගරුත්වය කිරීම.

3-අල්ලාහ් අණ කළ දේ ක්‍රියා කිරීම හා ඔහු තහනම් කළ දේ වැළකී සිටීම මගින් ඔහුට කළ යුතු නැමදුම් ස්ථිර කිරීම.

# මලක්වරුන් විශ්වාස කිරීම

මලක්වරුන් සැඟවුනු ලෝකයට අයත් නිර්මාන වර්ග යකි. ඔවුන් අල්ලාහ්ට නැමදුම කරන අතර, ඔවුන්ට චන්ද නාමාන බලමහිමයෙන් හෝ මවා පාලන කරන බලයෙන් හෝ කිසිවක් නැත. අල්ලාහ් ඔවුන්ව ආලෝකයෙන් මවා, ඔහුගේ අණට සම්පූර්ණයෙන් කීකරුවීමේ ස්වභාවයද, ඒ අනුව ක්‍රියා කිරීමේ හැකියාවද ඔවුන්ට ලබාදී ඇත. අල්ලාහ් මෙසේ පවසන්නේය.

*කවරෙකු ඔහු (අල්ලාහ්) සමග සිටින්නේද ඔවුන් (මලක් වරුන්) අහංකාර කරමින් ඔහුට වැඳුම් පිදුම් කිරීම ප්‍රතික් ෂේප නොකරති. ඔවුහු විඩාවට නොපත්වෙති. තවද, වෙහෙ සටද නොපත්ව දිවා රාත්‍රී නොනකා ඔහුව ප්‍රශංසා කරමින් සුවිශුද්ධ කරති. (අල්කුර්ආන්-21:19-20)*

ඔවුන් විශාල සංඛ්‍යාවකින් සමන්විත පිරිසක්වන අතර, ඔවුන්ගේ සංඛ්‍යාව ගැන අල්ලාහ් හැර අන් කවරෙකු හෝ නොදනිති. නබිනායක මුහම්මද් (සල්) තුමාගේ මි:රාජ් නම් දෙව් ලොව ගමන පිළිබඳව අනස් (රලි) තුමා වාර්තා කරන නබි වදනෙහි මෙසේ සඳහන්වේ.

නබිනායක මුහම්මදු (සල්) තුමානන්ට අහසෙහි පිහිටා ඇති බයිතුල් මඃමූර් පෙන්වනු ලැබිත. එහි දිනපතා හැත් තෑ දහස් මලක්වරුන් සලාතය ඉටු කරමින් සිටියහ. ඔවුහු එතැන් සිට පිටත්වූ පසු නැවත නොපැමිණෙති. මෙය ඔවුන් ගේ අවසන් පැමිණීමක් ලෙසද පවතී. (බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)

## මලක්වරුන් පිළිබඳ විශ්වාසය කරුණු සතරක් මත පවතී.

1-ඔවුන්ගේ පැවත්ම ගැන විශ්වාස කිරීම.

2-නම් වශයෙන් අපි දැන සිටින ජිබ්රීල් (අලෛ) වැනි මලක්වරුන් ඔවුන්ගේ නම් සමගද, නම් වශයෙන් නොදැන සිටින මලක්වරුන් පොදුවෙන්ද විශ්වාස කිරීම.

3-අපි දැන සිටින මලක්වරුන්ගේ ස්වභාවයන් පිළිබඳව විශ්වාස කිරීම. මෙයට ජිබ්රීල් (අලෛ) තුමාගේ ස්වභාවය නිදසුනකි. ජිබ්රීල් (අලෛ) තුමාව මවනලද සැබෑ ස්වරූප යෙන්ම නමා දුටු බවත්, එතුමාට පියාපත් හයසීයක් තිබූ බවත්, අහස එතුමා වසාගෙන සිටි බවත් නබිනායක මුහම් මදු (සල්) තුමා පවසන්නේය. (බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)

අල්ලාහ්ගේ අණ පරිදි මලක්වරයා මිනිස් රූපයට පරිවර් තනය විය හැක. අල්ලාහ් මර්යම්-මේරි තුමිය වෙත ජිබ් රීල් (අලෛ) තුමාව එවීම මෙයට නිදසුනකි. එනම් එතුමා අංග සම්පූර්ණ මිනිස් රූපයෙන් මර්යම් තුමිය ඉදිරියෙහි පැමිණ සිටියේය.

එමෙන්ම, නබිනායක මුහම්මදු (සල්) තුමා තම ශ්‍රාවක රුවන් හා සමග අසුන්ගෙන සිටිනවිට, සුදෝ සුදු ඇඳුමෙන් සැරසී, කළු පැහැති හිසකෙසින් යුත් පුද්ගලයෙකුගේ රූප යෙන් ජිබ්රීල් (අලෛ) තුමා පැමිණියේය. ඔහුගෙන් ගමනේ වෙහෙසක් හෝ විඩාවක් හෝ දක්නට නොලැබූ අතර, ශ්‍රාවකරුවන් අතර කවරෙකු හෝ මෙයට පෙරද ඔහුව දිට මින් නොසිටියහ.

පැමිණ ඔහු නබිනායක තුමාගේ දනහිස් දෙකට ඔහු ගේ දනහිස් දෙක සේන්දු වන පරිදි එතුමාගේ ඉදිරියෙහි අසුන්ගෙන, සිය කලව දෙක මත තම අල්ල දෙක තැබීය. පසුව ඔහු නබිතුමාගෙන් ඉස්ලාම්, ඊමාන්, ඉහ්සාන් (පවිත්‍ර චේතනා), අවසාන දිනය හා එකී සළකුණු පිළිබඳව ප්‍රශ්න කළේය. නබිතුමා ඒ ප්‍රශ්නවලට පිළිතුරු දීමෙන් පසු ඔහු පිටත්ව ගියේය. පසුව නබිතුමා (ශ්‍රාවකරුවන් අමතා) 'ඔහු ජිබ්රීල්ය. ඔබලාගේ ආගම ඔබලාට උගන්වන්නට ඔබලා වෙත පැමිණීය' යනුවෙන් පැවැසීය.

එමෙන්ම, අල්ලාහ් ඉබ්රාහීම් (අලෛ) හා ලූත් (අලෛ) යනාදි නබිවරුන් වෙත එවූ මලක්වරුන් මිනිස් රූපයෙන්ම පැමිණියහ.

4-අල්ලාහ්ගේ ආඥාව පරිදි මලක් වරුන් කුමණ ක්‍රියා වන්හි යෙදමින් සිටින බව අපි දැන සිටින්නේද, ඒවා විශ් වාස කිරීම. එනම්, ඔවුන් කිසිදු වෙහසකින් හෝ විඩාවීම කින් තොරව දිවා රාත්‍රී නොනකා අල්ලාහ්ව තස්බීහ් ප්‍රශංසා කර හා නැමදුම් කිරීමෙහි නොකඩවා නිරතවී සිටින බවට විශ්වාස කළ යුතුයි.

විශේෂ වගකීම් පවරනලද සමහර මලක්වරුන් මෙසේය.

- ජිබ්රීල් : අල්අමීන් (විශ්වාස වන්තයා) නම් ඔහුට දූතව රුන්ට හා වක්තෘවරුන්ට අල්ලාහ්ගෙන් සිට පහළවන නිවේදනය ගෙන ඒමේ වගකීම පවරා ඇත.
- මීකාඊල් : වැස්ස හා පැලෑටි බෝගයන් පිළිබඳ වගකීම ඔහුට පවරා ඇත.

❒-ඉස්රාෆීල් : අවසාන දිනය සිදුවීම හා මැවීමයන් නැවත පණ පොවා නැගිටටවීම සඳහා සූර් හෙවත් කාහලයෙහි පිඹීමේ වගකීම ඔහුට පවරා ඇත.

❒-මලකුල් මවුත් : මරණය සිදුවන මොහොතේ ප්‍රාණය අත් පත් කිරීමේ වගකීම ඔහුට පවරා ඇත.

❒-මාලික් : නිරයෙහි වගකීම් දැරීම ඔහුට පවරා ඇත.

❒-ගර්භාෂයේ සිටින සිසුවන් රැකීමේ වගකීම් පවරා ඇති මලක්වරුන් : මවකුගේ කුසෙහි සිව් මසක් සම්පූර්ණවූ පසු අල්ලාහ් එම දරුවා වෙත මලක්වරයෙක් එවා, එම දරුවාගේ ආහාර පානයන්, ආයුෂ කාලය, ක්‍රියාවන් සහ එම දරුවා ආශීර්වාදයට හිමිවූ කෙනෙක්ද, නොහොත් ශාපයට හිමිවූ කෙනෙක්ද යනාදිය සටහන් කරන මෙන් අණ කරයි.

❒-මිනිසුන්ගේ ක්‍රියාවන් රැකීමේ වගකීම් පවර ලද මලක් වරුන් : ඔවුන් මිනිසුන්ගේ දකුණු හා වම් දෙස සිට සෑම දෙනාගේ ක්‍රියාවන් සටහන් කරති.

❒-මරණයට පත්වූ අයගෙන් ප්‍රශ්න කිරීමේ වගකීම පවරා ඇති මලක්වරුන් : මිනිය මිනීවළෙහි තැන්පත් කළායින් පසු ඔහු වෙත මලක්වරුන් දෙන්නෙක් පැමිණ, ඔහුගේ දෙවියා කවරෙක්ද ?, ආගම කුමක්ද ? හා වක්තෘ වරයා කවරෙක්ද ? යනාදිය වශයෙන් ඔවුහු ප්‍රශ්න කරති.

## මලක්වරුන් විශ්වාස කිරීමෙහි පවතින විශිෂ්ඨ ප්‍රයෝජනයන්

1-අල්ලාහ්ගේ ගරුත්වය, හැකියාවන් හා බල මහිමය යනාදීන් පිළිබඳ දැනුම. සැබැවින්ම, නිර්මානයන්හි ගරුත් වය නිර්මාතෘවරයාගේ ගරුත්වයෙහි පවතී.

2-අල්ලාහ් මිනිසුන්ට කළ උපකාරය වෙනුවෙන් මහුට තුති පුද කිරීම. එනම්, මිනිසුන් ආරක්ෂා කිරීම, මවුන්ගේ ක්‍රියාවන් සටහන් කිරීම හා මවුන්ගේ යහ ජීවනයන් වෙනු වෙන් අල්ලාහ් මලක්වරුන් පත්කර ඇත.

3-මලක් වරුන් අල්ලාහ්ට පුද පූජා කර සිටින හෙයින්, මවුන් ආදරය කිරීම.

නොමග ගිය සමහර පිරිස් මලක්වරුන් ශරීරයෙන් යුත් පිරිසක් වීම ප්‍රතික්ෂේප කරති. තවද, මලක් වරුන් යනු, මැවීම්වල සැඟවී පවතින යහපත් හැකියාවන් ලෙස සළ කන බව මවුහු පවසති. මෙම නිගමනය අල්ලාහ්ගේ අල් කුර්ආනයද, නබිනායක තුමාගේ සුන්නා සංකල්පයද මුස් ලිම්වරුන්ගේ ඒකමතික තීරණයද අසත්‍ය කරයි. අල්ලාහ් මෙසේ පවසන්නේය.

*පැසසුම් සියල්ල අහස් හා පොළොව නිර්මානය කළ හා මලක් වරුන් දූතයන් ලෙසට පත් කළ අල්ලාහ්ටම හිමිවේ. මවුන් (මලක්වරුන්) පියාපත් දෙකින්, තුනින් හා සතරින් සමන්විත අයවේ. (අල්කුර්ආන්-35:1)*

*මලක් වරුන් ප්‍රතික්ෂේප කරන්නන්(ගේ ප්‍රාණය) අත් පත් කරමින් සිටීම (නබිතුමනි) මබ දුටුවෙනම්, (එකී බයා නක දර්ශනය මබ දකී. මලක් වරුන්වූ මවුන්) මවුන්ගේ මුහුණටද මවුන්ගේ පිටටද පහර දෙති. (අල්කුර්ආන්-8:50)*

*මෙම (අවිශ්වාසීන්වූ) අපරාධකරුවන් මරණාසන්න වේද නාවට ලක්වී සිටින කල්හි මලක්වරුන් මවුන්ගේ අත් දිගු කොට 'මබලාගේ ප්‍රාණයන පිටමන් කරන්න' (යනුවෙන් මවුන් පවසති) (අල්කුර්ආන්-6:93)*

*මෙසේ මලක්වරුන්ගේ හදවතෙන් බිය ඉවත් වී ගියවිට 'ඔබලාගේ දෙවියා පැවැසීයේ කුමක්ද ? යනුවෙන් විමසති. (එයට ඔවුහු) 'ඔහු සත්‍යයම පැවැසීය. ඔහු (අල්ලාහ්) අති උසස්ය. අති උත්තමයාය' යනුවෙන් ඔවුහු පවසති. (අල්කුර් ආන්-34:23)*

ස්වර්ග වාසීන් පිළිබඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

*මලක්වරුන් (ස්වර්ගයේ) සෑම දොරටුවකින්ම (ස්වර්ග වැසියන්වූ) ඔවුන් පිළිගැනීමට (ඔවුන් වෙත) පැමිණ සිටිති. (මලක්වරුන් ඔවුන් අමතා) 'ඔබලා (ලොවෙහි) ඉවසීමෙන් සිටි බැවින්, ඔබලාට (අල්ලාහ්ගේ) ආශීර්වාදය ලැබේවා. අව සාන (දිනයෙහි) නිවස කෙතරම් යහපලදායිද ? (යනුවෙන් පවසති) (අල්කුර්ආන්-13:23-24)*

නබිනායක මුහම්මදු (සල්) තුමා පැවසූ බව අබුහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

අල්ලාහ් පුද්ගලයෙකුට ආදරය කරන්නේනම්, ඔහු ජිබ් රීල් (අලෛ) තුමා අමතා 'සැබැවින්ම, අල්ලාහ් මෙම පුද් ගලයාට ආදරය කරයි. ඔබද ඔහුට ආදරය කරන්න. යනු වෙන් අණ කරයි. එසේම ජිබ්රීල් (අලෛ) තුමාද එම පුද් ගලයාට ආදරය කරයි. පසුව එතුමා අහසෙහි සිටින්නන් අමතා 'අල්ලාහ් මෙම පුද්ගලයාට ආදරය කරයි. එහෙයින්, ඔබලා සියළු දෙනාද ඔහුට ආදරය කරන්න' යනුවෙන් පව සයි. එසේම ඔවුන් සියළු දෙනා ඔහුට ආදරය කරති. පසුව ඔහු පොළොවෙහි යහපත් ශීලයෙකු ලෙසට පිළිගනු ලබයි. (බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)

සිකුරාදා දින මලක්වරුන් මස්ජිදයේ සැම දොරටුවෙහිම අසුන්ගෙන සිට ප්‍රථමයෙන් පැමිණෙන්නන් පිළිවෙළට සට හන්කර ගනිති. ඉමාම්වරයා මිම්බර (දේශනා කුටි)යෙහි අසුන් ගත් විගස ඔවුන් තම සටහන් පත් සියල්ල අකුලා ගෙන දේශනයවට සවන්දීම සඳහා පැමිණෙති. (බුහාරි ග්‍රන් ථය ඇසුරෙනි)

මෙම මූලික සාධකයන් මලක්වරුන් ශරීරයෙන් යුත් පිරි සක් හැර, නොමග ගිය පිරිස්ගේ මතයට අනුව මානසික හැකියාවන් නොවන බව පැහැදිළිවම වටහා දෙන්නේය. මුස්ලිම්වරුන්ගේ ඒකමතික තීරණයද මෙම මූලික සාධක යන් මතම පවතී.

# දේව ග්‍රන්ථයන් විශ්වාස කිරීම

කුතුබ් යනු, කිතාබ් යන වචනයෙහි බහු වචනයෙකි. එය ලියන ලද දෙයක් යනු තේරුම වටහා දෙයි. අල්ලාහ් තම දූතවරුන්ට පහලකළ දේව ග්‍රන්ථයන් කුතුබ් යනුවෙන් හැඳින්වේ. මිනිසුන් මෙලොවෙහි සහ පරලොවෙහි ජයග්‍රහ ණය ලබාගැනීම සඳහා ආශිර්වාදයක් හා යහමඟ පෙන්වී මක් වශයෙන් අල්ලාහ් ඒවා පහල කළේය.

## ග්‍රන්ථයන් පිළිබඳ විශ්වාසය කරුණු සතරක් මත පවතී.

1-සැබැවින්ම, දේව ග්‍රන්ථයන් අල්ලාහ්ගෙන් සිටම පහ ලවූ බව විශ්වාස කිරීම.

2-නම් වශයෙන් දැන සිටින ග්‍රන්ථයන් එකී නම් වශ යෙන්ම විශ්වාස කිරීම. එනම් නබිනායක මුහම්මද් (සල්)

තුමාට පහළවූ කුර්ආනය, නබි මූසා (අලෛ) තුමාට පහළවූ තව්රාතය, නබි ඊසා (අලෛ) තුමාට පහළවූ ඉන්ජීලය හා නබි දාවූද් (අලෛ) තුමාට පහළවූ සබූරය යනාදී ග්‍රන්ථයන් විශ්වාස කළ යුතුයි. එසේම, නම් වශයෙන් නොදන්නා ග්‍රන්ථයන් ගැන පොදුවෙන් විශ්වාස කළ යුතුයි.

3–එම ග්‍රන්ථයන් ලබා දෙන්නා විශ්වාසනීය පණිවිඩයන් සැබෑ බව සනාථ කිරීම. එනම්, කුර්ආනයේ සඳහන් සියළු තොරතුරුද, පැරණි ග්‍රන්ථවල වලංගුවෙන් පවතින තොර තුරුද සැබෑ බව සහතික කළ යුතුයි.

4–එම ග්‍රන්ථයන්හි අවලංගු නොවී පවතින නීතිරීතීන් අනුගමනය කිරීම, ඒවා ගැන තෘප්ති වීම හා ඒවා එසේම පිළිගැනීම. එම නීතිරීතීන්හි සූක්ෂ්ම භාවය පිළිබඳව දැන සිටියද, නොදැන සිටියද ප්‍රශ්නයක් නොවන්නේය. පැරණි ග්‍රන්ථයන් සියල්ල කුර්ආනයේ පැමිණීමත් සමගම අවලංගු විය. මේ බව අල්ලාහ් මෙසේ පවසන්නේය.

*තවද, (නබිතුමනි) සත්‍යය උසුලා සිටින මෙම දේව ග්‍රන්ථය ඔබ වෙත අපි පහළ කළෙමු. මෙය (කුර්ආනය) දේව ග්‍රන්ථයන් අතර පෙර පහළවූ ග්‍රන්ථයන් සත්‍ය කරමින්ද ඒවා ආරක්ෂාකර (අවසන්කර)මින්ද පවතී. (අල්කුර්ආන්- 5:48)*

මේ අනුව, පැරණි ග්‍රන්ථයන්හි කිසිදු නියෝගයක් මත හෝ ක්‍රියා කිරීම තහනම්වන අතර, ඒවායින් අල්කුර්ආනය සත්‍යකළ හා සනාථකළ නියෝගයන් අනුව පමණක් ක්‍රියා කිරීමට හැක.

## ග්‍රන්ථයන් විශ්වාස කිරීමෙහි පවතින විශිෂ්ඨ ප්‍රයෝජනයන්

1-අල්ලාහ් සෑම සමාජයන්ටම යහමග පෙන්වනු පිණිස ග්‍රන්ථයන් පහළ කිරීම මගින් ඔවුන්ට කළ සැළකීම පිළිබඳ දැනුම.

2-අල්ලාහ් සෑම සමාජයටම ඔවුනොවුන්ගේ ස්වභාවයට ගැලපෙන පරිදි ෂරීආ නම් යහමගක් ලබා දීමෙහි සූක්ෂ්ම භාවය පිළිබඳ දැනුම. අල්ලාහ් මෙසේ පවසන්නේය.

*අපි ඔබලාගේ සෑම සමාජයන්ටම ෂරීඅත් නම් ආගමක්ද මගපෙන්වීමක්ද සලසා දී ඇත්තෙමු. (අල්කුර්ආන්-5:48)*

3-මෙමගින් අල්ලාහ් ඔවුන්ට කර ඇති දායාදයන් වෙනුවෙන් ඔහුට තුති පුද කිරීම.

# රසූල්වරුන් විශ්වාස කිරීම

රසූල් යනු, රුසුල් යන වචනයෙහි බහු වචනයකි. එය එවනු ලබන පුද්ගලයා යනුවෙන් හැඳින්වේ. එනම්, යම් පණිවිඩයක් පුද්ගලයෙකු වෙතට යොමු කිරීම සඳහා එවනු ලැබූ පුද්ගලයාය.

අල්ලාහ් කවරෙකුට ෂරීආ ආගමක් වහී මගින් හෙළිදරව් කොට එය මානව සංහතිය කරා ප්‍රචාරය කරන මෙන් අණ කර ඇත්තේද, ඔවුන් රසූල්වරුන් බව හැඳින්වේ. ඔවුනතර ප්‍රථම රසූල් වරයා නබි නූහ් (අලෛ) තුමා වන අතර, නබි මුහම්මදු (සල්) තුමා අවසාන රසූල් වරයාය. මේ පිළිබඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

*(නබිතුමනී,) නූහ් තුමාට සහ ඔහුට පසුව පැමිණි නබි වරුන්ට අපි වහි (හෙළිදරව්ව) පහළ කළාක් මෙන්, සත්‍ය යෙන්ම, ඔබටද අපි වහි පහළ කළෙමු. (අල්කුර්ආන් -4:163)*

අනස් බින් මාලික් (රලි) තුමා අෂ් ෂෆාඅත් හෙවත් මැදි හත් වීම පිළිබඳව නබිනායක මුහම්මද් (සල්) තුමා පැවැසූ වදනක් මෙසේ වාර්තා කරන්නේය.

(පරලොව දිනයෙහි) මිනිසුන් නබි ආදම් (අලෛ) තුමා වෙත පැමිණ තමන් වෙනුවෙන් (අල්ලාහ් අතර) මැදිහත්වන මෙන් ඉල්ලා සිටිති. එයට එතුමා 'තමාට නොහැක. ඔබලා අල්ලාහ් එවූ ප්‍රථම රසූල්වරයා වන නබි නූහ් (අලෛ) තුමා වෙත කරා යන්න' යනුවෙන් පවසන්නේය. (බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)

නබිනායක මුහම්මදු (සල්) තුමා ගැන අල්ලාහ් මෙසේ පවසන්නේය.

*මුහම්මද් (සල්) ඔබලාගෙන් කවරෙකුගේ හෝ පියෙකු ලෙසට නොසිටිය. නමුත්, එතුමා අල්ලාහ්ගේ රසූල් වරයා හා අවසන් වක්තෘවරයාවේ. (අල්කුර්ආන් -33:40)*

රසූල් (දූත) වරයෙකු නොඑවන ලද කිසියම් සමාජයක් හෝ නොමැත. අල්ලාහ් එම රසූල්වරයාට විශේෂ ෂරීඅත් ආගමක් ලබාදී ඔහුව ඔහුගේ සමාජයන් කරා යවන්නේය. එසේම, නබි (වක්තෘ)වරයෙකු නොඑවූ කිසිඳු සමාජයක් හෝ නොමැත. අල්ලාහ් ඔහුට පැරණි ආගමක් එය ප්‍රතිසංස් කරණය කිරීම සඳහා වහී මගින් හෙළිදරව් කොට ඔහුගේ සමාජය කරා යවන්නේය. අල්ලාහ් මෙසේ පවසන්නේය.

*නිශ්චය වශයෙන්ම, 'අල්ලාහ්ට (පමණක්) නැමදුම ඉටු කරන්න තාගූත් (ව්‍යාජ දෙවිවරුන්)ගෙන් ඈත්වන්න' යනු වෙන් දේශනා කිරීම සඳහා සියළුම සමාජයන් කරාම අපි දූතවරයෙක් එවා ඇත්තෙමු. (අල්කුර්ආන්-16:36)*

*අවවාද කරන කවරෙකු හෝ නොපැමිණි කිසියම් සමාජ යක් හෝ නොමැත. (අල්කුර්ආන්-35:24)*

*ඇත්ත වශයෙන්ම, අපි තව්රාතය පහළ කෙළෙමු. එහි යහමග පෙන්වීමක් හා ආලෝකයක් පවතින. (අල්ලාහ්ට) අවනතවූ වක්තෘවරුන් එමගින්ම යුදෙව්වරුන්ට විනිශ්චය කරමින් සිටියහ. (අල්කුර්ආන්-5:44)*

මෙම රසූල්වරුන් සැම දෙනා අල්ලාහ්ගේ නිර්මානයන්වූ මිනිසුන්ය. ඔවුන්ට නැමදුමට අදාල බලය හෝ මවා පාල නය කරන බලය හෝ නොමැත. රසූල්වරුන්ගේ නායකයා වූ හා ඔවුන් අතර අල්ලාහ් ඉදිරියේ උසස් ස්ථානයක් දරණ නබිනායක මුහම්මදු (සල්) තුමා පිළිබඳව අල්ලාහ් මෙලෙස පවසන්නේය.

*(නබිතුමනි) අල්ලාහ්ගේ ප්‍රිය මනාපය හැර යහපතක් හෝ අයහපතක් සිදුකිරීමේ හැකියාව මාහට නොමැත. මා සැඟවුනු කරුණු පිළිබඳව දැනුවත්ව සිටින්නේ නම්, මම අධික ලෙස කුසල් රැස්කරමින් සිටියෙමි. එසේම, කිසියම් විපාකයන් හෝ මාහට සිදු නොවන්නටද හැකිවේ. විශ්වාස කරන ජනතාවට මා අවවාද කරන්නෙකු හා සුභාසිංසනාය පතන්නෙකු වශයෙන් සිටිමි' යනුවෙන් ඔබ පවසන්න. (අල් කුර්ආන්-7:188)*

*(නබිතුමනි) ඔබ පවසන්න. සත්‍යයෙන්ම, ඔබලාට කිසියම් අනතුරක්ද යහපතක්ද කිරීමේ බලයක් මට නොමැත. ඔබ පවසන්න. අල්ලාහ්ගෙන් සිට මා මුදවන්නට කවරෙකුට හෝ නොහැක. තවද, ඔහු හැර අන් කිසියම් පිළිසරණක් හෝ මාහට නොමැත. (අල්කුර්ආන්-72:21-22)*

මිනිස් ස්වභාවයට අදාලවූ ලෙඩ, මරණය, කුස ගින්න, පිපාසය හා මෙවැන්නන් මෙම රසූල්වරුන්ටද සිදුවන්නේය. ඉබ්රාහීම් (අලෛ) තමාගේ දෙවියා පිළිබඳව කළ වර්ණනාව අල්ලාහ් මෙලෙස පවසන්නේය.

*තවද, මාහට ආහාර පානයන් සපයන්නේ හෙතම ඔහුමය. මා රෝගයට පත්වූවිට, මාව නිරෝගී කරන්නේද ඔහුමය. තවද, මාව මරණයට පත්කරන්නේද, පසුව මාහට පණ පොවන්නේද ඔහුමය. (අල්කුර්ආන්-26:79-81)*

නබිනායක මුහම්මද් (සල්) තුමා 'මාද ඔබලා මෙන් සාමාන්‍ය මිනිසෙක්වන අතර, ඔබලා අමතකවන සේම මාද අමතක වන්නේය. එනිසා, මා අමතකවූයේනම්, ඔබලා මාහට මතක් කරන්න' යනුවෙන් පවසන්නේය. (බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)

අල්ලාහ් රසූල් වරුන් ගැන වර්ණනා කරන කළ 'රසූල් වරුන් මාහට ඉතාමත් අවංකව කීකරුවී සිටින බවත්, එය ඔවුන්ගේ උතුම්වූ තරාතිරම බවත් අල්ලාහ් සංඥාකර පවසන්නේය. නූහ් (අලෛ)තුමා ගැන අල්ලාහ් මෙසේ පවසයි.

*නිශ්චය වශයෙන්ම, ඔහු (නූහු තුමා) කළගුණ දන්නා වහලෙකි. (අල්කුර්ආන්-17:3)*

නබිනායක මුහම්මද් (සල්) තුමා ගැන අල්ලාහ් මෙසේ පවසන්නේය.

*ලෝක වැසියන්හට අවවාදයක් වනු පිණිස (සත්‍යය හා අසත්‍යය වෙන්කර වටහා දෙන මෙම) ෆුර්කාන් (අල්කුර් ආන්) ග්‍රන්ථය ඔහුගේ වහලා (මුහම්මද්) වෙත පහළ කළ ඔහු (අල්ලාහ්) අති ශ්‍රේෂ්ඨ වන්තයාය. (අල්කුර්ආන්-25:1)*

(නබි) ඉබ්රාහීම් (අලෛ), ඉස්හාක් (අලෛ) හා යාකූබ් (අලෛ) යන වක්තෘවරුන් ගැන අල්ලාහ් මෙසේ පවසයි.

*තවද, අපගේ වහලුන්වූ ඉබ්රාහීම්ද ඉස්හාක්ද යාකූබ්ද ඔබ සිහිකරන්න. ඔවුන් නිර්භීත ශක්තියක් හා (දිව්‍යමාන) දර්ශනයක් හිමිවූ අය වේ. පරලොව කෙරෙහි සිහි කිරීම යනු පවිත්‍ර චේතනාව ඔවුන් සතුව තිබී හෙයින්, ඔවුන්ව තෝරා ගත්තෙමු. නියතව, ඔවුන් අප වෙත තෝරා ගන්නා ලද විද්වතුන්ය. (අල්කුර්ආන්-38:45-46)*

මරියම් (අලෛ) තුමියගේ පුත්‍රයාවන ඊසා (අලෛ) තුමා ගැන අල්ලාහ් මෙසේ සඳහන් කරන්නේය.

*ඔහු (ඊසා-ජේසු) අපි අනුග්‍රය කළ වහලෙකු මිස අන් කිසිවෙකු නොමැත. තවද අපි ඔහුව ඊශ්‍රායීල් පරම්පරාවට ආදර්ශයක් ලෙස පත් කෙළෙමු. (අල්කුර්ආන්-43:59)*

## රසූල්වරුන් පිළිබඳ විශ්වාසය කරුණු සතරක් මත පවතී.

1-ඔවුන් ගෙන ආ සංදේශය සැබැවින්ම අල්ලාහ්ගෙන් සිට පැමිණි සැබෑ සංදේශයක් බව විශ්වාස කිරීම. එනිසා, කවරෙකු කිසිඳු රසූල් වරයෙකුගේ සංදේශනය ප්‍රතික්ෂේප

කරන්නේද, ඔහු රසූල්වරුන් සැම දෙනාම ප්‍රතික්ෂේප කළ අයෙකු ලෙස සළකනු ලැබේ. නබි නූහ් (අලෛ) තුමා ගැන අල්ලාහ් මෙසේ පවසන්නේය.

*(නබි) නූහුගේ සමාජයන් (සියළුම) රසූල්වරුන් අසත්‍ය කළහ. (අල්කුර්ආන්-26:105)*

නබි නූහු (අලෛ) තුමාව ඔහුගේ සමාජයන් අසත්‍ය කළ වකවානුවේ ඔහු හැර වෙනත් කිසියම් රසූල්වරයෙක් නොසිටි බැවින්, ඔවුන් රසූල්වරුන් සැම දෙනා ප්‍රතික්ෂේප කළ අසත්‍යකරුවන් ලෙස අල්ලාහ් පත් කළේය. මේ අනුව, කුමණ ක්‍රිස්තු බැතිමතුන් නබිනායක මුහම්මදු (සල්) තුමාව අසත්‍යකර, එතුමාව අනුගමනය නොකර සිටින්නේද, එම ක්‍රිස්තු බැතිමතුන් (එතුමාව පමණක් නොව) නබි ඊසා තුමා වද අසත්‍යකර, එතුමාව අනුගමනය නොකරන්නන්ය.

විශේෂයෙන්, නබි ඊසා (අලෛ) තුමා නාබිනායක මුහම් මදු (සල්) තුමාගේ පැමිණීම පිළිබඳව ක්‍රිස්තු බැතිමතුන්ට සුභාසිංශනයක් පවසා ඇත. එනී තේරුමනම්, නබිනායක මුහම්මදු (සල්) තුමා ඔවුන් (ක්‍රිස්තු බැතිමතුන්) නොමග යැමෙන් මුදවා, ඔවුන්හට සෘජු මාර්ගයක් පෙන්වීම සඳහා ඔවුන් වෙත එවූ දූතවරයෙක් මිස අන් කිසිවක් නොවේ.

2-නම් වශයෙන් දැන සිටින රසූල් වරුන්වූ නබිනායක මුහම්මද් (සල්) තුමා, ඉබ්රාහීම් (අලෛ) තුමා, මූසා (අලෛ) තුමා, ඊසා (අලෛ) තුමා හා නූහ් (අලෛ) යන දූතවරුන් විශ්වාසය කිරීම. මෙම පස් දෙනා ස්ථිර හදවතින් (උලුල් අස්මි) ක්‍රියා කළ රසූල්වරුන් ලෙස හැඳින්වේ. ඔවුන් ගැන අල්කුර්ආනයෙහි ස්ථාන දෙකක මෙසේ සඳහන්වේ.

*තවද, (නබිතුමනි, ඔබ සිහි කරන්න) අපි සෑම වක්තෘවරුන්ගෙන්ද, එසේම, ඔබගෙන්ද, නූහ්ගෙන්ද, ඉබ්රාහීම්ගෙන්ද, මූසාගෙන්ද හා මරියම්ගේ පුත්‍ර ඊසාගෙන්ද අපි ස්ථිර පොරොන්දුවක් ලබා ගත්තෙමු. (අල්කුර්ආන්-33:7)*

*(විශ්වාස වන්තයිනි) නූහ් (අලෙ) තුමාට කුමණ දෙය ඔහු උපදෙස් කළේද, එයම ඔහු ඔබලාට ආගමක් බව පත් කළේය. එනිසා, (නබිතුමනි) අපි ඔබට වහී (හෙළිදරව්ව) මගින් පහළ කළේද ඉබ්රාහීම්, මූසා, ඊසා යන නබිවරුන්ට උපදෙස් කළේද (කුමක්නම්) 'ඔබලා (ඒක දේවත්වයට හිමි) ආගම ස්ථිරසාරව ග්‍රහණයකර ගන්න. ඔබලා එහි පිල්වලට බෙදී වෙන් නොවන්න' යනුවෙනි. (අල්කුර්ආන්-42:13)*

නම් වශයෙන් දැන සිටින රසූල් වරුන් පිළිබඳව පොදුවෙන් විශ්වාස කළ යුතුයි. අල්ලාහ් මෙසේ පවසන්නේය.

*තවද, (නබිතුමනි,) නිශ්චය වශයෙන්ම, ඔබට පෙර අපි රසූල්වරයන් එවා ඇත්තෙමු. ඔවුන්ගෙන් සමහරුන් ගැන අපි ඔබට පවසා ඇත්තෙමු. (තවත්) සමහරුන් ගැන අපි ඔබට නොපසා ඇත්තෙමු. (අල්කුර්ආන්-40:78)*

3-ඔවුන් පිළිබඳ නිවැරදි පණිවිඩ සත්‍ය කිරීම.

4-ඔවුන්ගෙන් අප වෙත එවන ලද රසූල් වරයාගේ ෂරීඅත් නම්වූ නීති පද්ධතිය අනුව ක්‍රියා කිරීම. ඔහු අවසන් දූතයා හා මුළු මිනිස් සංහතිය සඳහා එවන ලද නබිනායක මුහම්මදු (සල්) තුමානන්ය. අල්ලාහ් මේ පිළිබඳව මෙලෙස පවසන්නේය.

ඔබ දේවියා මත දිවුරා කියමි. ඔවුන් තමන් අතර ඇතිවූ ප්‍රශ්නවලදී ඔබව විනිශ්චයකරු ලෙස පිළි ගැනීමෙන් පසු ඔබ කළ විනිශ්චය ගැන තෘප්තිමත්වී එම විනිශ්චය ඔවුන් පිළි ගන්නා තුරු ඔවුන් විශ්වාස වන්තයින් විය නොහැක. (අල්කුර්ආන් - 4:65)

## රසූල්වරුන් විශ්වාස කිරීමෙහි පවතින විශිෂ්ඨ ප්‍රයෝජනයන්

1- අල්ලාහ්ගේ ඍජු මාර්ගය කරා මග පෙන්වීම සඳහා හා අල්ලාහ්ට නැමදුම කිරීමේ ක්‍රමය පැහැදිලි කිරීම සඳහා මිනිසුන් වෙතට රසූල්වරුන් එවීම මගින් ඔවුන්ට අල්ලාහ් කර ඇති කරුණාව හා ආදරය පිළිබඳව දැනීම.

2- මෙම උතුම් භාග්‍ය සඳහා අල්ලාහ්ට තුති පුද කිරීම.

3- රසූල් වරයන් ප්‍රිය කිරීම, ඔවුන්ට ගරුත්වය දැක්වීම හා ඔවුන්ට ඔබින ආකාරයට ඔවුන් ප්‍රශංසා කිරීම. මන්ද යත්. ඔවුන් අල්ලාහ්ගේ දූතවරුන්වූ අතර, ඔවුන් අල්ලාහ්ට නැමදුම ඉටුකරමින්ද, ඔහුගේ නිවේදනය ව්‍යාප්ත කරමින් ද, ඔහුගේ වහළුන්ට උපදෙස් කරමින්ද සිටින්නන්ය.

'අල්ලාහ්ගේ රසූල්වරුන් මිනිස් වර්ගයට අයත් නොවන් නන්ය' බවට තර්ක කරන සමහර හිතුවක්කාර පිරිස් එම රසූල් වරුන් අසත්‍ය කළහ. මෙම හිතුවක්කාරකම ප්‍රතික්ෂේපකර, අල්ලාහ් මෙසේ පවසන්නේය.

*මිනිසුන්ට යහමග පැමිණි කල්හි එය කෙරෙහි විශ්වාස කිරීමෙන් ඔවුන් වැළක් වූයේ 'අල්ලාහ් එක් මිනිසෙකුවද රසූල් වරයා ලෙස එව්වේ ?' යනුවෙන් කීමකි. '(මෙම) මහ පොළොවේ මලක්වරුන් ඇවිදිමින් සිටින්නේනම්, අපි ඔවුන්*

*වෙනුවෙන් අහසින් සිට එක් මලක්වරයෙකු රසූල්වරයෙකු ලෙස අපි එවා ඇත්තෙමු' යනුවෙන් ඔබ පවසන්න. (අල් කුර්ආන්-17:94-95)*

අල්ලාහ් ඔවුන්ගේ මෙම මතය වැරදි සහගත බව මෙහි පැහැදිලි කරයි. මන්දයත්, පොලොවෙහි වසන්නේ මනුෂ්‍ය යන් බැවින්, ඔවුන් වෙත එවිය යුතු රසූල් වරයාද මනුෂ්‍ය යෙකු විය යුතුයි. පොළොවෙහි වසන්නේ මලක් වරුන්නම්, ඔවුන් හා සමානව සිටීම සඳහා අල්ලාහ් ඔවුන් වෙත අහසින් මලක්වරයෙකුම එවා ඇති. මෙසේ රසූල්වරුන් අසත්‍ය කළ අය පැවැසූ බව අල්ලාහ් මෙසේ පවසන්නේය.

*ඔවුහු 'ඔබලා අප හා සමාන මිනිසුන් මිස අන් කිසිවක් නොමැත. අපගේ පියවරුන් වැඳුම් කළ දැයින් අප වළක්වන්නට ඔබලා අදහස් කරන්නෝය. එසේ නම්, පැහැදිලි අණ බලයක් ගෙනෙන්න' යයි කීහ. එයට එම රසූල්වරුන් 'සැබවින්ම, අපි ඔබලා සේම මිනිසුන්ය. එනමුත්, අල්ලාහ් තම වහලුන් අතර, තමා කැමැති අයට (පමණක්) අනුග්‍රහය ලබා දෙන්නේය. අල්ලාහ්ගේ අවසරයෙන් හැර ඔබලා වෙත අණබලයක් ගෙන ඒමට අපහට නොහැක. (අල්කුර්ආන් -14 : 10-11)*

# අවසාන දිනය විශ්වාස කිරීම

මිනිසුන් අතර ප්‍රශ්නකර, ඒ අනුව ඔවුන්ට කුලිය හෝ දඬුවම පිරිනැමීම සඳහා නැවත පණ පොවා නැගිට්ට වන දිනය අවසාන දිනය යනුවෙන් හැඳින්වේ. මෙම දිනයෙන් පසු වෙනත් දිනයක් නොමැති නිසා, මෙසේ අවසාන දිනය

ලෙස නම්කර ඇත. අවසාන වශයෙන්, ස්වර්ග වාසීන් සහ අපායවාසීන් ඔවුනොවුන්ගේ ස්ථානවල ලැගුම්ගෙන සිටිති.

## අවසාන දිනය පිළිබඳ විශ්වාසය කරුණු තුනක් මත පවතී.

1–නැවත පණ පොවා නැගිට්ටවීම ගැන විශ්වාස කිරීම. එනම්, සූර් හෙවත් නලාවෙහි දෙවැනි වරට පිඹිනවිට මරණයට පත්වූ සැම දෙනාටම නැවත පණ පොවනු ලැබේ. පසුව ඔවුහු පාවහන් නොපැළඳ හිස් පාදයෙන්ද, ඇඳුම් නොපැළඳ නිර්වස්ත්‍රයෙන්ද හා චර්මඡේදනය නොකරමින්ද විශ්වයේ අධිපතියාවූ දෙවියන් වහන්සේගේ ඉදිරියෙහි නැගිට සිටිති. අල්ලාහ් මෙසේ පවසන්නේය.

*අපි ප්‍රථමයෙන් මැවීම කිරීම කෙසේ ඇරඹුවෙද, එසේම නැවත මවන්නෙමු. මෙය අපෙන් පවතින පොරොන්දුවකි. සැබවින්ම, අපි එය ඉටු කරන්නෙමු. (අල්කුර්ආන්–21:104)*

අවසාන දිනයෙහි මිනිසුන් නැවත පණ පොවා නැගිට්ටවීම කුර්ආනයද, නබිතුමාගේ සුන්නා සංකල්පයද මුස්ලිම් වරුන්ගේ ඒකමතික එකඟතාවයද තහවුරු කරන දෙයකි. අල්ලාහ් මෙසේ පවසන්නේය.

*පසුව, නියත වශයෙන්ම ඔබලා මින් ඉදිරියට මරණයට පත් වන්නන්ය. පසුව, ඔබලා නියත වශයෙන්ම, අවසාන දිනයෙහි නැගිට්ටවනු ලැබේ. (අල්කුර්ආන්–23:15–16)*

නබිනායක මුහම්මදු (සල්) තුමා 'අවසාන දිනයේදී මිනිසුන් සැමදෙනා පාවහන් නොමැතිව චර්මඡේදනය නොකර නැගිට්ටවනු ලැබේ' යනුවෙන් පවසන්නේය. (බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)

නැවත පණපොවා නැගිටටවීම මුස්ලිම්වරු සැම දෙනාම සාධක ගතව සත්‍යයක් බවට ඒකමතිකව පිළිගෙන ඇති කරුණකි. රසූල් වරුන් මාර්ගයෙන් මිනිසුන්ට පවරන ලද වගකීම සඳහා ඔවුන්ට ප්‍රතිඵලය (කුලිය හෝ දඩුවම) ලබා දෙනු පිණිස ඔවුන් වෙනුවෙන් අල්ලාහ් අවසාන දිනයක් පිහිටීම නුවණට අනුකූලවන කරුණකි. අල්ලාහ් මෙලෙස පවසන්නේය.

*අපි ඔබලාව නිශ් ප්‍රයෝජනය සඳහා නිර්මාණය කෙළ බවද හා ඔබලා නැවත අප වෙත පමුණුවනු නොවන බවද ඔබලා සිතාගෙන සිටියේ ? (අල්කුර්ආන්-23:115)*

අල්ලාහ් මුහම්මදු (සල්) තුමා මෙසේ අමතන්නේය.

*(නබිතුමනි) නිසැකයෙන්ම, ඔබට අල්කුර්ආනය (අනුව ජීවත්වීම) අනිවාර්ය කළ ඔහු (අල්ලාහ්) ඔබව පරලොව දිනය කරා පමුණුවන්නා ලෙසද සිටී. (අල්කුර්ආන්-28:85)*

2-ප්‍රශ්න කිරීම හා කුලිය පිරිනැමීම කෙරෙහි විශ්වාස කිරීම. එනම් මිනිසා ඔහුගේ ක්‍රියාවන් කෙරෙහි ප්‍රශ්නකර, ඒ අනුව, ඔහුට කුලිය හෝ දඩුවම පිරිනමනු ලැබේ. අල් කුර්ආනය හා නබිතුමාගේ සුන්නාහ් සංකල්පය මෙය තහවුරු කරයි. මුස්ලිම් වරුන්ගේ ඒකමතික මතයද මෙසේම පවතී. අල්ලාහ් මෙසේ පවසන්නේය.

*නිසැකයෙන්ම, ඔවුන් නැවත අප වෙත පැමිණිය යුතුයි. පසුව, ඔවුන්ගෙන් ප්‍රශ්න කිරීමේ වගකීම අප සතුව පවතී. (අල්කුර්ආන්-88:25-26)*

*කවරෙකු (අල්ලාහ්ගේ ඉදිරියෙහි) කුසල් රැගෙන පැමිණෙන්නේද, ඔහුට එවන් මෙන් දස ගුණයක් ලැබේ. එසේම කවරෙකු අකුසල් රැගෙන පැමිණෙන්නේද, ඔහුට එම කුසලේහි ප්‍රමාණයට (පමණක්) දඬුවම් පණවනු ලැබේ. තවද, මවුන්ට කිසියම් අසාදාරණයන් හෝ සිදුකරනු නොලැබේ. (අල්කුර්ආන්-6:160)*

*අපි පරලොව දිනයෙහි සාධාරණ තුලාවන් ස්ථාපනය කරන්නෙමු. පසුව කවරෙකුට හෝ කිසියම් අසාධාරණයක් නොකරනු ලැබේ. මිනිසුන් කළ අබ ඇට ප්‍රමාණයක ක්‍රියාවක් වුවද එය අපි (එදින) ගෙන එන්නෙමු. ගණන් ගැනීමෙහි අපි ප්‍රමාණවත්වෙමු. (අල්කුර්ආන්-21:47)*

නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව ඉබ්නු උමර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

(පරලොව දිනයේ) අල්ලාහ් විශ්වාස වන්තයෙකු තමාගේ අසලට ගෙනවිත්, ඔහු මත තම කරුණාව පහළකොට 'ඔබ මෙවන් පාප ක්‍රියාවන් ගැන දැන සිටින්නෙහිද?' යනුවෙන් ප්‍රශ්න කරයි. එයට ඔහු 'ඔව් මාගේ ස්වාමිනි' යනුවෙන් කියයි. මේ ආකාරයට ඔහු තමාගේ පාප ක්‍රියාවන් සියල්ල පිළිගෙන, ඔහු විනාශයට පත්වූ බව සිතන කළ අල්ලාහ් 'මෙම පාපයන් සියල්ල මා ලොවෙහි වසංකර ඇති බැවින් අද දින ඔබහට සමාව දෙමි' යනුවෙන් පවසයි. අනතුරුව ඔහුගේ කුසල් ක්‍රියාවන් සඳහන් කර ඇති වාර්තා පොත ඔහුට පිරිනමනු ලැබේ.

අවිශ්වාස වන්තයින් හා වංචනිකයින් මිනිසුන්ගේ ඉදිරියට කැඳවා 'තම ස්වාමියා කෙරෙහි අසත්‍ය කළේ මෙතම

මවුන්මය. දැනගන්න. අල්ලාහ්ගේ ශාපය අපරාධකරුවන් මත පවතී' යනුවෙන් පවසයි. (බුහාරි හා මුස්ලිම)

නබිනායක මුහම්මදු (සල්) තුමා මෙසේද පවසන්නේය.

කවරෙකු කුසල් ක්‍රියාවක යෙදීමට අදහස්කර, එය ක්‍රියාවෙහි යෙදුනේද, ඔහුට අල්ලාහ් කුසල් දහයක් සිට හත්සීයක් දක්වා හා එයට වඩාද එය ගුණකර තමා වෙත සටහන්කර තබා ගන්නේය. නමුත්, කවරෙකු අකුසල් ක්‍රියාවක යෙදීමට අදහස් කර එය ක්‍රියාවෙහි යෙදුනේද, ඔහුට අල්ලාහ් කුසලක් පමණක් සටහන් කරන්නේය.

පරලොව දිනයෙහි මිනිසුන්ගේ ක්‍රියාවන් ගැන ප්‍රශ්න කිරීම හා එය අනුව මවුන්ට කුලිය හෝ දඬුවම පිරිනැමීම සැම මුස්ලිම් වරුන්ම ඒකමතික පිළිගන්නා මතයකි. එය නුවණටද ඔබින කරුණක්දවේ.

අල්ලාහ් ධර්ම ග්‍රන්ථයන් පහළ කර, රසූල්වරුන් එවා මවුන් ගෙන ආ නිවේදනය පිළිගන්නා ලෙසත්, ඒවා අතර අනිවාර්ය කර ඇති කාර්යයන් ක්‍රියාවෙහි යෙදෙන ලෙසත් මිනිසුන්ට අණ කරයි. එසේම අල්ලාහ්ගේ මෙම අණට විරුද්ධව ක්‍රියා කරන්නන්ට එරෙහිව ජිහාද් (සටන්) කිරීමද අනිවාර්ය කළේය. එපමණක් නොව මවුන්ගේ රුධිර, දරුවන්, ස්ත්‍රීන් හා සම්පත් යනාදීන් අනුමත බවට පත් කළේය.

පරලොව දිනයෙහි ප්‍රශ්න කිරීම හෝ කුලිය හා දඬුවම පමුණුවීම සිදු නොවන්නේ නම්, මේවා සියල්ල නිශ්ප්‍රයෝජන බවට පත් නොවන්නේද ? ඉතා සූක්ෂ්මවන්තයාවූ අල්ලාහ් නිශ්ප්‍රයෝජන ක්‍රියාවන් කිරීමෙන් පවිත්‍ර වන්තයාය.

මෙය පහත සඳහන් වැකිය මගින් අල්ලාහ් මෙසේ සංඥා කරන්නේය.

එබැවින්, කවර මිනිසුන් කරා රසූල්වරුන් එවනු ලැබූ වෙද, එවන් මිනිසුන්ගෙන් නියත වශයෙන්ම අපි ප්‍රශ්න කරන්නෙමු. එසේම, නියත වශයෙන්ම, එම රසූල්වරුන් ගෙන්ද (ඔවුන් ඉටුකළ කාර්යයන් හා එයට මිනිසුන් ලබා දුන් ප්‍රතිචාරය ගැන) අපි ප්‍රශ්න කරන්නෙමු. පසුව (සිදුවූ දේ) සියල්ල දැනුම් ඥානයෙන් අපි එම මිනිසුන්හට පව සන්නෙමු. අපි කිසියම් තැනක හෝ සැඟව නොසිටියෙමු. (අල්කුර්ආන්-7:6-7)

3-ස්වර්ගය හා අපාය ගැන විශ්වාස කිරීම. මෙම ස්ථාන දෙකම මිනිසුන් යායුතුව ඇති ස්ථිර ලැගුම් ස්ථානයන්ය. ස්වර්ගය යනු, භක්තිමත් විශ්වාස වන්තයින්ට අල්ලාහ් පිරි නමනු ලබන භාග්‍යයන් සහිත සතුටු නිවසකි. එම විශ්වාස වන්තයින් කවරෙකුනම්, ඔවහු ඔවුන්ට විශ්වාස කළ යුතු බව අල්ලාහ් නියම කළ සියල්ල විශ්වාස කළහ. අල්ලාහ්ට හා ඔහුගේ දූතවරයාට කීකරුවී සිය ජීවිතය ගත කළහ. අල්ලාහ්ට පවිත්‍ර වන්තයින් ලෙසද, ඔහුගේ දූතවරයා අනුග මනය කරන්නන් ලෙසද සිටියහ. ස්වර්ගයේ කිසිදු ඇසක් හෝ නොදුටු, කිසිදු කණක් හෝ නොඇසූ හා කිසිදු මිනිස් සිතෙන් හෝ වර්ණනාකළ නොහැකි විවිධ වර්ග සැප සම් පත් හා භාග්‍යයන් පවතී. අල්ලාහ් මේ පිළිබඳව මෙලෙස පවසන්නේය.

*නියත වශයෙන්ම, කවරෙකු විශ්වාසකර, කුසල් ක්‍රියා වන්හි යෙදෙන්නේද, නිර්මානයන් අතර විශිෂ්ඨ වන්තයින්*

*හොඳම ඔවුන්මය. ඔවුන්ගේ ස්වාමියා වෙත ඔවුන්ගේ කුලිය අද්න් යනු ස්ථිරසාර ස්වර්ගයෙකි. එහි යට ගංගාවන් ගලා බසිති. ඔවුහු එහි සදාකාලිකව රැඳී සිටිති. ඔවුන් කෙරෙහි අල්ලාහ් තෘප්තිවේ. ඔවුහුද ඔහු කෙරෙහි තෘප්තවෙති. මේ සියල්ල තමාගේ ස්වාමියා කෙරෙහි බියබැති කමින් සිටින් නත්ටය. (අල්කුර්ආන්-98:7-8)*

*ඔවුන් කළ (කුසල්) ක්‍රියාවන් සඳහා ත්‍යාග ලෙස (පිරිනැමීමට) සඟවා ඇති නෙත් පිනවීම (පරලොව මෝක්ෂය) කිසියම් කෙනෙකු හෝ නොදනී. (අල්කුර්ආන් 32-17)*

අපාය යනු, ප්‍රතික්ෂේප කරුවන් හා අපරාධ කරුවන්ට පිරිනමනු ලබන උග්‍ර දඬුවම් සහිත නිවසකි. ඔවුන් අල්ලාහ් කෙරෙහි ප්‍රතික්ෂේප කළහ. ඔහුගේ දූතයාට විරුද්ධකම් කළහ. නරකාදියෙහි කිසියම් කෙනෙකුගේ සිත්සතනෙන් හෝ වටහා ගත නොහැකි වේදනා හා දඬුවම් පවතී. මෙය අල්ලාහ් මෙසේ පවසන්නේය.

*තවද, අවිශ්වාස වන්තයින් වෙනුවෙන් පිළියෙලකර ඇති (නිරයේ) ගින්නට බියවන්න. (අල්කුර්ආන්-3:131)*

*නියතව, (ප්‍රතික්ෂේප කරන) අපරාධකරුවන්ට අපි එක් ගින්නක් පිළියෙල කර ඇත්තෙමු. එකී ගිනිදැල්ල ඔවුන්ව පිරිවරමින් පවතී. ඔවුන් එහි (ලක්වූ දැඩි පිපාසයෙන් මිදීමට) ජලය පතන කළ, උණුකර ලද ලෝහ වර්ගයක් වැනි පානයක් ඔවුන්ට ලබා දෙනු ලැබේ. එය ඔවුන්ගේ මුහුණු දවනු ඇත. එය ඉතා නපුරුම පානයකි. එසේම, ඔවුන්ගේ ලැගුම් ස්ථානද ඉතා නපුරුය. (අල්කුර්ආන්-18:29)*

*නිශ්චය වශයෙන්ම, අල්ලාහ් ප්‍රතික්ෂේප කළවුන් ශාප කොට මවුන් වෙනුවෙන් දළදමා දැල්වෙන ගින්නක් පිළියෙලකර ඇත. මවුහු එහි සදාකල් රැඳී සිටිති. මවුහු එහි රැකවරණය ලබා දෙන්නෙකු හෝ උදව් කරන්නෙකු හෝ නොලබති. මවුන්ගේ මුහුණු නරකාදියේ ගින්නෙහි පෙරළා ගනු ලබන දිනයෙහි මවුහු 'අහෝ, අපි අල්ලාහ්ට හා රසූල් වරයාට කීකරුවූනේ නැතේ' යනුවෙන් පවසති. (අල්කුර් ආන්-33:64-66)*

**මරණයෙන් පසු සිදුවන සෑම දේ ගැන විශ්වාස කිරීම අවසාන දිනය පිළිබඳ විශ්වාස කිරීමකි. එයට උදාහරණ මෙසේය.**

1-මිනීවළෙහි සිදුවන කලබලය :

මළ අය භූමිදානය කළ පසු ඔහුගෙන් 'ඔහුගේ දෙවියා කවරෙකුද? ඔහුගේ ධර්මය කුමක්ද? ඔහුගේ වක්තෘවරයා කවරෙකුද ? යනුවෙන් ප්‍රශ්න කිරීම මේ බවට හැඳින්වේ. කවරෙකු ලොවෙහි සැබෑ දේව විශ්වාසයෙන් ජීවත්වූයේද, ඔහුව අල්ලාහ් (මිනීවළෙහි) සැබෑ වචනයෙන් ස්ථිර කරයි. එවන් අය 'මගේ දෙවියා අල්ලාහ්ය. මගේ ආගම ඉස්ලාමිය. මගේ වක්තෘවරයා නබිනායක මුහම්මද් (සල්) තුමාය' යනුවෙන් පවසයි.

නමුදු, අල්ලාහ් අපරාධකරුවන් නොමඟ යොමු කරයි. කාෆිර් හෙවත් ප්‍රතික්ෂේප කරන්නා 'අහෝ මම කිසිවක් නොදනිමි' යනුවෙන්ද, මුනාෆික් හෙවත් වංචනිකයා (හෝ සැකකාරයා) 'අහෝ මම කිසිවක් නොදනිමි. මිනිසුන් පවසන දේම මාද පවසමින් සිටියෙමි' යනුවෙන්ද පවසයි.

2-මිනීවළෙහි සැප හා වේදනාව :

මිනීවළෙහි වේදනාව දේව ප්‍රතික්ෂේපකරුවන් හා වෙශ ධාරීන් ලෙසට ජීවත්වූ අපරාධ කරුවන්ට සිදුවේ. අල්ලාහ් මෙය මෙලෙස පවසන්නේය.

*මෙම (අවිශ්වාසීන්වූ) අපරාධකරුවන් මරණාසන්න වේද නාවට ලක්වී සිටින කල්හි මලක්වරුන් ඔවුන්ගේ අත් දිගු කොට 'ඔබලාගේ ප්‍රාණ පිටමන් කරන්න. ඔබලා අල්ලාහ් කෙරෙහි සත්‍යය නොවන කරුණු පවසමින් සිටි හෙයින්ද, ඔහුගේ වැකි අහංකාරකමින් පිළි නොගෙන සිටි බැවින්ද අද දින ඔබලාට නින්දිත වේදනාවන් කුලිය වශයෙන් ලබා දෙනු ලබන්නේය' යනුවෙන් පවසති. (අල්කුර්ආන්-6:93)*

*(ෆිර්අවුන්ගේ කල්ලිය) උදේ හා සවස අපායෙහි ගින්න ඉදිරියට ගෙනෙනු ලැබේ. තවද, විනිශ්චය කරන අවසාන දිනයේ 'ෆිර්අවුන්ගේ කල්ලිය උග්‍ර දඬුවමට ලක් කරන්න' යනුවෙන් පවසනු ලැබේ. (අල්කුර්ආන්-40:46)*

සෙයිද් බින් තාබිත් (රලි) තුමා නබිනායක තුමාගේ වද නක් මෙසේ වාර්තා කරන්නේය.

'ඔබලා මළවුන් භූමිදානය නොකරමින් සිටින්නෙහිදෝ යන බිය මට නොවන්නේම්, මිනීවළෙහි වේදනාව මා සවන් දෙන සේ ඔබලාටද එය සවන් දෙන්නට සලස්වන මෙන් අල්ලාහ්ගෙන් මා ප්‍රාර්ථනාකර ඇත්තෙමි' යනුවෙන් පැවසූ නබි නායක මුහම්මදු (සල්) තුමා පසුව, අපහට මුහුණලා 'ඔබලා අපායේ වේදනාවන් කෙරෙහි අල්ලාහ්ගෙන් රැකවර ණය පතන්න' යනුවෙන් කීය. එකල (සහාබාවරුන්) 'අපි

අපායේ වේදනා කෙරෙහි අල්ලාහ්ගෙන් රැකවරණය පතන්නෙමු' යනුවෙන් කීහ. පසුව නබිතුමා 'ඔබලා මිනීවළ වේදනාවන් කෙරෙහි අල්ලාහ්ගෙන් රැකවරණය පතන්න' යනුවෙන් පැවැසීය. එයට ඔවුන් 'අපි මිනීවළ වේදනා කෙරෙහි අල්ලාහ්ගෙන් රැකවරණය පතන්නෙමු' යනුවෙන් කීහ. පසු නබිතුමා 'ඔබලා ප්‍රසිද්ධ හා රහස් ගත සියළුම කරදරයන් ගැන අල්ලාහ්ගෙන් රැකවරණය පතන්න' යනුවෙන් පැවැසීය. එසේම ඔවුහුද 'අපි ප්‍රසිද්ධ හා රහස්ගත සියළුම කරදරයන් කෙරෙහි අල්ලාහ්ගෙන් රැක වරණය පතන්නෙමු යනුවෙන් පැවැසූහ. පසුව නබිතුමා 'දජ්ජාල්ගේ උවදුරුවන් කෙරෙහි අල්ලාහ්ගෙන් රැකවරණය පතන්න' යනුවෙන් පැවැසීය. ඔවුහු 'අපි දජ්ජාල්ගේ උවදුරුවන් කෙරෙහි අල්ලාහ්ගෙන් රැකවරණය පතන්නෙමු' යනුවෙන් කීහ. (මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)

මිනීවළෙහි ලැබෙන සතුට හා භාග්‍ය, සත්‍ය භාවයෙන් සිය ජීවිතය ගත කළ විශ්වාස වන්තයින්ට පමණකි. මේ පිළිබඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

*නියත වශයෙන්ම, කවරෙකු තම ස්වාමියා අල්ලාහ් බව පවසා (එහි) ස්ථිරව රැඳී සිටින්නේද, දේව දූතවරුන් ඔවුන් වෙත පැමිණ සිට, 'ඔබලා බිය නොවන්න, ඔබලා කණගාටු නොවන්න, ඔබලාට පොරොන්දුවූ ස්වර්ගය පිළිබඳ සුභාරංචිය ගැන ප්‍රීති වන්න. අපි මෙලෝ ජීවිතයෙහි හා පරලොවෙහි ඔබලාට උපකාර කරමින් සිටිමු. (අල්කුර්ආන්-41:30)*

*මරණාසන්නවූ කෙනෙකුගේ ප්‍රාණය උගුරු දණ්ඩට පැමිණවිට (මහා මරනාසන්න වේදනාවෙහි පසුවීම) ඔබලා බලා*

*සිටිති. නමුත්, ඔබලාට වඩා අපි ඔහුට සමීපව සිටින්නෙමු. එහෙත්, එය ඔබලා නොදනිති. ඔබලා (කවරෙකුගේ) බල යටද කීකරු නොවී සිටියේම්, ඔබලා සත්‍ය වන්තයින්නම්, ඔහුගේ ප්‍රාණය) ඔබලා ඔහුට නැවත ලබාදීමට තිබුනානේ? එහෙයින්, ඔහු අල්ලාහ්ට ඉතාමත් සමීපවූ කෙනෙකු නම්, ඔහුට සැප, සුවඳ පානයන් හා භාග්‍ය පිරි ස්වර්ගය ලැබේ. (අල්කුර්ආන්-56:83-89)*

නබි නායක මුහම්මදු (සල්) තුමා විශ්වාස වන්තයෙකු පිළිබඳව කළ ප්‍රකාශයක් බර්රාඋ බින් ආසිබ් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

මිනීවළෙහි විශ්වාස වන්තයා මලක් වරුන් දෙදෙනාගේ ප්‍රශ්නවලට පිළිතුරු සපයන අවස්ථාවේ, අහසින් සිට (අල් ලාහ් වෙනුවෙන්) කැඳවන්නෙක් 'මාගේ වහළා සත්‍යයම පැවසීය. එනිසා, ඔහුට ස්වර්ගයේ ඇතිරිල්ලක් දිගුකරන්න. ස්වර්ගයෙහි ඇඳුම් ඔහුට අන්දවන්න. ස්වර්ගයෙහි පිවිසීම සඳහා ඔහුට දොරටුවක් විවෘත කරන්න.' යනුවෙන් ශබ්ද නගයි. එවිට (මළමිනියවූ) ඔහු සුවඳය හා සුගන්ධය සහිතව පැමිණේ. ඔහුගේ මිනීවළය ඇසට පෙනෙන ප්‍රමාණයට විශාල කෙරේ. (අහ්මද් හා අබූදාවූද් ග්‍රන්ථ ඇසුරෙනි)

## අවසාන දිනය විශ්වාස කිරීමෙහි පවතින විශිෂ්ඨ ප්‍රයෝජනයන්

1-අවසාන දිනයෙ ලැබෙන ත්‍යාගයන් අපේක්ෂාකොට අල්ලාහ්ට කීකරුවී කුසල් ක්‍රියාවන්හි යෙදීමට උනන්දුව හා ආශාව දැක්වීම.

2-එදින පමුණුවන දඬුවමෙන් වැළකීම අපේක්ෂා කොට පාපයන්හි යෙදීමට බියවීම හා මැලිවීම.

3-විශ්වාසියෙකු අවසාන දින ලැබෙන සතුට හා භාග්‍ය අපේක්ෂා කොට මෙලොවෙහි තමාට නොලැබී අතපසුවූ දේ ගැන සෑහීමට පත්වීම.

මරණයෙන් පසු නැවත පණ පොවා නැගිටට වීම ගැන කාෆිර් වරුන් ප්‍රතික්ෂේප කරන අතර, මෙය අසාධ්‍ය කරුණක් බවද පවසති. මෙවන් තර්ක වැරදි සහගතවන අතර, වලංගු නැති කරුණක් බව ආගම, හැඟීම් හා බුද්ධිය තහවුරු කරයි.

## ආගමික සාධක

අල්ලාහ් මෙසේ පවසන්නේය.

*මළවුන් නැවත පණ පොවා නැගිට්ටවනු නොලබන බව ප්‍රතික්ෂේප කරන්නන් තර්ක කරති. (මවුන්ට පවසන්න) එසේ නොවේ, මාගේ ස්වාමියා මත මා දිවුරා කියමි. ඔබලා නිසැකයෙන්ම, නැගිට්ටවනු ලබන්නෝය. පසුව (ලොවෙහි) ඔබලා කළ දේ කෙරෙහි ඔබලා දැනුම් දෙනු ලබන්නෝය. මෙසේ කිරීම අල්ලාහ්ට ඉතාමත් පහසුදායික කාර්යයකි. (අල්කුර්ආන්-64:7)*

අල්ලාහ්ගෙන් අහළවූ සියළුම ධර්ම ග්‍රන්ථයන්ම මෙම මතයට එකඟ පවතී.

## හැඟීම්මය සාධක

මළවුවන්ට නැවත පණ පොවීම ගැන අල්ලාහ් මෙලොවෙහිම තම වහලුන්ට පෙන්වා දී ඇත. සූරා අල්බකරා නම් අල්කුර්ආන් පරිච්ඡේදයෙහි මෙයට උදාහරණ පහක් ඇත. ඒවා මෙසේය.

## පළමුවැනි උදාහරණය :

නබි මූසා (අලෛ) තුමාගෙන් එතුමාගේ ජනතාව 'අල්ලාහ්ව ප්‍රත්‍යක්ෂව දකිනතුරු අපි ඔබව විශ්වාස නොකරන්නෙමු' යනුවෙන් පැවසූවිට අල්ලාහ් ඔවුන් මරණයට පත් කළ පසු, ඔවුන්ට නැවත පණ පෙවීය. ඊශ්‍රායල ජනතාව අමතා අල්ලාහ් මෙසේ පවසන්නේය.

*'මූසා (තුමනි) අපි අල්ලාහ්ව ප්‍රත්‍යක්ෂ ලෙස දකින තුරු ඔබ(ගේ උපදෙස්) පිළිබඳව කිසි විටක විශ්වාස නොකරන්නෙමු' යනුවෙන් ඔබලා පැවසීම ගැන සිහිකර බලන්න. ඔබලා බලා සිටින කළම ඔබලාට මහා හෙනක් වැදුණේය. එහාම ඔබලා මරණයට පත්වූහ. පසුවද ඔබලා (අපට) තුති පුද කිරීම පිණිස ඔබලාට යලි අපි ප්‍රාණය ලබා දුන්නෙමු. (අල්කුර්ආන් - 2:55 - 56)*

## දෙවැනි උදාහරණය :

මෙය ඝාතනයට ලක්වූ පුද්ගලයෙකු පිළිබඳ කථාවකි. ඊශ්‍රායල් ජනතාව මේ පිළිබඳ තර්ක විතර්කයෙහි යෙදී සිටි අවස්ථාවේ අල්ලාහ් 'තමාව ඝාතනය කළේ කවරෙකු දැයි ඔහු දැනුම්දීම වස් ගවයෙකු කපා එකී කොටසකින් ඔහුගේ දේහයට පහර දෙන මෙන් ඔවුන්ට අණ කළේය. මෙය ගැන අල්ලාහ් මෙසේ පවසන්නේය.

*ඔබලා කෙනෙකුව ඝාතනය කොට, එකී වගකීම පරස්පරව එකිනෙකා මත පැවැරීමට තර්ක කරමින් සිටි අවස්ථාව සිහිකර බලන්න. ඔබලා සැඟවූ දේ හෙළිදරව් කිරීමට අල්ලාහ් තීරණය කළේය. '(කපනලද) එම ගවයාගේ කොට*

*සක් ගෙන (එමගින්) එය (මළ සිරුර) මත පහර දෙන්න' යනුවෙන් අපි අණ කෙළෙමු. (බලන්න) අල්ලාහ් එසේමයි මළවුවන්ට නැවත පණ පොවන්නේ. තවද ඔබලා නුවණැති යන් වනු පිණිස තම සාධකයන් ඔහු පෙන්වන්නේය. (අල් කුර්ආන්-2:72-73)*

## තෙවැනි උදාහරණය :

මෙය මරණයට බියෙන් තම නිවෙස් අත හැර දමා පලා ගිය දහස් ගණනක ජනතාවගේ කථාවකි. අල්ලාහ් ඔවුන් මරණයට පත්කර, පසුව නැවත ඔවුන්ට ප්‍රාණය ලබා දුන් නේය. මේ පිළිබඳව අල්ලාහ් පවසන්නේ මෙසේය.

*මරණයට බියවී තමතමන්ගේ නිවෙස් අතහැර දමා පලා ගිය දහස් ගණන් අය පිළිබඳව (නබිතුමනි) ඔබ නොදන් නෙහිද ? ඔවුන්ට අල්ලාහ් 'ඔබලා නැසී යන්න' යනුවෙන් පැවැසීය. පසුව (අල්ලාහ්) ඔවුන්ට ප්‍රාණය ලබා දුන්නේය. නිසැකයෙන්ම, අල්ලාහ් මිනිසුන් කෙරෙහි කරුණාව පහළ කරන්නා ලෙස සිටින්නේය. එනමුත්, මිනිසුන්ගෙන් අධික පිරිස් කළ ගුණ නොසළකා සිටිති. (අල්කුර්ආන්-2:243)*

## සිව්වැනි උදාහරණය :

මෙය විනාශවූ එක් ගම්මානයක් පසුකර ගමන් කළ කෙනෙකුගේ කථාවකි. මෙසේ විනාශවූ ගම්මානයක් අල් ලාහ් කෙසේ පුනර්ජීවනය කරන්නේ දැයි ඔහු සිතුවේය. මේ අවස්ථාවේ අල්ලාහ් ඔහු මරණයට පත් කොට එසේම ශත වර්ෂක කාලයක් ගතකළ පසු ඔහුට අල්ලාහ් නැවත පණ පොවා නැගිට්ටුවේය. අල්ලාහ් මෙසේ පවසන්නේය.

*නොඑසේනම් මුදුන කඩා වැටුනු එක් ගම්මානයක් පසු කර ගමන් කළ පුද්ගලයෙකු ඔබ නොදුටුවෙද ? ඔහු 'සහ මුලින්ම විනාශවූ මෙම ගම්වාසීන් අල්ලාහ් කෙසේ නැවත පණ පොවා නැගිටට වන්නේද ?' යනුවෙන් විමසීය.*

*එයට අල්ලාහ් 'ඔහුගේ ප්‍රාණය අත්පත් කොට, වසර සීය යක් ඔහුව එලෙසම පත් කළේය. පසුව, ඔහුට නැවත පණ පොවා 'ඔබ මෙලෙස කොපමණ කාලයක් සිටියේද ?' යනු වෙන් අල්ලාහ් විමසීය. එයට ඔහු 'එක් දිනක් හෝ එයින් කොටසක් මෙසේ සිටියෙමි' යනුවෙන් කීය.*

*පසුව, අල්ලාහ් 'එසේනොව, ඔබ මෙම ස්ථාවරයේ වසර සීයයක් ගත කළේය. ඔබගේ ආහාර හා පානයන් කරා බලන්න. එහි (ස්වල්ප වශයෙන් හෝ) වෙනසක් නොවීය. ඔබේ බූරුවා දෙසට බලන්න. (එකී කටු පවා විනාශ වීය.) ඔබව මිනිසුන්හට සාධකයක් ලෙසට පෙන්වීම සඳහා අපි (මෙසේ) කෙළෙමු. ඔබගේ (බූරුවාගේ) ඇට කටු දෙසට බලන්න. එම ඇට කටු (සියල්ල) අපි කෙසේ (ඇට සැකිල් ලක් ලෙස) පිළිවෙලකට සකස්කොට, පසු මාංශයෙන් එය පොරවන්නේ දැයි බලන්න. ඔහුට සත්‍ය පැහැදිළිවූ කල්හි 'සැබැවින්ම, අල්ලාහ් සැමදේ කෙරෙහි බල සම්පන්නා බව මා දැන ගත්තෙමි' යනුවෙන් පැවසීය. (අල්කුර්ආන්-2:259)*

## පස්වැනි උදාහරණය :

මෙය අල්ලාහ්ගේ හිත මිත්‍රයාවූ නබි ඉබ්රාහීම් (අලෛ) තුමාගේ කථාවකි. එතුමා 'මළවුවන් නැවත පණ පොවා නැගිට්ටවන්නේ කෙසේද?' යනුවෙන් අල්ලාහ්ගෙන් විමසීය.

එයට අල්ලාහ් පක්ෂීන් සිව් දෙනෙක් මරන ලෙසත්, ඒවා කැබැලි කොට ඔහුගේ යාබදව පිහිටා ඇති කඳු මත තබන ලෙසත්, පසුව ඒවා කැඳවන්නා ලෙසත් අණ කෙළේය. එම මාංශ කැබැලීන් එකිනෙකට එකතුවී නැවත පක්ෂීන් ලෙස ඉබ්රාහීම් (අලෛ) තුමා කරා පියඹා එන බවද ඔහු පැවැසීය. මේ ගැන අල්ලාහ් මෙසේ පවසන්නේය.

*'මගේ දෙවියනි, ඔබ මළවුවන් නැවත නැගිට්ට වන්නේ කෙසේ දැයි මාහට පෙන්වන්න' යනුවෙන් ඉබ්රාහීම් කීය. (එය කෙරෙහි ඔබ සිහිකරන්න) එයට අල්ලාහ් '(එය) ඔබ විශ්වාස නොකරන්නෙහිද ?' යනුවෙන් විමසීය. එසේමයි, (මා විශ්වාස කර ඇත්තෙමි) නමුත්, මගේ සිත්සතන සැන සුම්වීම සඳහා මෙලෙස විමසීමි' යනුවෙන් කීවේය. (එයට) අල්ලාහ් 'එසේනම්, ඔබ පක්ෂීන් සිව් දෙනෙක් ගෙන ඔවුන් කැබැලි කොට ඒවා කොටස් වශයෙන් සැම කඳුන් මතම තබන්න. පසුව ඔබ ඒවා අමතා කැඳවන්න. (එවිගස) ඒවා ඔබ වෙත වේගයෙන් පැමිණෙති' යනුවෙන් පැවැසීය. දැන ගන්න. නිසැකයෙන්ම, අල්ලාහ් සූක්ෂ්ම වන්තයා හා සර්ව බල සම්පන්නාය. (අල්කුර්ආන් -2:260)*

මේවා සියල්ල මළවුවන් නැවත පණ පොවා නැගිට්ටවීම සාධ්‍ය බව වටහා දෙන සැබැවින්ම සිදුවූ හැඟීම්මය උදාහරණයන්ය. අල්ලාහ්ගේ අනුමැතිය මත මළවුන්ට නැවත පණ පොවීම හා ඔවුන් මිනීවළෙන් පිටමන් කිරීම කෙරෙහි අල්ලාහ් රසූ නබි තුමාට ලබා දෙන ලද සාධකයන් ගැන පෙර සඳහන්කර ඇත.

## බුද්ධිමය සාධක

1-නිසැකයෙන්ම, අහස්, පොළොව හා ඒවාහි ඇති සෑම නිර්මානයන්හි ආරම්භක නිර්මාතෘවරයා අල්ලාහ්ය. එසේ ආරම්භයෙන් සියළුම දෙය නිර්මානය කළ අල්ලාහ්ට ඒවා නැවත නිර්මානය කිරීමටද ශක්ති වන්තයාය. මේ පිළිබඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

*නිර්මානයන් ප්‍රථමයෙන් (ආදර්ශයකින් තොරව) නිර්මානය කළේ මහුමයවේ. (නැසීගිය) පසුව නැවත නිර්මානය කරන්නේද මහුමයවේ. මහුට එය ඉතාම පහසු කරුණකි. (අල්කුර්ආන්-30:27)*

*අපි ප්‍රථමයෙන් නිර්මාණය කිරීම ඇරඹුවාක් මෙන් නැවතද එසේ අපි නිර්මානය කරන්නෙමු. එය අපේ පොරොන්දුවෙකි. නිසැකයෙන්ම, අපි (එය සැබැට) ඉටු කරන්නෙමු. (අල්කුර්ආන්-21:104)*

දිරාපත්වූ ඇටකටුවලට නැවත පණ පොවීම ගැන ප්‍රතික්ෂේප කරන පිරිසට පිළිතුරක් වශයෙන් අල්ලාහ් මෙලෙස අණකර පවසන්නේය.

*(නබිතුමනී,) මබ පවසන්න. කවරෙකු ඒවා ප්‍රථමයෙන් නිර්මානය කළේද, මහුම ඒවාට නැවත පණ පොවා සජීවී කරයි. තවද, මහු සෑම නිර්මානයන් කෙරෙහි ඉතා ඥාන වන්තයාය. (අල්කුර්ආන්-36:79)*

2-මෙම මහ පොලෝ තලය කිසියම් ගසක් කොලයක් නොමැති වියලී ස්ථාවරයෙන් පවතින. පසුව වර්ෂාව වැසීමෙන් අනතුරුව එය ප්‍රාණවත්වී එහි විවිධ වර්ග කොළ

පැහැති පැලෑටීන් පැළ වන්නට විය. අජීවී ලෙසට පත්වූ පොළොව මෙසේ සජීවී කිරීමට ශක්ති වන්ත අල්ලාහ් මළ වුන්ට නැවත පණපොවා සජීවී කිරීමටද ශක්ති වන්තයාය. අල්ලාහ් මෙම කරුණ පිළිබඳව මෙසේ පවසන්නේය.

*(නබිතුමනි,) පොළොව වියළී තිබීමද, අපි ඒ මත වැහි ජලය පහළ කළ විගස එය සශ්‍රිකවීමද සරුවීමද ඔබ දකී. මෙය ඔහු (අල්ලාහ්)ගේ සාධකයන් අතර එකකි. නිසැක යෙන්ම, කවරෙකු (වියළී) මැරුණු මෙම පොළොව සජීවී කළේද, ඔහු මළවු (මිනිසු)න්ද (පරලොව දින නැවත) පණ පොවා සජීවී කරන්නා ලෙසට සිටී. නියත වශයෙන්ම, ඔහු සැම දේ කෙරෙහි බල සම්පන්නාය. (අල්කුර්ආන්-41:39)*

*අපි අහසේ සිට ප්‍රයෝජනමත් වැහිජලය පහළ කළෙමු. එමගින් මිනිසුන්ට ජීවනෝපාය සඳහා ජලයද, අස්වැන්නට අදාල ධාන්‍යද, අඩුක්කළ සේ පවතින ඉඳුනු ගෙඩි සහිත දිගට වැවී ඇති ඉඳි ගස්ද වවන්නෙමු. තවද, එමගින් වියළී පවතී ගම්මානය (පොළොව)ට පණ පොවන්නෙමු. (මළවුන් පොළොවෙන්) පිටත්වීමද මෙසේය. (අල්කුර්ආන්-50:9-11)*

මිනීවළෙහි පවතින සතුට හා කරදරය කෙරෙහි ප්‍රතික්ෂේප කරන කෙටි නුවණැති සමහර පිරිස් නොමග ගියහ. ඔවුහු මෙය සාමාන්‍ය පැවැත්මට නොඔබින බැවින් අසාධ්‍ය කරුණක් බවට තර්ක කරති. ඔවුන් 'අපි මිණිවළ නැවත හාරා බලනවිට එය එසේම පවතින බවද, මනීවළෙහි විශාල වීම හෝ කුඩාවීම යනාදී කිසිදු වෙනසක් හෝ සිදු නොවන බවටද' පවසති. මෙම තර්කය ආගම, හැඟීම, බුද්ධිය යනාදීන් අනුව වැරදි සහගත කරුණකි.

## ආගමික සාධක

මිනීවළෙහි සැප හා වේදනා පවතින බව සනාථ කරන අල්කුර්ආනය හා සුන්නා සංකල්පයේ සාධකයන් පිළිබඳව අවසාන දිනය කෙරෙහි විශ්වාස කිරීම පිළිබඳ කොටසෙහි පැහැදිළිකර ඇත.

ඉබ්නු අබ්බාස් (රලි) තුමා මෙයට අදාලවූ නබි වදනක් මෙසේ වාර්තා කරන්නේය.

නබිනායක මුහම්මදු (සල්) තුමා මදීනාවෙ එක් වත්තක සිට පිටත්වීය. එවිට එතුමා තමතමන්ගේ මිනීවළෙහි වේදනා කෙරෙන මිනිසුන් දෙන්නෙකුගේ ශබ්දයක් ඇසීය... පසුව එතුමා 'ඔවුන් අතර කෙනෙකු මූත්‍රා පහකිරීමෙන් ප්‍රවේශම් නොවී සිටියාය. අනෙකු කේළාම් කියමින් ඇවිදගෙන සිටි යාය' යනුවෙන් පැවැසීය. (බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)

## හැඟීම්මය සාධක

නින්දේ පසුවන පුද්ගලයා ලස්සන විශාලවත් ස්ථානයක සතුටින් ගතකරන බව හෝ තදබද සහිත පිළිකුල් ස්ථාන යක වේදනාවෙන් පසුවන බව හෝ සිහිනයක් දකී. සමහ රවිට ඔහු තමා සිහිනයේ දුටු දර්ශනයෙන් හදිසියේම අවදි වේ. නමුත්, ඔහුද තම කාමරයේ සිය යහනයෙහි සාමාන්‍ය යෙන් සිටී. නින්දය එක්තරා මරණයක්වන බැවින්, අල්ලාහ් එය වෆාත් (මරණය) යනුවෙන් සඳහන් කරමින් මෙලෙස පවසන්නේය.

*මිනිසුන් මරණයට පත්වන කල්හි ඔවුන්ගේ ආත්මයන්ද, මරණයට පත් නොවන අයගේ ආත්මයන් ඔවුන් නින්දෙහි*

*පසුවන කල්හිද අල්ලාහ් අත්පත්කර ගන්නේය. පසුව මහු මරණය නියමවූ අයගේ ආත්මයන් (තමා වෙත) රඳවාගෙන, වෙනත් (ඉතිරි) අයගේ ආත්මයන් සීමිත කාලයක් (ජීවත් වීම) සඳහා අතහැර යවන්නේය. (අල්කුර්ආන්-39:42)*

## බුද්ධිමය සාධක

නින්දෙහි පසුවන පුද්ගලයෙක් සැබෑ තත්වයට ඔබ්බෙන සිහිනයක් දකී. සමහරවිට මහු නබිනායක මුහම්මදු (සල්) තුමාව එතුමාගේ සැබෑ ස්වරූපයෙන් දකී. එසේ එතුමාව සිහිනයෙහි දකින්නා සත්‍ය වශයෙන්ම එතුමාව දුටුවේය. නමුදු, නිදාගෙන සිටින්නා දුටු සිහිනයෙහි දර්ශනය ඉතා ඈතින් පවතින අතර, මහු තම කාමරයේ සිය යහනයෙහි සිටී. මෙලෝ ස්වභාවයෙහි මෙය සිදුවිය හැකි සාධ්‍ය කරුණක් වන්නේනම්, පරලෝ ස්වභාවයෙහි මෙය සිදුවිය හැකි කරුණක් නොවන්නේද ?

මිනීවළෙහි සතුට හෝ වේදනාව නොවන බවට තර්ක කරන්නන් 'මිනීවළ නැවත හාරා බලනවිට එම මිනිය පෙර පවතී ආකාරයටම පවතින අතර, එහි විශාලවීම හෝ කුඩා වීම යනාදී කිසියම් වෙනසක් හෝ සිදු නොවන්නේය' යන තර්කය මවුන්ගේ සාධකයක් ලෙස පවසති. මෙම තර්කයට අදාල විවිධ පිළිතුරු අතර සමහරයන් මෙසේය.

1-මෙවන් දුබල හා සැක සහිත තර්ක ඉදිරිපත් කරමින් ආගම වටහා දෙන කරුණු ප්‍රතික්ෂේප කිරීමට නොහැක. මෙසේ ප්‍රතික්ෂේප කරන්නන් ආගම වටහා දෙන කරුණු ගැන හරියාකාරව කල්පනා කළේනම්, මෙම සැකය වැරදි සහගත බව දැන ගනිති.

එක් කවියක 'සමහරුන් සත්‍ය ප්‍රකාශය පවා වැරදි සහ ගත බවට පවසන්නේ, ඔවුන් ඒවා වැරදි සහගතව වටහා ගත් හේතුවනි' යනුවෙන් කියවේ.

2–බර්සඛ් යනු, මරණයෙන් පසු සිදුවන සෑම දේ හැඟීමෙන් වටහා ගත නොහැකි සැඟවුනු කරුණුය. එසේ ඒවා ඉන්ද්‍රිය ශක්තියෙන් වටහාගත හැකිවන්නේනම්, සැඟවුනු කරුණු කෙරෙහි විශ්වාස කිරීම තේරුමක් නොමැති කරුණක් ලෙසට පත්වේ. එපමණක් නොව, සැඟවුනු කරුණු කෙරෙහි විශ්වාස කරන අයද එය ප්‍රතික්ෂේප කරන අයද එක හා සමාන තත්වයට පත්වෙති.

3–මිනීවළෙහි සතුට, වේදනාව, විශාලවීම හා අවහිරවීම යන සියල්ල අනුභව කරන්නේ මරණයට පත්වූ තැනැත්තා හැර වෙනත් කිසිවෙකු නොවේ. මෙය නින්දෙහි පසුවන්නා සිතට පිළිකුල හඟවන අර්බුදකාරී ස්ථානයක සිටින බවට හෝ සෞන්දර්යමත් විශාල තැනක සිටින බව හෝ සිහින දැකීම සේය. එනමුත්, මේ ගැන ඔහු අසල සිටින්නාගෙන් විමසූවිට, ඔවුහු 'ඔහු තම කාමරයේ සිය යහනයේ පොරවාගෙන නින්දෙහි පසුවන්නේය' යනුවෙන් පවසති.

නබිනායක මුහම්මද් (සල්) තුමා තම සහාබා නම් මිත්‍රයන් සමග සිටිනවිට එතුමාට වහි (දේව හෙළිදරව්ව) පහළ වේ. එය එතුමාහට පමණක් ඇසුනු නමුත්, එතුමාගේ මිත්‍රයන්ට එය නොඇසුනි. සමහර අවස්ථාවන්හි වහි ගෙනෙන ජිබ්රීල් තුමා මිනිස් රූපයෙන් පැමිණ නබිතුමා සමග කතාබහක යෙදෙන්නේය. නමුත්, සහාබාවරුන්ට එතුමා දිටීමට හෝ එම කතාබහට සවන්දීමට හෝ නොහැකිවේ.

4-අල්ලාහ් තම ඥානයෙන් කුමණ ප්‍රමාණයක් මිනිසුන් හට ලබාදී ඇත්තේද, ඔවුන්ගේ දැනුම් ඥානය එවන් සීමිත ප්‍රමාණයකි. ඔවුන්ට ලොවේ ඇති සෑම දෙයක් ගැනද දැන ගැනීමට නොහැක. සප්ත අහස්, පොලොව හා ඒවාහි ඇති සෑම දෙයක්ම අල්ලාහ්ගේ කීර්ති නාමය යථාර්ථ භාවයෙන් ප්‍රසංසා කර සිටින්නේය. සමහරවිට අල්ලාහ් තමා කැමැති මිනිසුන්ට (පමණක්) මේවා සවන් දෙන්නට සලස්වන අතර, ඔහු අපි නොදිටින ආකාරයට සැඟවී සිටින්නේය. මේ ගැන අල්ලාහ් මෙසේ පවසන්නේය.

*සප්ත අහස්, පොලොව සහ ඒහි ඇති සියළුම දේ ඔහු කෙරෙහි සුවිශුද්ධව ප්‍රශංසා කරමින් සිටිති. ඔහුට පැසසුම් කර, සුවිශුද්ධ නොකරන කිසියම් දෙයක් හෝ නොමැත. එනමුත්, ඔවුන් කරන ප්‍රශංසාවන් ගැන ඔබලා වටහා ගත නොහැක. (අල්කුර්ආන්-17:44)*

මෙසේම ෂෙයිතාන් වරුන් හා ජින්වරුන් පොලොව මත එහා මෙහා ඇවිදගෙන සිටිති. ජින්වරුන් පිරිසක් අල්ලාහ් ගේ රසූල් වරයා වෙතට පැමිණියහ. එතුමා පාරායනා කළ කුර්ආනය දෙසට ඔවුහු නිශ්ශබ්දව සවන් දෙමින් සිටියහ. පසු ඔවුහු තම සමාජයන් කරා ගොස් ඔවුන්ට අනුශාසනා හා අවවාද කළෝය. ඔවුහු අප දර්ශනයට නොපෙනී සැඟවී සිටින්නන්ය. මේ ගැන අල්ලාහ් මෙසේ පවසන්නේය.

*ආදම්ගේ දරුවනි, ෂෙතාන් ඔබලාගේ දෙමාපියන් (වන ආදම් සහ හව්වා)ගේ රහස් ප්‍රදේශ ඔවුන් දෙදෙනාම පරස් පරව දැක ගනු පිණිස ඔවුන් දෙදෙනාගේ වස්ත්‍රයන් ඉවත් කොට ස්වර්ගයෙන් පිටමන් කළාක් මෙන්, ඔහු ඔබලාවද*

*කරදරයට ලක් නොකරනු. ඔබලා ඔහුව හා ඔහුගේ සඟයන් දිටීමට නොහැකි ආකාරයෙන් ඔවුන් ඔබලාව දකිති. සැබැවින්ම, අවිශ්වාස වන්තයින්ට මෙම සතාන්වරුන් මිත්‍රයින් බවට පත් කළෙමු. (අල්කුර්ආන්-7:27)*

මිනිසුන්ට සැම දේ කෙරෙහි දැනුම් ඥානයක් නොවන බැවින්, නිසැකයෙන්ම, ඔවුන්ට සැඟවුනු දේ බවට සනාථවූ කරුණු කිසිවක් ප්‍රතික්ෂේප කිරීමට නොහැක. මක්නිසාද යත්, ඔවුන් ඒවා ගැන නොදැනුවත්ව සිටිති.

# දෛවය ගැන විශ්වාස කිරීම

අල් කද්ර් (දෛවය) යනු මැවීම්වලට අල්ලාහ් නියමකර ඇති පූර්ව සැලැස්මක් බවට හැදින්වේ. සැම දේ කෙරෙහි පෙරාතුරුව දැන සිටින්නා අල්ලාහ්ගේ දැනුම් ඥානයට හා ඔහුගේ සූක්ෂ්ම භාවයට ඔබින පරිදි නියමකර ඇති පෙර සැලස්මකි.

## දෛවය පිළිබඳ විශ්වාසය කරුණු තුනක් මත පවතී.

1-නිශ්චය වශයෙන්ම, අල්ලාහ් සැම දෙයක් කෙරෙහිම පොදුවෙන් හා පුළුල් වශයෙන්ද, ඒවාහි මුල හා අගද දැන සිටින බව විශ්වාස කිරීම. ඒවා අල්ලාහ්ගේ හෝ ඔහුගේ මැවිල්ලයන්ගේ ක්‍රියාවන් හෝ වේවා විය හැක.

2-මෙම විස්තර සියල්ල ලව්හුල් මහ්ෆූල් නම් ආරක්ෂිත පුවරුවෙහි අල්ලාහ් සඳහන්කර ඇති බව විශ්වාස කිරීම. මෙම කරුණු දෙක පිලිබඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

*නියත වශයෙන්ම, අල්ලාහ් අහසෙහි හා පොලොවෙහි ඇති සෑම දේ කෙරෙහි දැන සිටින බව ඔබ නොදන්නේද? මේවා සියල්ල එක් පොතෙහි සටහන්කර ඇත. සැබැවින්ම, මෙය අල්ලාහ්ට ඉතා පහසු කරුණකි. (අල්කුර්ආන්-22:70)*

නබි මුහම්මදු (සල්) තුමාගෙන් තමා සවන්දුන් බව අබ්දුල්ලාහ් බින් අම්ර් බින් අල්ආස් (රලි) තුමා මෙලෙස වාර්තා කරන්නේය.

අහස් සහ පොලොව නිර්මානය කිරීමට වසර පනස් දහසකට පෙර අල්ලාහ් නිර්මානයන්හි පූර්ව සැලැස්ම (කද්ර්) තීරණය කළේය. (මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)

3-පවතින සිදුවීම් සියල්ල අල්ලාහ්ගේ නියමය අනුව සිදු වන බව විශ්වාස කිරීම. මේවා ඔහුගේ ක්‍රියාවන් සම්බන්ධ හෝ වෙවා ඔහුගේ නිර්මානයන්හි ක්‍රියාවන් සම්බන්ධ හෝ වෙවා විය හැක. අල්ලාහ් ඔහුගේ ක්‍රියාවන් හා සම්බන්ධව ගැන මෙසේ පවසන්නේය.

*ඔබේ ස්වාමියා ඔහුගේ මනාපය පරිදි නිර්මානය කරන්නේය. එසේම, තෝරා ගන්නේය. (අල්කුර්ආන්-28:68)*

*තවද, අල්ලාහ් තම මනාපය පරිදි කටයුතු කරන්නේය. (අල්කුර්ආන්-14:27)*

*(ඔබගේ මව්වරුන්ගේ) ගර්භාෂයෙහි සිය මනාපය පරිදි (විවිධ විලාශයෙන්) ඔබව හැඩ ගස්වන්නේ හෙතම ඔහුම (අල්ලාහ්)ය. (අල්කුර්ආන්-3:6)*

අල්ලාහ් තමාගේ නිර්මානයන්ගේ ක්‍රියාවන් සම්බන්ධව මෙසේ පවසන්නේය.

*අල්ලාහ් අදහස් කළේනම්, (එම වෙශධාරීන්ගේ) බලය ඔබ මත පමුණුවන්නට ඇති. මවුන්ද, ඔබට එරෙහිව සටන් කරන්නට ඇති. (අල්කුර්ආන්-4:90)*

*ඔබ ස්වාමියා අදහස් කළේනම්, ඔවුහු එසේ නොකරන් නට ඇති. එනිසා (නබිතුමනි) ඔබ මවුන්ද මවුන් ගොතන කරුණුද හැර දමන්න. (අල්කුර්ආන්-6:137)*

4-විශ්වයෙහි ඇති සියළුම දේ එනම්, එකී ස්වභාවයන්, ගුණාංගයන්, හා චලනයන් යනාදිය සියල්ල අල්ලාහ් විසින් නිර්මාණය කර ඇති බව විශ්වාස කිරීම. අල්ලාහ් මෙලෙස පවසන්නේය.

*අල්ලාහ් සියළුම දේ කෙරෙහි නිර්මාතෘ වරයාය. එසේම මහු සැම දේ ගැන වගකිව යුත්තාය. (අල්කුර්ආන්-39:62)*

*තවද, ඔහු සැම දෙයක්ම නිර්මානය කළේය. පසුව ඒවා සියල්ලටම දෛවය නියම කළේය. (අල්කුර්ආන්-25:2)*

නබි ඉබ්රාහීම් (අලෛ) තුමා තම ජනතාව අමතා මෙසේ පැවසූ බව අල්ලාහ් පවසන්නේය.

*ඔබලා නිර්මානය කළේ අල්ලාහ්ය. එසේම, ඔබලා සාදා ගත් දේද නිර්මානය කළේ අල්ලාහ්ය. (අල්කුර්ආන්-37:96)*

ඉහත සඳහන් පරිදි දෛවය ගැන විශ්වාස කිරීම, මිනිසාට ඔහුගේ ප්‍රිය මනාපය පරිදි ක්‍රියා කිරීමේ නිදහසට හා ඒවා කෙරෙහි හැකියාවට එරෙහිව නොපවතී. මන්ද යත්, ආගම හා යථාර්ථය මෙය තහවුරු කරන්නේය.

මිනිසාට ඔහුගේ ක්‍රියාවන් ගැන ප්‍රිය මනාපයක් ඇති බව අල්ලාහ් මෙසේ පවසන්නේය.

*එනිසා, කවරෙකු අදහස් කරන්නේද, ඔහු තම දෙවියා කරා යායුතු මග සොයා ගනු මැනවි. (අල්කුර්ආන්-78:39)*

*ඔබලාගේ ප්‍රිය මනාපය පරිදි ඔබලාගේ සරුබිම කරා යන්න. (අල්කුර්ආන්-2:223)*

මිනිසාගේ හැකියාව පිළිබඳව අල්ලාහ් මෙලෙස පවසන්නේය.

*එහෙයින්, ඔබලා හැකි පමණකින් අල්ලාහ් කෙරෙහි බියව සිටින්න. තවද, (ඔහුට) ශ්‍රවණය කරන්න. (එසේම) කීකරුවන්න. (අල්කුර්ආන්-64:16)*

*අල්ලාහ් කවරෙකුට හෝ ඔහුගේ ශක්තියට (වඩා අධික වගකීම් පවරමින්) ශ්‍රමයට ලක් නොකරයි. ඔහු උපයාගත් කුසල්හි පල (ත්‍යාග) ඔහුටය. ඔහු උපයාගත් අකුසල්හි පල (දඬුවම)ද ඔහුටය. (අල්කුර්ආන්-2:286)*

සියළුම මිනිසාම ඔහුට ප්‍රිය මනාපය හා හැකියාව ඇති බවද, ඔහු ක්‍රියාවන්හි යෙදීම හෝ නොයෙදීම පවතින්නේ ඒ දෙක මත බව දනී. ඇවිදීම වැනි තම මනාපය අනුව සිදුවන ක්‍රියාවන්හි හා වැවුලීම වැනි තමාගේ මනාපයෙන් තොරව සිදුවන ක්‍රියාවන්හි අතර පවතින වෙනසද ඔහු දනී. නමුදු, මිනිසාගේ මනාපය හා හැකියාවන් පවතින්නේ අල්ලාහ්ගේ මනාපය හා හැකියාව මත අනුවකි. මක්නිසාදයත්, අල්ලාහ් මෙසේ පවසන්නේය.

*(මෙම කුර්ආනය) ඔබලා අතර සෘජු මාර්ගයෙහි ගමන් කිරීමට කැමතිවන සෑම දෙනාටම අයත්ය. තවද, මෙම විශ්වයේ අධිපති අල්ලාහ්ගේ ප්‍රිය මනාපයෙන් හැර ඔබලාගේ*

*ප්‍රිය මනාපය අනුව (පමණක්) කිසියම් දෙයක් සිදු නොවන් නේය. (අල්කුර්ආන්-81:28-29)*

මුළු විශ්වයම අල්ලාහ්ට පමණක් හිමිවූ එකකි. එනිසා, එහි ඔහුගේ දැනුමෙන් හා ප්‍රිය මනාපයෙන් තොරව කිසි යම් දෙයක් හෝ නොපවතී.

ඉහත විස්තර කර ඇති පරිදි දෛවය කෙරෙහි විශ්වාස කිරීම, මිනිසාට අනිවාර්ය ක්‍රියාවක් අතපසු කිරීමට හෝ පාප ක්‍රියාවන්හි යෙදීමට හෝ සාධකයක් බවට නොපවතී. මේ අනුව මෙසේ දෛවය සාධකයක් ලෙස පෙන්වීම විවිධ ආකාරයෙන් වැරදි සහගත කරුණක් බව පෙනේ.

1-අල්ලාහ් මෙසේ පවසන්නේය.

*සමානකරුවන් 'අල්ලාහ් කැමැතිව සිටියේනම්, අපිද අප පියවරුන්ද (ඔහුට) ආදේශයක් නොකර ඇත්තෙමු. තවද, අපි කිසියම් (ආහාරයක්) හෝ හරාම් (තහනම්) නොකර ඇත්තෙමු' යනුවෙන් පවසති. ඔවුන්ට පෙර විසූ අයද අප වේදනාව භුක්ති විඳින තෙක් මෙසේම පවසා අසත්‍ය කර මින් සිටියහ. (එනිසා, ඔබ ඔවුන්ට) 'ඔබලා වෙත (ඔබලා ගේ මතයට අදාලවන) බුද්ධිමය සාධක කිසිවක් තිබේද ? එසේ තිබේනම්, ඒවා අප ඉදිරියට ප්‍රසිද්ධ කරන්න. ඔබලා (අර්ථයක් නොමැති නිශ්ඵල) සිතුවිල්ල හැර අන් කිසිවක් අනුගමනය නොකරන්නෝය. තවද, ඔබලා කාල්පනික අනු මානයෙන් තොරව ක්‍රියා නොකරන්නෝය' යනුවෙන් පව සන්න. (අල්කුර්ආන්-6:148)*

දෛවය මගින් (අකුසල් ක්‍රියාවන්හි යෙදීම සඳහා) සාධ

කයක් මවුන්ට ලැබේනම්, (ඒ වෙනුවෙන්) අල්ලාහ් මවුන්ට වේදනාව නොපමුණුවේ.

2-අල්ලාහ් මෙසේ පවසන්නේය.

*(විශ්වාස වන්තයින්ට ස්වර්ගය කෙරෙහි) සුභාශිංසනය කරන්නන් හා (අවිශ්වාස වන්තයින්ට අපාය ගැන) අවවාද කරන්නන් ලෙස අපි රසූල්වරුන් එවා ඇත්තෙමු. මක්නිසාදයත්, මෙම රසූල්වරුන් එවූ පසු අල්ලාහ් වෙත (නිදහසට කරුණු කීම සඳහා) මවුන්ට කිසියම් සාධක නොමැතිවීම සඳහාය. අල්ලාහ් සැම දේ කෙරෙහි සර්ව බල සම්පන්නා ලෙස හා ඥානවන්තයා ලෙස සිටී. (අල්කුර්ආන්-4:165)*

ප්‍රතික්ෂේප කරන්නන්ට දෛවය සාධකයක් ලෙස පවතියේනම්, රසූල්වරුන් එවීම මගින් එම සාධකය නොඉවත්ව පවතී. මක්නිසාදයත්, රසූල්වරුන් එවූ පසුද (අල්ලාහ්ගේ ආඥාවට) විරුද්ධකම් කිරීමේ තත්වය අල්ලාහ්ගේ දෛවය පරිදි සිදුවමින් පැවැතීය.

3-නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් අලි බින් අබී තාලිබ් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

'ඔබලාගේ කවරෙකුගේ හෝ ලැගුම් ස්ථානය ස්වර්ගයෙහි හෝ අපායෙහි බව සටහන් නොකර නොමැත' යනුවෙන් නබිනායක තුමා පැවැසූවිට එතුමාගේ ශ්‍රවකරුවෙකු 'අල්ලාහ්ගේ දූතයාණෙනි, මෙය හේතුකොට ගනිමින් අපි (දෛවයෙහි) රැඳී සිටිය හැකිද ?' යනුවෙන් විමසීය. එයට එතුමා 'එසේනොව, ඔබලා ක්‍රියාවෙහි (අඛණ්ඩව) යෙදෙමින් සිටින්න. (ඔබ වෙනුවෙන් මවන ලද ස්ථානය කරා යාමට

අවශ්‍ය) සෑම දේ ඔබට පහසුවෙන් පවතී. යනුවෙන් පවසා 'එබැවින්, කවරෙකු හෝ (අල්ලාහ්ගේ මාවතේ) දානයකර, (තම දෙවියා කෙරෙහි) බිය බැතිකමින් සිට, කුසල් කරුණු (කුසල් බව) සත්‍යය කළේද, මහුට අපි (ස්වර්ගයට යන) මාර්ගය පහසු කරන්නෙමු. එනමුත්, කවරෙකු ලෝභ කර මින්, (තම දෙවියාගෙන් තමා) උවමනා නොවන්නා ලෙසට සිතා, කුසල් කරුණු (අකුසල් බවට) අසත්‍ය කළේද, මහුට (අපායට යායුතු) දුෂ්කර මග අපි පහසු කරන්නෙමු. (අල් කුර්ආන්-92:5-10) යන වැකයන් පාරායනා කළේය. (බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)

මුස්ලිම් ග්‍රන්ථයේ 'සෑම දෙනාට මවුන් මවනලද අරමුණ කරා යාමට (අදාල) මාර්ගය පහසු කරනු ලැබේ' යනුවෙන් සඳහන්වී ඇත.

නබිනායක මුහම්මදු (සල්) තුමා කුසල් ක්‍රියාවල යෙදෙමින් සිටින ලෙස අණ කරන අතර, දෛවයෙහි රැඳී සිටීම වළක්වන්නේය.

4-අල්ලාහ් සමහර අනිවාර්ය කරුණු මිනිසුන්ට අණකර ඇත. වෙනත් සමහර කරුණු තහනම් කර ඇත. එසේම, මහු උසුලන්නට නොහැකි කිසිදු වගකීමක් හෝ මහු මත නොපටවන්නේය. අල්ලාහ් මෙසේ පවසන්නේය.

*එහෙයින් ඔබලාට හැකි ප්‍රමාණයෙන් අල්ලාහ් කෙරෙහි බිය(වී ජීවත්)වන්න (අල්කුර්ආන්-64:16)*

*අල්ලාහ් කිසියම් කෙනෙකුට හෝ උසුලන්නට නොහැකි වගකීමක් පටවන්නේ නැත. (අල්කුර්ආන්-2:286)*

මිනිසෙකු ක්‍රියාවන් කෙරෙහි බලකිරීමට ලක්ව සිටියේ නම්, ඔහු කළ නොහැකි ක්‍රියාවන් පටවනු ලැබ සිටින්නෙකු සේය. මෙය වැරදි සහගත කරුණකි. එසේනම්, ඔහු නොදැනුවත්ව හෝ අමතකවීමෙන් හෝ බල කිරීමෙන් හෝ පාප යක යෙදුනේනම්, ඔහු වැරදි කළ බව සළකනු නොලැබේ. මන්දයත්, ඔහු තිසි කාරණාවට අදාල කෙනෙකි.

5-අල්ලාහ්ගේ දෛවය සැඟවුනු රහසෙකි. තිගමනය කරනලද ඒවා සිදුවීමෙන් පසු හැර ඒ ගැන දැනගැනීමට නොහැක. මිනිසාගේ ක්‍රියාවට පෙර චේතනාව මුල් තැන ගනී. එහෙයින්, ඔහුගේ ක්‍රියාවෙහි චෙතනාව අල්ලාහ්ගේ දෛවය අනුව සිදුවන බවට වටහා දෙන ඔහුගේ දැනුම මත ගොඩනැගුනු එකක් නොවේ. එනිසා, මිනිසා දෛවය සාධක ලෙස පෙන්වීම ක්‍රියා විරහිත ලෙසට පත්වේ. මන්ද යත්, මිනිසාට ඔහු නොදැනුවත්ව සිටින කාර්යයන්හි කිසි යම් සාධකයක් හෝ නොමැත.

6-මිනිසා ලෞකික කරුණුවල තමාට ගැලපෙන (වාසිදා යික) දේ කෙරෙහි ආශාවී එකී අරමුණ කරා යාමට ඔහු පෙලෙඹීම අපි දකින්නෙමු. එය හැර ඔහුට නොගැලපෙන දේ කෙරෙහි ඔහු නොයන්නේය. පසු, එසේ නොයාමට ඔහු දෛවය සාධකයක් ලෙසට නොපවසයි. එසේනම්, ඔහු තම ආගමික කරුණුවල ඔහුට ප්‍රයෝජනය ගෙන දෙන දෙය ඉවතදමා, ඔහුට හානි සිදුකරන දේ තෝරා ගන්නේ ඇයි ?. පසුව, එයට ඔහු දෛවය සාධකවූ බවට තර්ක කරන්නේ ඇයි ?. මෙම අවස්ථාවන් දෙකම එක හා සමාන නොවන් නේද ?. මෙය පැහැදිලි කරන උදාහරණයක් මෙසේය.

කෙනෙකුට ඉදිරියේ මාර්ග දෙකක් පිහිටා ඇත. එයින් එකක් කිසිදු පිළිවෙලක් හෝ නොමැති, මිනීමැරුම් හා මං කොල්ලය රජ කරන, නම්බුවට හා ගරුත්වයට හානි සිදු කරන, බිය හා සාගතය පවතින ගමක් කරා යන මාර්ග යකි. අනිත් එක නීති ගරුක පිළිවෙලක් ඇති, සැනසුම් ආරක්ෂාවක් ලබාදෙන, රම්‍ය ජීවිතයක් ගතකළ හැකි, ජීවි යටද, නම්බුවටද, දේපලටද ගරුත්වයක් ලබා දෙන ගමක් කරා යන මගකි. මෙම මාර්ග දෙකෙන් ඔහු කුමණ මාර්ග යෙහි ගමන් කරන්නෙහිද ?.

නිසැකයෙන්ම, ඔහු ගමන් කරන්නේ ආරක්ෂා සහිත නීති ගරුක මාර්ගයෙනි. නීතිය හා යුක්තිය පරිහානියට ලක්වී බිය සුළුව පවතින මගෙන් ගමන්කර, එයට දෛවය සාධක ලෙස පෙන්වීමට දැනුම් ඥානයලද අයට කිසි විටක නොහැක.

එසේනම්, පරලොව පිළිබඳ කරුණුවල ස්වර්ගයට අදාල මාර්ගය අතහැර අපායට අයත් මාර්ගයේ මිනිසා ගමන්කර, පසුව දෛවය එයට සාධකයක් බව පවසන්නේද කෙසේද ? මෙය පැහැදිළි කරන උදාහරණයක් මෙසේය.

රෝගයට පත්වූ පුද්ගලයෙකුට බෙහෙත් බීම සඳහා අණ කෙරේ. ඔහුගේ සිත්සතන එය අප්‍රිය කළ නමුත්, ඔහු එය පානය කරයි. එසේම, ඔහුට අවහිර ඇති කරන ආහාරයන් ඔහුට තහනම් කෙරේ. ඔහුගේ සිත්සතන එය අධිකව ප්‍රිය කළ එනමුත්, ඔහු එයින් වැළකී සිටී. මේ සියල්ල ඔහු අනු ගමනය කරන්නේ ඔහුට නිරෝගී භාවය හා සතුට ලැබීම සඳහාය. ඔහු බෙහෙත් පානය නොකරමින් හා අවහිර ඇති

කරන ආහාරයන් අනුභවකර (එයින් රෝගය වර්ධනයවී) පසුව, ඒ සඳහා දෛවය සාධක ලෙස පෙන්වීමට නොහැක. එසේනම්, මිනිසා අල්ලාහ් හා ඔහුගේ රසූල්වරයා අණ කළ දේ ඉවතදමා හෝ අල්ලාහ් හා ඔහුගේ රසූල්වරයා තහනම් කළ දේ ක්‍රියා කර හෝ පසුව එයට දෛවය සාධක ලෙසට තර්ක කරන්නේ කෙසේද ?

7-ආගමෙන් අනිවාර්ය කළ කාර්යයන් ඉවත දැමීමටත්, පාපයෙහි නිරත වීමටත් දෛවය සාධකයක් ලෙසට තර්ක කරන පුද්ගලයෙකුට වෙනත් පුද්ගලයෙකු පහරදී ඔහුගේ ධනයට හෝ ගෞරවයට හානි සිදුකර එයට දෛවය සාධක ලෙස පෙන්වා 'මාගේ මෙම ක්‍රියාවට මාහට දොස් නොපවරන්න. මෙය අල්ලාහ්ගේ දෛවය අනුව සිදුවිය' යනුවෙන් පැවසුවෙනම් ඔහු එම තර්කය පිළිගනීද ? එය කිසිසේත් ඔහු පිළි නොගනී.

වෙනත් කෙනෙකු ඔහුට අක්‍රමතාවයක් කර, එයට ඔහු දෛවය සාධකයක් ලෙස පෙන්වනවිට, ඔහු පිළි නොගන්නේ ඇයි? නමුදු, ඔහු අල්ලාහ්ට අක්‍රමතාවයන් කර, පසුව එයට දෛවය සාධක ලෙස පෙන්වන්නේ කෙසේද ?

ඉස්ලාමීය අධිරාජ්‍යයේ විශ්වාසීන්ගේ දෙවැනි නායකයා වන උමර් බින් කත්තාබ් (රලි) තුමාගේ හමුවට අත සිඳීමට තරම් වරද්දක් කළ සොරෙකු ඉදිරිපත් කෙරින. එතුමාද ඔහුගේ අත සිඳන මෙන් අණ කළේය. එවිට ඔහු 'විශ්වාසීන් ගේ නායකතුමනී, මා සොරකම් කළේ අල්ලාහ්ගේ දෛවය අනුවනි' යනුවෙන් කීය. එයට එතුමා 'අපි ඔබ අත කපන්නේද අල්ලාහ්ගේ දෛවය අනුවය' යනුවෙන් පැවැසීය.

## දෛවය විශ්වාස කිරීමෙහි පවතින විශිෂ්ඨ ප්‍රයෝජනයන්

1-කිසියම් කාර්යයක් හෝ ඉටු කරනවිට එයට තුඩුදුන් කාරණය මත පමණක් රැඳී නොසිට අල්ලාහ් මත සම්පූර්ණයෙන්ම රැඳී සිටිය යුතුයි. කුමක්නිසාදයත්, සෑම දේ සිදුවන්නේ අල්ලාහ් නියම කළ දෛවය මත පමණි.

2-මිනිසා තම අරමුණක් ඉටුවන විට ඔහු ඒ ගැන අහංකාර නොකර සිටීම. මන්දයත්, නිසැකයෙන්ම, ඔහුගේ එම අරමුණ ඉටුවීම අල්ලාහ්ගේ භාග්‍යයකි. යහපත හා ජයග්‍රහණයෙහි හේතූන් නියම කළේද හෙතම ඔහුමය වේ. මේ ගැන ඔහු ආඩම්බර වීම අල්ලාහ්ගේ භාග්‍යයන් කෙරෙහි කලගුණ සැළකීමෙන් ඔහුව අමතක කරවන්නේය.

3-අල්ලාහ්ගේ පූර්ව සැලැස්ම මත කාර්යයන් සිදුවනවිට ඒ පිළිබඳව මිනිසා සිත්සතනින් ශාන්ත වීම හා සැනසීම. එහෙයින්, මිනිසා තමා කැමැති දෙයක් සිදු නොවීම ගැන හෝ අකැමැති දෙයක් සිදුවීම ගැන හෝ සිත් වෙදනා විය නොයුතුයි. මන්දයත්, එය අහස්හි හා පොළොවෙහි පාලන බලය හිමි අල්ලාහ්ගේ නියමය පරිදි සිදුවන්නකි. එය සත් සුදක්සේ සිදුවෙමින් පවතී. මේ පිළිබඳව අල්ලාහ් මෙලෙස පවසන්නේය.

*පොළොවේ සිදුවන හෝ ඔබලා මත පහළවන කිසියම් පීඩාවක් හෝ වේවා, ඒවා අපි සිදු කරන්නට පෙර ඒ බව (ලව්හුල් මහ්ෆූල්) නම්වූ පුස්තකයෙහි සටහන් නොකර නොමැත. එසේ කිරීම අල්ලාහ්ට පහසුවකි. (මේ සියල්ල) මක්නිසාදයත්, ඔබලාට (නොලැබූ) කිසිදු දෙයක් කෙරෙහි ඔබලා දුක්මුසු නොවීම සඳහා හා ඔබලාට අල්ලාහ් ලබා දී*

*ඇති කිසිදු දෙයක් කෙරෙහි ඔබලාගේ සිත පිනා නොයෑම සඳහාය. තමා ගැන බොරු පුරසාරම් දොඩවා ආඩම්බරවන කිසියම් කෙනෙකුට හෝ අල්ලාහ් ප්‍රිය නොකරන්නේය. (අල්කුර්ආන්-57:22:23)*

නබිනායක මුහම්මද් (සල්) තුමා මෙසේ පවසන්නේය.

විශ්වාස වන්තයකුගේ කාර්ය කෙතරම් විස්ම ජනකද ? කාර්යයන් සියල්ලම ඔහුට යහපතින්ම පවතී. ඔහුට සතුට ගෙන දෙන කාර්යයක් සිදුවුවද, ඔහු තුති පුද කරයි. එය ඔහුට යහපතක් ලෙසට පවතී. ඔහුට අසතුටක් ගෙනදෙන කාර්යයක් සිදුවුවද, ඔහු එය ඉවසා සිටී. එයද ඔහුට යහප තක් ලෙස පවතී. (මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)

## දෛවය කෙරෙහි නොමග ගිය දෙපිරිස්

මෙම දෙපිරිස් අතර අල් ජබ්රියියා යනු එක් පිරිසකි. ඔවුහු 'මිනිසා ක්‍රියාවන් කෙරෙහි බලපෑමකට ලක්ව සිටින නිසා ඔහුට ඒ කෙරෙහි ස්වයං සිතුවිල්ලක් හා හැකියාවක් නොමැත' යනුවෙන් පවසති. අල්කද්රියියා යනු අනෙක් පිරි සකි. ඔවුන් 'මිනිසා ක්‍රියාවන් කෙරෙහි සිතුවිල්ලෙන් සහ හැකියාවෙන් පූර්ණ නිදහස් වන්තයා හෙයින්, අල්ලාහ්ගේ තීරණයට හා හැකියාවට කිසියම් සම්බන්ධතාවයක් හෝ නොමැත' යනුවෙන් පවසති.

## ජබරියියා පිරිසට ආගම හා යථාර්ථයේ පිළිතුරු

### ආගම

නිශ්චය වශයෙන්ම, අල්ලාහ් මිනිසාට ස්වයං කල්පනා ශක්තියක් හා නිදහසේ ක්‍රියා කිරීමේ හැකියාවක් ලබා දී

ඒ සමග ඔහුට ක්‍රියාවන් සම්බන්ධ කළේය. මේ කෙරෙහි අල්ලාහ් මෙසේ පවසන්නේය.

*ඔබලා අතර මෙලොව කෙරෙහි කැමැතිවන අයද සිටිති. තවද, ඔබලා අතර පරලොව කෙරෙහි කැමැති වන අයද සිටිති. (අල්කුර්ආන්-3:152)*

*(නබිතුමනි) ඔබ පවසන්න. මෙය ඔබලාගේ දෙවියාගෙන් සිට පැමිණි සත්‍යයකි. එනිසා, කවරෙකු කැමැති වන්නේද, ඔහු විශ්වාස කරනු. එසේම, කවරෙකු කැමැති වන්නේද, ඔහු ප්‍රතික්ෂේප කරනු. සත්‍ය වශයෙන්ම, අපි (ප්‍රතික්ෂේප කරන) අපරාධකරුවන්ට ගින්නක් පිළියෙළකර ඇත්තෙමු. එහි ගිනි දැල්ල ඔවුන් වටකර වෙළා ගනී. (අල්කුර්ආන් -18:29)*

*කවරෙකු කුසල් ක්‍රියාවක් කරන්නේද, ඔහු ඔහුටම (යහ ඵලක්) කර(ග)න්නේය. තවද, කවරෙකු අකුසල් ක්‍රියාවක් කරන්නේද, එහි (අයහපතම) ඔහු මතම පවතී. තවද, ඔබගේ දෙවියා වහලුන්ට අපරාධ කරන්නෙකු නොමැත. (අල් කුර්ආන්-41:46)*

## යථාර්ථය

මිනිසා අහාර පානයන් අනුභව කිරීම, විකිණීම හා මුදල ට ගැනීම යනාදී ස්වයං කල්පනාවෙන් කරන ක්‍රියාවන් හා උණට ලක්වීමෙන් ඇතිවන වෙවුලීම, උඩු මහලෙන් සිට බිමට වැටීම යනාදි ස්වයං කල්පනාවෙන් තොරව සිදුවන ක්‍රියාවන් අතර පවතින වෙනස සැම මිනිසෙකුම දනී. පළමුවන අවස්ථාවෙහි ඔහු කිසිදු හෝ බල කිරීමකින් තොරව

ස්වෙච්ඡාවෙන් ස්වයං බලයෙන් කරන්නෙකු ලෙසට සිටී. නමුදු, දෙවන අවස්ථාවෙහි ඔහු ස්වයං බලයෙන් හෝ ස්වෙච්ඡාවෙන් නොකරන්නා ලෙස සිටින්නේය.

## කද්රියියා පිරිසට ආගම හා බුද්ධියේ පිළිතුරු

### ආගම

සැබැවින්ම, සෑම දෙයක්ම නිර්මානය කළේ අල්ලාහ්ය. ඔහුගේ නිගමනය පරිදි සෑම දේ සිදුවමින් පවතී. මිනිසුන්ගේ සෑම ක්‍රියාවන්ම ඔහුගේ නිගමනය මත පවතින බවට අල්ලාහ් අල්කුර්ආනයෙහි පැහැදිළිකර ඇත. ඔහු මෙලෙස පවසන්නේය.

*අල්ලාහ් සිතුවෙනම් ඔවු (දූතවරු)න්ගෙන් පසු පැමිණි අය, පැහැදිළි සාධකයන් ඔවුන් වෙත පහළ වූවායින් පසුද ඔවුනොවුන් අතර ඇණකොට මරා නොගනිති. නමුදු ඔවුහු තමන් අතරින් බෙදීමට ලක්වූහ. ඔවුන්ගෙන් පිරිසක් විශ්වාස කළහ. පිරිසක් ප්‍රතික්ෂේප කළහ. අල්ලාහ් සිතුවෙනම් ඔවුන් ඔවුනොවුන් අතර ඇණකොට මරා නොගනිති. නමුදු, අල්ලාහ් කැමතිවන දේ ඉටු කරයි. (අල්කුර්ආන්-2:253)*

*අපි සිතුවෙනම් සෑම ආත්මයකුටම (ආරම්භයේම) ඔවුන්ගේ යහමඟ ලබා දී ඇත්තෙමු. 'නමුත්, ජින් හා මිනිසුන් සියල්ලන්ගෙන් මා අපාය පුරවන්නෙමි' යනුවෙන් මා ලබා දුන් පොරොන්දුව ඉටුවිය. (අල්කුර්ආන්-32:13)*

### බුද්ධිය

මෙම විශාල විශ්වයම අල්ලාහ්ට හිමි එකක්වන අතර,

මිනිසාද මෙම විශ්වයෙහි අංගයකි. එනම්, ඔහුද අල්ලාහ්ට හිමි සම්පතකි. එසේනම්, වහලෙකුට ඔහුගේ හාම්පුතාගේ සම්පතෙහි ඔහුගේ අවසරය හා කැමැත්තෙන් තොරව එකී බලය පවත්වාගෙන යාමට නොහැක.

# ඉස්ලාමීය ප්‍රතිපත්තියෙහි අරමුණු

ඉස්ලාමීය ප්‍රතිපත්තිය අනුගමනය කිරීමෙන් ඇති වන උසස් ප්‍රතිඵලයෙහි පැහැදිලි අරමුණු අධික ලෙස හා විවිධ වර්ගයෙන් පවතී. ඒවායින් සමහරක් පහත දැක්වේ.

1-පිරිසිදු චේතනාව හා නැමදුම අල්ලාහ්ට පමණක් හිමි කිරීම. මන්ද යත්, නිසැකයෙන්ම, අල්ලාහ් කිසියම් ආදේශ කරුවෙක් නොමැති එකම නිර්මාතෘ වරයෙකි. එහෙයින්, චේතනාවන් හා නැමදුම ඉටුකිරීම අල්ලාහ්ට පමණක් විය යුතුය.

2-සිත්සතනෙහි මෙම ප්‍රතිපත්තිය නොමැතිවීමෙන් ඇති වන කලබලවලින් බුද්ධිය හා ඥානය නිදහස්වීම. මක්නිසාදයත්, කවරෙකුගේ සිත් සතන මෙම ප්‍රතිපත්තිය පිළි නොගන්නේද, ඔහු ස්ථාවර දෙකකට පත්වේ. එකක්, ඔහු සිත්සතනින් කිසිදු ප්‍රතිපත්තියක් පිළි නොගන්නෙකු හා හැඟීම්වලට අනුකූලව පමණක් නැමදුමෙහි යෙදෙන්නෙකු ලෙස සිටී. එසේ නොවන්නේනම්, ඔහු මිත්‍යා ප්‍රතිපත්තිවල හා මිත්‍යාදෘෂ්ටි ක්‍රියාවල පැටලී සිටී.

3-සිත්සතන සහ සිතුවිල්ල සැනසුම් වීම. මෙලෙස සැනසුම් වීමෙන් මිනිසාගේ සිත් සතන කැළඹීමට හෝ ඔහුගේ

සිතුවිල්ල කලබලයට හෝ නොපත්වේ. මන්දයත්, මෙම ප්‍රති පත්තිය, එය කෙරෙහි ස්ථිර විශ්වාසයෙන් සිටින මිනිසාව ඔහුගේ නිර්මාතෘවරයා (අල්ලාහ්) කරා සම්බන්ධ කරවයි.

පසු, ඔහු අල්ලාහ්ව තමා මවා පාලනය කරන දෙවියෙකු ලෙසද, නීතිරීතීන් සම්පාදනය කරන අධිපතියා ලෙසද පිළි ගනී. එම දෙවියාගෙන් නියමයවූ දෛවය කෙරෙහි ඔහුගේ සිත්සතන සැනසීමට පත්වේ. ඔහුගේ හදවත ඉස්ලාම් ගැන සැහීමට පත්වන අතර, ඉස්ලාම් හැර කිසිදු ආගමක් හෝ ඔහු අපේක්ෂා නොකරයි.

4–අල්ලාහ්ට කීකරුවී නැමදුම ඉටු කිරීමේ හෝ අනිකුත් මැවීම් හා සමග හැසිරීමේ හෝ නොමග යාමෙන් සිතුවිල්ල හා ක්‍රියාවන් ආරක්ෂාවීම. මක්නිසාදයත්, මෙම ප්‍රතිපත්ති යෙහි මූලිකයන් අතර රසූල්වරුන් කෙරෙහි විශ්වාස කිරීමද එකකි. එම විශ්වාසය එතුමාගේ ඍජු මාර්ගය අනුගමනය කර සිය ජීවිතය ගතකිරීමද අන්තර්ගතව පවතී. මෙය සිතු විල්ලේ හා ක්‍රියාවේ ආරක්ෂාව ලබා දෙන්නේය.

5–සියළුම කාර්යයන් කෙරෙහිද නිශ්චය භාවයෙන් හා ස්ථිර අධිෂ්ඨානයෙන් සිටීම. එනම්, (අල්ලාහ්ගේ) ප්‍රසාදය අපේක්ෂා කොට කුසල් ක්‍රියාවන්හි යෙදීමට ලැබෙන කිසිදු අවස්ථාවක් හෝ අතපසු නොකර ඒවා ප්‍රයෝජනවත් කිරීම. එසේම, පාපයන් සිදුවන ස්ථානයක් දකින කළ දඬුවමට බියවී එවන් ස්ථානයෙන් ඉවත්වීම. මන්දයත්, මෙම ප්‍රතිපත් තියෙහි මූලිකයන් අතර පරලොව දිනය කෙරෙහි හා එහි පිරිනමනු ලබන ප්‍රසාදයන් හා දඬුවම කෙරෙහි විශ්වාස කිරීමද එකකි. අල්ලාහ් මෙසේ පවසන්නේය.

*සෑම දෙනාටම ඔවුනොවුන්ගේ ක්‍රියාවන් අනුව නොයෙකුත් තරාතිරම් හිමිවේ. ඔබ දෙවියා ඔවුන් කරන ක්‍රියාවන් කෙරෙහි නොසැළකිලිමත්ව නොසිටී. (අල්කුර්ආන්-6:132)*

නබිනායක මුහම්මදු (සල්) තුමා මෙම අරමුණ කෙරෙහි උනන්දුව දක්වමින් මෙසේ පවසන්නේය.

ශක්තිමත් විශ්වාස වන්තයා අසරණ විශ්වාස වන්තයාට වඩා අල්ලාහ් වෙත ශ්‍රේෂ්ඨ හා ප්‍රිය වන්තයාය. සෑම දෙනා වෙත යහකම ඇත්තේය. ඔබට ප්‍රයෝජනය ගෙනදෙන දේ ගැන උනන්දු වන්න. අල්ලාහ්ගෙන් ඊංකවරණය පතන්න. නොහැකි භාවයෙන් නොසිටින්න. කිසියම් පීඩාවක් හෝ ඔබට සිදුවූ විට 'මම මෙසේ කළේනම්, මෙසේ නොපවතී' බවට නොපවසන්න. වෙනුවට 'මෙය අල්ලාහ්ගේ පැවැත්ම හා ඔහුගේ මනාපය අනුව සිදුවූ' බව පවසන්න. මක්නිසා දයත්, 'මෙසේ කළේනම්' යනු කොන්දේසි සහිත වචන සාතාන්ගේ ක්‍රියාවන්හි දොරටු විවෘත කරයි. (මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)

6-තම ආගම තහවුරු කිරීමෙහි හා එහි පදනම වඩාත් ශක්තිමත් කිරීමෙහි එකී මාර්ගයෙහි මුහුණ දෙන කවර පීඩාවක් හෝ නොසළකා තම මුළු හැකියාවද යොදවා ශක්තිමත් සමාජයක් ස්ථාපනය කිරීම. අල්ලාහ් මේ පිළිබඳව මෙසේ පවසන්නේය.

*සැබැවින්ම, (සත්‍ය) විශ්වාස වන්තයින් කවරෙකු නම්, ඔවුන් අල්ලාහ් ගැනද ඔහුගේ රසූල්වරයා ගැනද විශ්වාස කළ, පසු ඔවුන් (ඒ ගැන) කිසියම් සැකයක් නොකොට, අල්ලාහ්ගේ මාර්ගයෙහි තම ධනයෙන් හා තම ප්‍රාණයෙන්*

*කැප කරති. සැබෑ වන්තයින් හෙතම ඔවුන්මයමවි. (අල් කුර්ආන්-49:15)*

7-තනි පුද්ගලයන් හා සමාජයන් ශීලාචාර කිරීම මගින් මෙලොවෙහි හා පරලොවෙහි භාග්‍යය, කුලිය හා ගෞරවය ලැබීම. මේ පිළිබඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

*පිරිමියෙකු හෝ ස්ත්‍රීයෙකු හෝ කවරෙකු විශ්වාස වන්තයා ලෙසට සිට, කුසල් ක්‍රියාවන්හ යෙදෙන්නේද, ඔහුහට (මෙලොවෙහි) යහපත් ජීවිතයක් ගත කරන්නට සලස්වන්නෙමු. එසේම, අපි (පරලොවෙහි) එවන්නන්ට ඔවුන්ගේ (කුසල්) ක්‍රියාවන්හි ප්‍රමාණය අනුව ප්‍රසාධයන් ලබා දෙන්නෙමු. (අල්කුර්ආන්-16:97)*

ඉහත සඳහන් කර ඇත්තේ ඉස්ලාමීය ප්‍රතිපත්තියෙහි අරමුණු කීපයක් පමණි.

මෙම ප්‍රතිපත්තිය පිළිගෙන එය සිය ජීවිතයෙහි අනුගමනය කිරීමේ භාග්‍යය සර්ව බලධාරි අල්ලාහ් අප සියළුම දෙනාට ලබා දෙනු මැනවි.

نرجو الله تعالى أن يحققها لنا ولجميع المسلمين.

والحمد لله رب العالمين.

طبعت بمطابع دار طيبة ـ الرياض السويدي
شارع عبدالملك بن هشام ـ ت: ٤٢٨٣٨٤٠

## من أهداف المكتب

١ ـ تعريف غيــــر المسلمين بدين الإسلام، ودعوتهم إليه، وترغيبهم فيه، مشافهة، ومراسلة واستماعا .

٢ ـ تصحيح عقائد المسلمين، وتنقيتها من الشرك وشوائبه .

٣ ـ نشر العلم الشرعي بين الجاليات المسلمة .

٤ ـ توعية المسلمين ، وتوجيههم، وإرشادهم إلى ما يصلح الحال ويسعد المآل .

٥ ـ الدعوة إلى ترك البدع والخرافات الموجودة عند بعض المسلمين .

مطبعة دار طيبة ـ الرياض ـ ت: ٤٢٨٣٨٤٠